# අනාගත ආණ්ඩුවක ප්‍රමුඛතා න්‍යාය පත්‍රය
# ඒකගතාව සඳහා යෝජනාවලිය

## පූර්විකාව

අප රටේ දේශපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ ජාතික මතවාදීන් අතර සංවාදය ආරම්භ වන්නේ 1946 දී, එනම් නිදහසටත් පෙර කාලයේ දී විද්‍යාලංකාර ප්‍රකාශය නම් වූ ලියවිල්ල මගිනි. ඉන් පසු ව ඒ මත පදනම් 1956 මැතිවරණයට දස පනත නමින් ව්‍යවස්ථා රාමුවක් ඉදිරිපත් කිරීම මගින් මහා සංඝරත්නය ප්‍රමුඛ ජාතික බලවේග දේශපාලන සහ සමාජ - ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා මග පෙන්වනු ලැබී ය. එම ප්‍රතිසංස්කරණ වැළැක්වීම සඳහා ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව මැදිහත් වූ ආකාරය මේ වන විට එළිදරව් වී ඇත. ඒ ආකාරයට රාජ්‍ය පාලනය මත ජාතික බලවේග විසින් ඇති කරනු ලැබූ බලපෑම නිසා සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ලැබුණු සීමිත දේශපාලන සහ ආර්ථික නිදහස සාධනීය ලෙස යොදාගනිමින් ජාතික රාජ්‍යයක් ගොඩනැගීමේ ක්‍රියාවලිය ඉදිරියට ගමන් කරනු ලැබී ය. ඉන්පසු 1972 ව්‍යවස්ථාව මගින් ජනරජයක් ලෙස වඩා දියුණු ප්‍රතිසංස්කරණ සඳහා මග පෑදුණි. ඉඩම් ප්‍රතිසංස්කරණ ඒ අතුරින් ප්‍රධාන වේ.

ඉන්පසු 1977 වන විට ජාතික සහ වාමවාදී බලවේගවල බිඳවැටීම තුළ 1978 දී රාජ්‍ය පාලනය අත්තනෝමතික ලෙස ඒකාධිපතිකරණය කිරීම සහ සමස්ත ආර්ථිකය ගෝලීය වෙළඳපොළ මත පරාධීනත්වයට නතු කිරීම සඳහා වන ව්‍යවස්ථාවක් හඳුන්වාදීමට හැකි විය. විවෘත ආර්ථිකය සහ වෙළඳාම දියුණු කිරීමේ නාමයෙන් රටේ සම්පත් විදේශිකයන්ට කොල්ලකෑම සඳහා ඉඩ සැලසුණි. රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් ම පරාධීනත්වයට නතු වූ අතර ''බල්ලෝ මරා හෝ සල්ලි සොයන'' සමාජ මනෝභාවයක් තුළ බරපතල සමාජ - සංස්කෘතික පිරිහීම ආරම්භ විය. එසේ ම රාජ්‍ය පාලන ව්‍යුහය තුළ සිදු වූ වෙනස්කම් තුළින් දිරිමත් වූ නව දේශපාලන සංස්කෘතිය තුළ දූෂණ වංචා සාමාන්‍යකරණය විය.

එම රාජ්‍ය පාලන ව්‍යුහය, ඒ තුළ පෝෂණය වූ දේශපාලන සංස්කෘතිය සහ පරාධීන ආර්ථික මොඩලය විසින් රට මහා දේශපාලන සහ සමාජ - ආර්ථික අර්බුදයක් දක්වා රැගෙන ගිය බව දැන් ඉතා පැහැදිලි ය. ඒ අනුව දැන් එම අර්බුදය ම අවස්ථාවක් සහ ආශිර්වාදයක් බවට පත් කරගනිමින් නව වටයකින් ප්‍රගතිශීලී සහ සාධනීය දේශපාලන සහ සමාජ - ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට රට යොමු කිරීමේ හැකියාව ලැබී ඇත. ඒ සඳහා වන මූලික පූර්ව කොන්දේසිය වන්නේ පවතින පරාධීන ආර්ථික මොඩලය සහ රාජ්‍ය පාලන ව්‍යුහය ගැඹුරින් වෙනස් කළ හැකි නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම බව ජාතික බලවේග අතර පොදු පිළිගැනීම වේ. එම පිළිගැනීම මත පදනම් ව අප විසින් ජාතික න්‍යාය පත්‍රයක මත ජාතිය පෙළගැස්සවීමේ උවමනාව රටට ඉදිරිපත් කරනු ලැබී ය.

**(මෙම ක්‍රියාවලියට මග පෙන්වීම සඳහා ජාතික විද්වද් භික්ෂු සංසදය විසින් ඉදිරිපත් කරනු ලැබූ ලේඛනය ඇමුණුම 1 ලෙස දක්වා ඇත)**

ඒ අනුව ගෝලීය ශ්‍රී ලාංකික සංසදය සහ ජාතික සංවිධාන එකමුතුව ප්‍රමුඛ සංවිධාන 65ක එකගතාව මත ජාතික න්‍යාය පත්‍රයක මූලාරම්භය ලෙස එළිදැක්වුණු සමාජ සම්මුතිය සහ එහි දෙවැනි පියවර ලෙස සියලු ම දේශපාලන පක්ෂවලට සහ පොදු මහජනතාවට ඉදිරිපත් කළ ප්‍රශ්න මාලාව මත පදනම් ව ඊට පිළිතුරු ලෙස අනාගත ආණ්ඩුවක න්‍යාය පත්‍රය තුළ ප්‍රමුඛතාව ලබාදිය යුතු උපාය මාර්ගික අරමුණු සහ එම අරමුණු ඉටු කරගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මෙසේ සමාජ සම්මුතියක් ලෙස ඉදිරිපත් කරන වග යි.

එසේ ම අනාගත ආණ්ඩුවක ප්‍රමුඛතා න්‍යායපත්‍රය සකස් කිරීමේ දී සමාජයේ විවිධ ස්තර සහ කණ්ඩායම් නියෝජනය කරන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා සහ යෝජනා මෙන් ම ඊට පෙර ජාතික බලවේග විසින් රටට ඉදිරිපත් කළ පහත සඳහන් මහජන කොමිසම් වාර්තා සහ දේශීය කර්මාන්තකරුවන් නියෝජනය කරමින් මව්බිම ලංකා පදනම විසින් ඉදිරිපත් කළ යෝජනා සියල්ල ඉතා බරපතල ලෙස සැලකිල්ලට ගනු ලැබූ බව ද දන්වා සිටින වග යි.

1. ජාතික මහජන සභාව විසින් ඉදිරිපත් කළ හැට එක් වැදෑරුම් සමාජ ගිවිසුම (2022)
2. ජාතික විද්වද් භික්ෂු සංසදය විසින් පිහිටුවන ලද මහජන කොමිසමේ වාර්තාව (සම්මුතියේ මාළිමාව) මගින් ඉදිරිපත් කළ යෝජනා (2019)
3. බෞද්ධ පුනර්ජීවන කොමිසමේ වාර්තාව (2013)
4. ජාතික පුනර්ජීවන කොමිෂන් සභාවේ වාර්තාව (2009 - 2010)
5. මව්බිම ලංකා පදනම විසින් යුද ජයග්‍රහණයට පසු ව ඉදිරිපත් කළ ආර්ථික වැඩ පිළිවෙළ (2009)

# අනාගත ආණ්ඩුවක ප්‍රමුඛතා න්‍යායපත්‍රය: 60 වැදෑරුම් සමාජ සම්මුතිය

## අර්බුදයෙන් එළියට...

1. **දේශපාලන සහ ආර්ථික අර්බුදය සමනය කිරීම, අර්බුදයෙන් දීර්ඝකාලීන ව ගොඩ ඒම සඳහා මූලික පදනම දැමීම සහ අර්බුදය මුවාවෙන් සිදු කරන අගතිගාමී ක්‍රියා ආපසු හැරවීම මෙන් ම ඊට අදාළ ව මහජන විශ්වාසය දිනාගැනීම:**

1.1) 2017 විදේශ විනිමය පනත සහ 2023 මහ බැංකු පනත අහෝසි කිරීම සහ ඊට පෙර ක්‍රියාත්මක වූ පනත් වර්තමාන අවශ්‍යතාවන්ට අනුව සංශෝධනය කර සම්මත කිරීම මගින් විදේශ විනිමය කළු වෙළඳපළ මැඩ පැවැත්වීම සහ මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම, විශේෂයෙන් ම ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ තොරතුරු පද්ධතිය කාර්යක්ෂම කිරීම. ඊට අමතර ව ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරිත්වය විශේෂයෙන් ම විදේශීය මූල්‍යාධාර ලබාගැනීම සහ මූල්‍ය පාලනය ද ඇතුළත් වන ආකාරයට නියාමනය කිරීම සඳහා පවතින නීතිය සංශෝධනය කිරීම සහ ශක්තිමත් කිරීම.

1.2) රාජ්‍ය ණය කළමනාකරණ පනත, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සහ ආර්ථික පරිවර්තන පනත යන පනත් ත්‍රිත්වය මගින් විදේශ ආයෝජන නාමයෙන් රටේ ආර්ථික කළමනාකරණය අත්තනෝමතික ලෙස ඒකාධිපතිකරණය කිරීම වැළැක්වීම සඳහා එම පනත් අහෝසි කිරීම මගින් පාර්ලිමේන්තුවේ මූල්‍ය බලය ශක්තිමත් කිරීම. එසේ ම තෝරාගත් ක්ෂේත්‍රවල පමණක් විදේශ ආයෝජන දිරිගැන්වීම සඳහා දේශීය නිෂ්පාදකයා ආරක්ෂා වන ආකාරයට ආයෝජන මණ්ඩල පනත යටතේ දිරිගැන්වීම් පැකේජයක් හඳුන්වාදීම.

1.3) මේ වන විට වංචා කර ඇති සහ ගෙවීම් පැහැර හැර ඇති රුපියල් බිලියන 3000කට ආසන්න ආදායම් බදු, රේගු බදු සහ සුරා බදු නැවත අය කරගැනීම සහ රාජ්‍ය බැංකුවලට නොගෙවා ඇති රුපියල් බිලියන 650කට අධික මහා පරිමාණ ණය අය කරගැනීම සඳහා අන්තර් අමාත්‍යාංශ කාර්ය සාධක බලඇණියක් පත් කිරීම සහ එහි නිර්දේශ අනුව අවශ්‍ය වේ නම් ඒ සඳහා නව විශේෂ විධිවිධාන නීතියක් සම්මත කිරීම. එසේ ම ඒ මගින් මහජනයා මත පටවා ඇති අසාධාරණ බදුබර අඩු කිරීම සහ දේශීය නිෂ්පාදන පද්ධතිය මත ඇති වන නිශේධාත්මක බලපෑම සමනය කිරීම. ඊට අමතර ව අනාගතයේ දී අදාළ සියලු ම බදු වර්ග වංචා කිරීම් සහ ගෙවීම් පැහැරහැරීම් වැළැක්වීම සඳහා අය කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, ආවේක්ෂණය කිරීම සහ මහජන පැමිණිලි විභාග කිරීම සඳහා ප්‍රතිපාදන සහිත ව රාජ්‍ය ආදායම් කොමිසමක් පිහිටුවීම මුල් කරගෙන නව නීතියක් හඳුන්වා දීම.

1.4) රාජ්‍ය ආයතන විකිණීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ම අත්හිටුවීම සහ පාඩු ලබන රාජ්‍ය ආයතන සහ ව්‍යවසායකත්වය දිරිගැන්විය යුතු ආයතන කළමනාකරණය කිරීම සඳහා සිංගප්පූරුවේ ''තමාසෙක්'' මොඩලය ආදර්ශයට ගනිමින් රාජ්‍ය සහ පුද්ගලික ප්‍රාග්ධනය සහිත ඒකාබද්ධ පරිපාලන සමාගමක් සහ අරමුදලක් පිහිටුවීම සහ ඒ සඳහා දේශීය සහ විදේශීය ශ්‍රී ලාංකිකයන්ගෙන් ආයෝජන ලබාගැනීම.

1.5) 2024 විදුලි පනත අහෝසි කිරීම මගින් විදුලි පද්ධතිය පුද්ගලිකකරණය කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීම සහ ඊට පෙර පැවති පනත තරගකාරී ප්‍රසම්පාදනය සහ මහා පරිමාණ ජාතික ව්‍යාපෘතිවල රාජ්‍ය ආයෝජන ප්‍රතිශතය අනිවාර්යය කිරීම සඳහා වන ප්‍රතිපාදන සහිත ව නැවත සම්මත කිරීම. එමෙන් ම ඩීසල් මාපියාව විසින් සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘති අධෛර්යමත් කිරීමේ ක්‍රියාවලිය වැළැක්වීම සඳහා අභියාචනා ක්‍රියාවලියක් සහ විදුලි පද්ධතිය තාක්ෂණික ව යාවත්කාලීන කිරීම සඳහා අරමුදලක් පිහිටුවීම මුල් කරගෙන සුනිත්‍ය බල ව්‍යාපෘති සඳහා රාජ්‍ය භාගයක් නියම කිරීමට අදාළ ව ප්‍රතිපාදන සහ සමස්ත සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ බලතල සහිත ව සුනිත්‍ය බලාධිකාරී පනත සංශෝධනය කිරීම.

1.6) සමාජය මතවාදී ව සහ සංස්කෘතික වශයෙන් බිඳවැට්ටවීමේ ක්‍රියාවලියට අදාළ ව ඉදිරිපත් කර ඇති සමලිංගිකත්වය සහ ලිංගිකත්වය වෙනස් කිරීම දිරිගැන්වෙන දැනට සම්මත කර ඇති පනත අහෝසි කිරීම සහ ඊට අදාළ සෙසු පනත් කෙටුම්පත් 3 අහෝසි කිරීම. එසේ ම කංසා වැවීම සහ ගණිකා වෘත්තිය පුරුදු කිරීම සහ ප්‍රචලිත කිරීම සඳහා ප්‍රතිපාදන සහිත ව සම්මත කළ ආයුර්වේද පනත නැවත සංශෝධනය කර එම ප්‍රතිපාදන ඉවත් කිරීම. ඊට අමතර ව සමාජ සංස්ථා විශේෂයෙන් ම සංඝ සමාජය සහ පවුල බිඳවැට්ටවීමේ යටි අරමුණු සහිත ව ඉදිරිපත් කෙරෙන ථෙරවාදී කතිකාවත් පනත් කෙටුම්පත, සංඝාධිකරණ පනත් කෙටුම්පත සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව වැළැක්වීමේ සංශෝධන පනත් කෙටුම්පත අහෝසි කිරීම. ඒ වෙනුවට භික්ෂු වේශධාරීන් සාසනයෙන් නෙරපා හැරීමට අදාළ ව ප්‍රතිපාදන ඇතුළු කිරීම සඳහා විහාර දේවාලගම් පනත සංශෝධනය කිරීම.

1.7) ගෙවුම් ශේෂ අර්බුදයට කෙටිකාලීන සහ දීර්ඝ කාලීන විසඳුමක් ලෙස විදේශ රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කෙටිකාලීන ව වර්ධනය කරගැනීම සඳහා තීරු බදු සහන සහ විශේෂ වරප්‍රසාද සහිත දිරිගැන්වීමේ පැකේජයක් හඳුන්වාදීම සහ දීර්ඝ කාලීනව නුපුහුණු ශ්‍රමිකයන් වෙනුවට පුහුණු ශ්‍රමිකයන් සඳහා විදේශ රැකියා අවස්ථා ලබාගැනීම සඳහා රාජ්‍ය තාක්ෂණික පුහුණු ආයතන පද්ධතිය පුද්ගලික පුහුණු ආයතන සහ ආරක්ෂක හමුදා සතු සම්පත් මෙන් ම ජාතික පාසල් පද්ධතිය යොදාගනිමින් සමස්ත රට ම වෘත්තීය පුහුණු කඳවුරක් බවට පත් කිරීම. එම ක්‍රියාවලිය තුළ පුහුණුව සහිත එහෙත් සහතික නොමැති පිරිස්, ත්‍රී රෝද රථ රියදුරන්, අර්ධ රැකියා නියුක්තිකයන් සහ විශ්වවිද්‍යාලය අවස්ථා නොලබන පාසැල් හැර යන සිසුන් දිරිමත් කිරීම සඳහා දීමනාවක් හඳුන්වා දීම. එසේ ම පුහුණුව සහිත රාජ්‍ය සේවකයන් සහ ආරක්ෂක හමුදා සාමාජිකයන්ට විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීම.

1.8) ආරක්ෂක හමුදා දුර්වල කිරීමේ සහ දුර්මුඛ කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීම. ඒ අනුව සත්‍ය සෙවීමේ කොමිසම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීම මෙන් ම ඊට පෙර රණවිරුවන් දඩයම් කිරීම සඳහා සම්මත කළ පනත් 7ක් නැවත සමාලෝචනය කිරීම සහ අතුරුදහන් වූවන් පිළිබඳ සොයා බැලීම සඳහා ක්‍රියාත්මක කළ ජනාධිපති කොමිසම නැවත බල ගැන්වීම. එසේ ම ආරක්ෂක හමුදා දුර්වල කිරීම සහ දුර්මුඛ කිරීම මුල් කරගෙන පිරිස් බලය අඩු කිරීම සහ හමුදාව අතහැරයාම දිරිගැන්වීමේ ක්‍රියාවලිය අත්හිටුවීම මෙන් ම දිවිපිදූ රණවිරුවන්ගෙන් යැපෙන්නන්ට සහ ආබාධිත රණවිරු පවුල්වලට ලැබිය යුතු එහෙත් මේ වන විට කපා දමා ඇති වරප්‍රසාද සියල්ල නැවත ලබා දීම.

1.9) බෙදුම්වාදීන් සතුටු කිරීම සඳහා මධ්‍යම රජයේ බලතල දුර්වල කිරීමට අදාළ ව ගෙන යනු ලබන සියලු ම ක්‍රියාමාර්ග අත්හිටුවීම. විශේෂයෙන් ම පුරාවිද්‍යා රක්ෂිත ගැසට් කිරීම වැළැක්වීම සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට බාධා කිරීම, ව්‍යාජ සංවර්ධන කටයුතු නාමයෙන් වන සංරක්ෂණ ඉඩම් නිදහස් කිරීම මහවැලි පනත අහෝසි කර එම ඉඩම් ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම, විශ්වවිද්‍යාලය අනුමත කිරීමේ බලය පළාත්වලට පැවරීම යන ක්‍රියාමාර්ග අත්හිටුවීම.

1.10) ණය පීඩනය සමනය කරගැනීම සඳහා විශාලතම ණය තොගය වන ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ඇතුළත් ඩොලර් බිලියන 14කට අධික වාණිජ ණය තොගය මිල දී ගන්නා ලෙස සහ දීර්ඝ සහන කාලයක් ලබාදෙන ලෙස ඉන්දියාව, චීනය, රුසියාව, ජපානය, සහ ඇමෙරිකාව යන රටවලින් ඉල්ලා සිටීම සහ උපරි ම සහන ලබාදෙන පාර්ශ්වය සමග එකඟතාව ඇති කරගැනීම. එසේ ම BRICS බැංකු පද්ධතියට ඇතුළුවීම මගින් නව ආයෝජන ණය සඳහා අවස්ථාව ලබාගැනීම.

1.11) පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට සැබෑ ලෙස ම සාධාරණය ඉටු කිරීම සඳහා හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් 2021 පෙබරවාරි මාසයේ දී ඉදිරිපත් කළ ජාතික ආරක්ෂාව පිළිබඳ අංශීක කාරක සභාවේ නිර්දේශ 57ක් ක්‍රියාත්මක කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර් අමාත්‍යාංශ කාර්ය සාධක බලඇණියක් පත් කිරීම සහ පාස්කු ප්‍රහාරයට අදාළ ව සිදුකර ඇති සියලු ම පරීක්ෂණ සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවක් කාදිනල්තුමාගේ ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් පත් කිරීම

1.12) මත්ද්‍රව්‍ය ව්‍යසනය පාලනය කිරීම සඳහා යුක්තිය මෙහෙයුමට සමගාමී ව සහ එය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මත්ද්‍රව්‍ය පාලනය සහ පුනරුත්ථාපනය සඳහා පවතින නීතිමය රාමු සහ ආයතන පද්ධතිය සම්බන්ධීකරණය කිරීම, මත්ද්‍රව්‍ය නඩු විභාග සඳහා විශේෂිත අධිකරණයක් පිහිටුවීම, මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ වැරදිකරුවන් සඳහා විශේෂිත බන්ධනාගාරයක් පිහිටුවීම සහ වැටලීම් සඳහා ඒකාබද්ධ මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා අග්‍ර ආයතනයක් හෙවත් කොමිෂන් සභාවක් සහ ජාතික උපදේශක මණ්ඩලයක් පිහිටුවීම සඳහා ප්‍රතිපාදන සලසන නව නීතිමය රාමුවක් හඳුන්වාදීම. මෙ ක්‍රියාවලියට අදාළ ව ආරක්ෂක හමුදා නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් සහ විද්වතුන්ගේ සහභාගිත්වයෙන් මත්ද්‍රව්‍ය මැඩලීමට අදාළ ව පිහිටුවන ලද පාර්ලිමේන්තු අංශික කාරක සභාවේ නිර්දේශ වහා ම ක්‍රියාත්මක කිරීම.

## නව ආර්ථික මොඩලයක් සමෘද්ධිමත් දේශයක්...

2. **දේශීය නිෂ්පාදන පද්ධතිය ආරක්ෂා කිරීම, ගොවියා සහ ව්‍යවසායකයා ශක්තිමත් කිරීම සහ රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.**

2.1) සියලු ම රාජ්‍ය මිල දී ගැනීම්වල දී දේශීය භාණ්ඩ සහ සේවා මිල දී ගැනීම සඳහා දැනට ලබා දී ඇති නාමික ප්‍රමුඛතාව (15% සහ 20% ලෙස) අනිවාර්ය කිරීම සහ සහ 'අපේ දේ හෙවත් ශ්‍රී ලාංකික නිෂ්පාදන මිල දී ගැනීම සඳහා මහජනතාව පෙළඹවීම මුල් කරගෙන රාජ්‍ය නොවන සංවිධාන සහ ජනමාධ්‍ය දිරිගැන්වීම සඳහා රාජ්‍ය අරමුදල් වෙන් කිරීම මෙන් ම පාසල් හා රාජ්‍ය ආයතන ආශ්‍රිත ව දේශීය ආහාර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා එම ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුව මගින් සම්මත කිරීම සහ ඊට අදාළ ව පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම.

2.2) මිල විකෘතිය මගින් දේශීය කාර්මික නිෂ්පාදනවල තරගකාරීත්වය බිඳ දැමීම වැළැක්වීම සඳහා උපායමාර්ගික කර්මාන්ත ආරක්ෂා කිරීමේ පනතක් මගින් දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම මුල් කරගෙන නව ආනයන බදු ප්‍රතිපත්තියක් මෙන් ම විනිවිද භාවය සහිත ව ක්‍රියාත්මක කරන යාන්ත්‍රණයක් සහ අභියාචනා විභාග කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

2.3) මිල විකෘතින් මගින් ආනයනික නිෂ්පාදන දිරිගැන්වීම හරහා දේශීය කෘෂි නිෂ්පාදනවල තරගකාරීත්වය බිඳ දැමීමේ ක්‍රියාවලිය පාලනය කිරීම සහ අතරමැදියන් විසින් ගොවියාගේ කේවල් කිරීමේ බලය බිඳ දැමීම සඳහා නිර්මාණය කර තිබෙන වෙළඳපළ ව්‍යුහයන් වෙනස් කිරීම, විශේෂයෙන් ම ගොවි සමිති සහ ගොවි සමුපකාරවලට කේවල් කිරීමේ බලය සහිත ආර්ථික මධ්‍යස්ථාන ජාලයක් දිරිමත් කිරීම සඳහා පියවර ගැනීම සහ දේශීය ආහාර ප්‍රචලිත කිරීම ආදි වශයෙන් වන රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම මෙන් ම ගොවියාගේ ජීවන තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා වන උපායමාර්ගික ක්‍රියාමාර්ග නීතිගත කිරීම සඳහා ආහාර සුරක්ෂිතා පනතක් හඳුන්වාදීම.

2.4) දේශීය කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන ආරක්ෂා කිරීම සඳහා ආහාර සුරක්ෂිත පනත සහ උපායමාර්ගික කර්මාන්ත ආරක්ෂා කිරීමේ පනත මගින් පනවනු ලබන ආනයන බදු 'දේශීය නිෂ්පාදන දිරිගැන්වීමේ අරමුදල' නමින් විශේෂිත අරමුදලකට බැර කිරීම සහ එම බදු ආදායම් දේශීය නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කිරීම, විශේෂයෙන් ම සුළු නිෂ්පාදකයන්ට සහන ලබාදීම සඳහා පමණක් විනිවිද භාවය සහිත ව වැය කිරීම මගින් බදු පැනවීම සඳහා මහජන සහාය ලබාගැනීම.

2.5) අත්‍යවශ්‍ය ආහාර නිෂ්පාදන සඳහා ගොවියාට ඉහළ මිල, තොග වෙළඳුන්ට සහ සකස් කරන්නන්ට පැවතිය හැකි මිල සහ පාරිභෝගිකයාට සාධාරණ මිල ලැබෙන ආකාරයට මිල සූත්‍ර හඳුන්වාදීම මගින් විනිවිද භාවය සහිත ව උපරි ම මිල නියම කිරීම, සමුපකාර සහ සතොස මගින් තොග වෙළඳපොළ තුළ කාර්යක්ෂමතාව පවත්වාගැනීම සහ ආරක්ෂණ තොග පවත්වාගැනීම මෙන් ම පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා ආහාර සුරක්ෂිතතා පනත මගින් නීතිමය ප්‍රතිපාදන පැනවීම සහ ඊට අදාළ ක්‍රියාකාරකම් සඳහා 'දේශීය නිෂ්පාදන දිරිගැන්වීමේ අරමුදල' මගින් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම.

2.6) අතිරික්ත නිෂ්පාදනය මගින් වෙළඳපොළ මිල පහත වැටීම නිසා නිෂ්පාදකයා අධෛර්යමත් වීම වැළැක්වීම සඳහා එළවළු, පලතුරු සහ මිරිදිය සහ කරදිය මත්ස්‍ය නිෂ්පාදන කල් තබාගැනීම මෙන් ම වටිනාකම් එකතු කිරීමට අදාළ කර්මාන්ත දිරිගැන්වීම සඳහා දේශීය නිෂ්පාදන ආරක්ෂා කිරීමේ අරමුදල මගින් සහන පොලියට ණය සහ සෙසු පහසුකම් ලබාදීම මගින් පුද්ගලික ව්‍යවසායකයන් සහ ගොවි සමුපකාර යොදාග නිමින් විශේෂ ව්‍යාපෘතියක් දියත් කිරීම.

2.7) ක්ෂුද්‍ර මූල්‍ය වහල් භාවයෙන් සුළු ව්‍යවසායකයා ගලවාගැනීම සඳහා ස්වේච්ඡා සංවිධාන සහ සමුපකාර මගින් ක්ෂුද්‍ර මූල්‍ය වෙළඳපොළ කාර්යක්ෂම කිරීම සඳහා අදාළ පනත සංශෝධනය කිරීම සහ සමෘද්ධි බැංකු පද්ධතියට එම කාර්යය සඳහා සහන පොලියට රාජ්‍ය බැංකු මගින් තොග ණය ලබාදීම මෙන් ම ගොවිජන බැංකුව ජාතික මට්ටමින් නැවත ක්‍රියාත්මක කිරීම. එසේ ම අදාළ පනත මගින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සඳහා පොලිය සහ ගාස්තු නියම කිරීම මගින් දැනට පවතින අසාධාරණ පොලී අනුපාත බැංකු පොලී අනුපාතවලට සාපේක්ෂ ව අවම අගයකට පහළ දැමීම.

2.8) දේශීය කෘෂිකාර්මික නිෂ්පාදන පද්ධතිය පරාදීනත්වයෙන් ගලවාගැනීම සඳහා පාරිසරික ගොවිතැන් ක්‍රම ප්‍රචලිත කිරීම දිරිගැන්වීම මුල් කරගෙන බෝග වගාව සහ කිරි ගොවිතැන ඒකාබද්ධ කිරීම දිරිගැන්වීම සඳහා පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යොදාගනිමින් ජාතික කිරි ගව අභිජනන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම මෙන් ම පශු සම්පත් ව්‍යාප්ති සේවය නැවත ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ජාතික අයවැය මගින් ප්‍රතිපාදන සැළසීම. එසේ ම කෘෂි පර්යේෂණ ආයතන සහ රජයට අයත් ගොවිපළ ජාලය යොදාගනිමින් මේ වන විට බිඳවට්ටවා ඇති දේශීය බීජ සහ රෝපණ ද්‍රව්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන වැඩසටහනට මෙන් ම බිදවට්ටවා ඇති කෘෂි ව්‍යාප්ති සේවයට නැවත පණ දීම සඳහා දේශීය නිෂ්පාදන දිරිගැන්වීමේ අරමුදල මගින් ප්‍රතිපාදන ලබාදීම. ඊට අමතර ව පළිබෝධනාශක පනත සංශෝධනය කිරීම මගින් අවම පළිබෝධනාශක ලැයිස්තුව නීතිගත කිරීම සහ ඒ මගින් දැනට 200කට අධික ප්‍රමාණයක් වන සක්‍රිය රසායනික ප්‍රමාණය 20 දක්වා අඩු කිරීම මගින් මහජන සෞඛ්‍ය සහ පාරිසරික පද්ධති ආරක්ෂා කිරීම මෙන් ම නිෂ්පාදන පිරිවැය අඩු කිරීම.

2.9) දේශීය අමුද්‍රව්‍ය භාවිත කිරීම, සැපයුම් දාමයට බහුතරයක් දායක වීම, අමුද්‍රව්‍ය හෝ අර්ධ නිමි භාණ්ඩ අපනයනය වෙනුවට වටිනාකම් එකතු කිරීම වර්ධනය කිරීම මගින් අපනයන ආදායම් වැඩි කිරීම ආදි නිර්ණායක මත පදනම් ව තෝරාගත් උපාය මාර්ගික වශයෙන් වැදගත් කර්මාන්ත සඳහා විශේෂ දිරිගැන්වීමේ පැකේජයක් හඳුන්වාදීම. එම ක්‍රියාවලිය තුළ නව කර්මාන්ත සංවර්ධන බැංකුවක් පිහිටුවීම සහ කර්මාන්ත සංවර්ධන පනත යටතේ පිහිටුවා ඇති කර්මාන්ත ක්ෂේත්‍රවලට අදාළ උපදේශක කමිටු බලාත්මක කිරීම මගින් ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා උපාය මාර්ගික කර්මාන්ත ආරක්ෂා කිරීමේ පනත මගින් ප්‍රතිපාදන සැලසීම.

2.10) දේශීය ව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීම මගින් දේශීය කර්මාන්තවලට වෙළඳපළ පුළුල් කරගැනීමට අවස්ථාව සලසීම සඳහා විනිවිද භාවය සහිත ව උපාය මාර්ගික කර්මාන්ත ආරක්ෂා කිරීමේ පනත යටතේ ලැයිස්තුගත කෙරෙන දේශීය නිෂ්පාදනවලට විකල්ප ලෙස ආනයනය කරනු ලබන නිෂ්පාදන සීමා කිරීම සඳහා බලපත්‍ර ලබාදීම මගින් කෝටා ක්‍රමයක් ඇති කිරීම, නිමි නිෂ්පාදන වෙනුවට අමුද්‍රව්‍ය ආනයනය කර දේශීය වටිනාකම් එකතු කිරීම දිරිමත් වන ආකාරයට ආනයන බදු පැනවීම, තත්ත්වය බාල කිරීම මගින් මිල අඩු කිරීම වැළැක්වීම ආදි ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිපාදන සැලසීම. ඊට අමතර ව පොල් සංවර්ධන මණ්ඩලය, පාරිභෝගික අධිකාරිය, ප්‍රමිති ආයතනය, ආනයන අපනයන පාලක ආදි නියාමන ආයතනවල ඇතම් පුද්ගලයන් විසින් බහුජාතික සමාගම් සහ ආනයනකරුවන්ට පක්ෂපාතී ව දේශීය නිෂ්පාදන බිඳ වැට්ටවීම මුල් කරගෙන ප්‍රමිතීන් වෙනස් කිරීම සහ විවිධ පරිපාලන තීන්දු ගැනීම වැළැක්වීම සඳහා උපායමාර්ගික කර්මාන්ත ආරක්ෂා කිරීමේ පනත යටතේ ආවේක්ෂණ සහ පැමිණිලි විභාග කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම.

2.11) මැද පෙරදිග ඛණිජ තෙල් ඒකාධිකාරියෙන් ගැලවීම සඳහා අවම මිලට බොර තෙල් සැපයීම යන කොන්දේසියට යටත් ව තරගකාරී මිලට බොර තෙල් අපනයනය කරන රුසියාව වැනි රටක් සමග සාකච්ඡා කර නව ඛනිජ තෙල් පිරිපහදුවක් ත්‍රිකුණාමලය ආශ්‍රිත ව පිහිටුවීම සඳහා විදේශ ආයෝජන දිරිගැන්වීම. එම ක්‍රියාවලිය තුළ චන්ද්‍රි ගෙවා ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ආපසු ලබාගැනීම සඳහා සාකච්ඡා කිරීම සහ පළමු වටයේ දී ශ්‍රී ලංකාවේ රජයට භාවිත කළ හැකි ටැංකි 84 යොදාගනිමින් මාස තුනක කාලයකට භාවිත කළ හැකි පරිදි ආරක්ෂිත තොගයක් පවත්වාගෙන යාම.

2.12) මගී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය යන සාධක 2 ම සැලකිල්ලට ගනිමින් පොදු ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කිරීම ඉදිරි වසර 5 ක කාලය තුළ ප්‍රධානතම යටිතල පහසුකම් සංවර්ධන ආයෝජන ව්‍යාපෘතිය ලෙස නම් කිරීම සහ ඒ යටතේ දුම්රිය පද්ධතිය විදුලිකරණය කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදීම. එසේ ම කොළඹ වරායේ බහලුම් අංගනය කුරුණෑගල, වේයන්ගොඩ සහ අවිස්සාවේල්ල දක්වා දිගු කිරීම හෙවත් එම දුම්රිය ස්ථාන ආශ්‍රිත ව බහාලුම් අංගන පහසුකම් ඇති කිරීම සහ එම අංගන දක්වා දුම්රිය මගින් බහලුම් සහ ඛණිජ තෙල් ප්‍රවාහනය කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## නව ව්‍යවස්ථාවක් - යුක්තිගරුක, සාධාරණ පාලනයක්...

3. **නිවහල් රටක්, යුක්තිගරුක සහ සාධාරණ පාලනයක්, පරිසර හිතවාදී සමෘද්ධිමත් සහ ස්වාධීන ආර්ථිකයක්, සතුටු පිරුණු, සාමකාමී සමාජයක් බිහි කිරීම:**

3.1) නව ව්‍යවස්ථාවක් මගින් පළාත් පාලන ආයතන මට්ටමට අදාළ නීතිය මගින් උපරි ම වශයෙන් බලය විමධ්‍යගත කිරීම සහ ජනසභා පිහිටුවීම මගින් මහජනයාට රාජ්‍ය පාලනයට දායක වීම සඳහා මෙන් ම තම නියෝජිතයාට ලබාදුන් බලය ආපසු කැඳවීමේ අයිතිය මහජනයාට ලබාදීම. එමෙන් ම පළාත් මට්ටමින් මහජන සේවා සහ සංවර්ධන කටයුතු විධිමත් ව සම්බන්ධීකරණය කිරීම සඳහා පළාත් පාලන ආයතවල නියෝජිත ඡන්දයෙන් තෝරා පත් කරගන්නා මහජන නියෝජිතයන්ගෙන් සමන්විත වඩා පුළුල් විධායක බලතල සහිත පළාත් සංවර්ධන සභා පිහිටුවීම සහ එම සභාවල අමාත්‍යවරුන්ට සීමා සහිත වරප්‍රසාද යටතේ මධ්‍යම රජයේ නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ බලතල ලබාදීම.

3.2) එම නව ව්‍යවස්ථාව මගින් මහජනයාගේ 'සිස්ටම් චේන්ජ්' අපේක්ෂාව ඉටු කිරීම සඳහා වන මූලික සහ ප්‍රධාන කොන්දේසිය වන නව ව්‍යවස්ථාවක් මහජනයාට ඉදිරිපත් කිරීම සහ සම්මත කිරීම මෙන් ම ඒ මගින් වර්තමානයේ අත්විඳින අත්තනෝමතික ඒකාධිපති වියරුව පාලනය කිරීම සහ පාලකයා බෙදුම්වාදී, ජාතිවාදී සහ අන්තවාදී බලවේගවලට යටත් වීම වැළැක්වීම සඳහා ජනාධිපතිවරණය අහෝසි කිරීම සහ ව්‍යවස්ථාව මගින් පනවන සුදුසුකම් සහ කොන්දේසිවලට යටත් ව පාර්ලිමේන්තුවට මහජන ඡන්දයෙන් පත්වන නියෝජිතයකු ජනාධිපතිවරයා වශයෙන් පත් කිරීම මෙන් ම විධායක බලය ජනාධිපති, අගමැති අමාත්‍ය මණ්ඩලය සහ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා අතර තුළනාත්මක ව ශක්තිමත් කෙරෙන ආකාරයට ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම.

3.3) නව නීතියක් මගින් ආර්ථික අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවක් පත් කිරීම මගින් 2010 සිට 2024 කාලය දක්වා සිදුකර ඇති බවට චෝදනා එල්ල වන සියලු ම ආර්ථික අපරාධ (අල්ලස්, වංචා, දූෂණ සහ නාස්තිය) විමර්ශනය කර දඬුවම් ලබාදීම සඳහා ඊට අදාළ ව පැමිණිලි ඉදිරිපත් කරන මහජනයාට, සංවිධානවලට මෙන් ම දේශපාලන පක්ෂවලට අවස්ථාව ලබාදීම හරහා මහජන විශ්වාසය තහවුරු කිරීම සහ රාජ්‍යයේ ඉදිරි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සහාය ලබාගැනීම. එම ක්‍රියාවලිය තුළ අධිවේගී මාර්ග ඉදිකිරීම ආශ්‍රිත වංචා, දේශීය බැඳුම්කර වංචාව, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර වංචාව, රුපියල පා කිරීම සහ බංකොලොත්භාවය ප්‍රකාශ කිරීම මගින් අර්බුදය වර්ධනය කිරීමට දායක වීම මෙන් ම සීනි බදු වංචාව සහ පොල්තෙල් බදු වංචාව ආදි ප්‍රබල ආර්ථික අපරාධ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

3.4) උසස් රාජ්‍ය නිලධාරීන්ගේ සහ සියලු ම මහජන නියෝජිතයන් මෙන් ම දේශපාලන පක්ෂ නායකයන්ගේ මහජන වගවීම සහතික කිරීම සහ ඔවුන් අල්ලස්, වංචා සහ දූෂණවලට පෙළඹවීම වැළැක්වීම සඳහා පමණක් නොව ඔවුන්ට නීතිය සහ ව්‍යවස්ථාව මගින් පවරා ඇති වගකීම් ප්‍රතිඵලදායක සහ කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා නායකත්ව ආචාරධර්ම පද්ධතියක් නීතිගත කිරීම සහ ඒ මගින් ආචාර ධර්ම කඩ කිරීම පිළිබඳ ව විභාග කර දඬුවම් කිරීම හෝ පරිපාලන ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා විනිශ්චය මණ්ඩලයක් (ට්‍රයිබියුනල්) පත් කිරීම. ඊට අමතර ව එම පනත මගින් මහජන සුභසිද්ධිය සඳහා තොරතුරු එළිදරව් කරන රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් කළ නොහැකි වන ආකාරයට ආරක්ෂාව ලබාදීම.

3.5) මහජනයාට වග වන මහජන නියෝජිතයකු පත් කිරීම මුල් කරගෙන පාර්ලිමේන්තු මැතිවරණය සහ පළාත් පාලන මැතිවරණය කොට්ඨාශ ක්‍රමය මූලික ව පදනම් කරගෙන පැවැත්වීම සඳහා මෙන් ම දේශපාලන පක්ෂ විසින් තම නියෝජිතයන් ප්‍රජාතන්ත්‍රවාදී ව තෝරාගැනීම සහතික කිරීම සහ මහජන නියෝජිතයන් විසින් මහජනයාට ලබාදෙන පොරොන්දු (වාචික සහ ලිඛිත) මහජන ගිවිසුම් සේ සලකා පසු විපරමට අදාළ ව පියවර ගැනීම සඳහා අදාළ මැතිවරණ නීති සංශෝධනය කිරීම. එසේ ම මහජන නියෝජිතයන් විසින් රාජ්‍ය සම්පත් අවභාවිත කිරීම සහ මහජන අගෞරවයට ලක් වීම වැළැක්වීම සඳහා ඔවුන්ගේ වගකීම් අනුව ලබා දිය හැකි අවම සහ උපරි ම පහසුකම් මෙන් ම වරප්‍රසාද සදාචාරමය වශයෙන් පිළිගත හැකි ආකාරයට සීමා කිරීම සඳහා ව්‍යවස්ථාව මගින් සහ ආචාර ධර්ම නීතිගත කිරීමේ නීතිමය රාමුව යටතේ ප්‍රතිපාදන සැලසීම.

3.6) ජාතිකත්වය, ආගම, භාෂාව හෝ කුලය මත පදනම් ව කිසිදු රටවැසියකුට රාජ්‍යය සමාජය හෝ දේශීය සහ විදේශීය පුද්ගලික ආයතන විසින් වෙනස්කම් සිදු නොකරන බව සහතික කිරීම සහ අදාළ පැමිණිලි විභාග කිරීම මෙන් ම සහන ලබාදීම සහ නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා නිර්දේශ සහ විනිශ්චයන් ලබාදීම මුල් කරගෙන ජාතික අයිතිවාසිකම් කොමිසමක් පිහිටුවීම සහ එම කොමිසම පළාත් මට්ටමට විමධ්‍යගත කිරීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සැලසීම මෙන් ම නව නීතියක් හඳුන්වා දීම. ඊට අමතර ව විශේෂයෙන් ම උතුරු සහ නැගෙනහිර පළාත්වල බල පැවැත්වෙන කුල පීඩනය අහෝසි කිරීම සඳහා 1957 සමාජ දුබලතාවන් වැළැක්වීමේ පනත ශක්තිමත් කර බලාත්මක කිරීම.

3.7) ආර්ථික සහ දේශපාලන ස්වෛරීත්වය ආරක්ෂා කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1977 දී සම්මත කළ 2832 යෝජනාව ප්‍රකාර ව නොබැඳි ප්‍රතිපත්තිය යටතේ ඉන්දියානු සාගරය සාම කලාපයක් බවට පත් කිරීම සඳහා ඉන්දියානු සාගර වළල්ල සංවිධානය (IORA) මගින් සම්මත කළ ජාකර්තා ප්‍රකාශය ශක්තිමත් කරමින් මැදිහත් විය යුතු බවට විදේශ ප්‍රතිපත්තියක් පාර්ලිමේන්තුව මගින් සම්මත කිරීම සහ ඊට අදාළ ව ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම

3.8) ඊට අමතර ව සියලු ම ජාත්‍යන්තර ගිවිසුම්වලට අදාළ ව සාකච්ඡා සඳහා සහභාගි වන පුද්ගලයන්ගේ වගවීම, සාකච්ඡා ක්‍රියාවලියේ විනිවිදභාවය, මහජන සංවාදය සහ නම් කරන ලද ක්ෂේත්‍රවලට අදාළ ව එනම් ආර්ථික, සමාජීය, දේශපාලන, පාරිසරික ආදි වශයෙන් සිදුවිය හැකි හොඳ සහ නරක බලපෑම් පිළිබඳ ව පූර්ණ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරය සහිත ව සම්මත කිරීම අනිවාර්ය කිරීම සඳහා ප්‍රතිපාදන සලසන නව නීතිමය රාමුවක් හඳුන්වාදීම මෙන් ම ඊට අදාළ ව

ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සැලසීම. එසේ ම එම නීතිය සම්මත කරන තුරු කවර වූ හෝ ජාත්‍යන්තර ගිවිසුම්වලට අදාළ සාකච්ඡා තාවකාලික ව අත්හිටුවීම.

3.9) පුද්ගලික ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා වන පූර්ව කොන්දේසි වශයෙන් ආර්ථික ඉඩ ප්‍රස්ථා සැලසීම විශේෂයෙන් ම වෙළඳපළ මිල විකෘතීන් සහ වෙළඳපළ ව්‍යුහයේ විකෘති නිවැරදි කිරීම සඳහා පියවර ගන්නා අතර ඒ තුළින් සාමූහික ව්‍යවසායකත්වය පුළුල් කිරීම මගින් ආර්ථික, සමාජ සහ පාරිසරික සාධාරණත්වය වර්ධනය කිරීම සඳහා සමුපකාර ව්‍යවසායකත්වය දිරිගැන්වීම, විශේෂයෙන් ම තරුණ ගොවි සමුපකාර මෙන් ම පරිගණක සහ මෘදුකාංග, සංචාරක ඇතුළු සේවා සහ ගෘහ ආශ්‍රිත කෘෂිකාර්මික සහ කාර්මික නිෂ්පාදන සඳහා සමුපකාර ක්‍රමය, විශේෂයෙන් ම කාන්තා සමුපකාර දිරි ගැන්වීම සඳහා සහන පැකේජයක, ඉඩම් සංචිතයක් සහ අරමුදලක් ගොඩනැගීම.

3.10) රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ ව්‍යවස්ථාමය සහ නීතිමය ප්‍රතිපාදන තවදුරටත් ශක්තිමත් කිරීම මෙන් ම ප්‍රාග්ධන සහ භාණ්ඩ වෙළඳපළ තුළ රාජ්‍යයේ කොටස සහ මැදිහත් වීම සහතික කිරීම සඳහා අදාළ වගකීම නීතිගත කිරීම සහ එය ඉටු කෙරෙනවා ද යන්න සොයාබැලීම මෙන් ම මහජන පැමිණිලි විභාග කිරීම සහ නිර්දේශ ලබාදීමට අමතර ව ඒවා බලාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සලසන නව නීතියක් මගින් ආර්ථික සාධාරණත්වය සඳහා වූ ජාතික කොමිසමක් පිහිටුවීම සහ ඒ මගින් වෙළඳපළ නියාමනය සහ වෙළඳපොළ තුළ කොටසක් අත්පත් කරගැනීම හරහා වෙළඳපොළ තුළ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති සියලු ම රාජ්‍ය ආයතනවලට පවරා ඇති වගකීම් ඉටු කිරීම පිළිබඳ ව ආවේක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම.

3.11) පාර්ලිමේන්තු වරප්‍රසාද පනත සහ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම මගින් පාර්ලිමේන්තුවේ මුදල් කමිටු ශක්තිමත් කිරීම සහ එම කමිටු මගින් මහජන පැමිණිලි විභාග කිරීම සහ සියලු ම රැස්වීම් ජනමාධ්‍යයට විවෘත කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම මෙන් ම ඒ මගින් වැරදිකරුවන්ට එරෙහි ව වැඩිදුර පියවර ගැනීම සඳහා අල්ලස් සහ දූෂණ කොමිසම, විගණකාධිපති, අදාළ ආයතන ප්‍රධානීන් සහ නීතිපතිට නිර්දේශ ලබාදීම සඳහා නීතිමය ආවරණය ලබාදීම.

3.12) අමාත්‍යවරුන් විසින් අත්තනෝමතික ලෙස තම බලය අයුතු ලෙස භාවිත කිරීම සහ භාවිත කළ යුතු බලය භාවිත නොකිරීම වැළැක්වීම සඳහා පාර්ලිමේන්තුවේ සියලු ම මන්ත්‍රීවරුන් ඇතුළත් වන ආකාරයට සෑම අමාත්‍යාංශයක් සඳහා ම විධායක බලතල සහිත උපදේශක කාරක සභා පිහිටුවීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම. එසේ ම අමාත්‍යාංශ අයවැය පූර්වගාමී ව මාසික ව ඇගැයීම සහ සමාලෝචනය කිරීම අදාළ කාරක සභාවල මූලික වගකීමක් බවට පත් කිරීම. ඊට අමතර ව උපදේශක කාරක සභාව මගින් මහජන පැමිණිලි හෝ වෘත්තීය සමිති පැමිණිලි විභාගයට ගැනීමේ දී ජනමාධ්‍ය ආවරණය ලබාදිය යුතු බවට ස්ථාවර නියෝගවලින් ප්‍රතිපාදන සැලසීම.

**විශේෂ කොන්දේසිය**

3.1, 3.2, 3.5, 3.6, 3.7, 3.8, 3.12 යන වගන්ති මගින් ඉදිරිපත් කරන යෝජනා උපායමාර්ගික ව එකට බැඳී ඇති බැවින් ඒවා වියුක්ත ව සැලකිල්ලට නොගත යුතු අතර සමස්තයක් ලෙස ක්‍රියාත්මක කළ යුතු ය.

## අධිරාජ්‍යවාදයට අභියෝගයක් - ස්වෛරීත්වයට මුල් තැන දෙන රාජ්‍යයක්

4. **ජාතික මට්ටමින් සමාජ - සංවර්ධන ක්‍රියාවලියේ මහා පිම්මක් පැනීම සඳහා භූමිය ඇතුළු ස්වාභාවික සම්පත් සහ රාජ්‍යය මෙන් ම පුද්ගලික දේපල සහ මහා සාගර කලාපය ආශ්‍රිත සම්පත්වලින් පරිසර හිතවාදී ලෙස දීර්ඝකාලීන ව ජාතියට ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ව්‍යවස්ථාමය, නීතිමය, ආයතනමය සහ මූල්‍යමය ප්‍රතිපාදන සැලසීම මෙන් ම ඊට අදාළ ව සමාජය සූදානම් කිරීම.**

4.1) පවතින ඉඩම් නීති අභිබවා ක්‍රියා කරමින් සහ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අවභාවිත කරමින් මෙන් ම නව නීති පැනවීම මගින් සහ ඉඩම් බැංකු පිහිටුවීම සහ යටි අරමුණු සහිත ව ඉඩම් වෙළඳපළක් නිර්මාණය කර මහජනයාට ඉඩම් අහිමි කිරීම සඳහා නව ඔප්පු ලබාදීමේ ක්‍රියාවලිය සහ පුරාවිද්‍යා රක්ෂිත මෙන් ම වන රක්ෂිත අවභාවිත කිරීම මගින් සිදුකරන ඉඩම් කොල්ලයට මග සැලසීමේ සමස්ත ක්‍රියාවලිය අත්හිටුවීම. එසේ ම ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියට සහ සැලසුමට යටත් ව දේශීය සහ විදේශීය ආයෝජකයන්ට බදු පදනමින් ඉඩම් ලබාදීම සඳහා විනිවිද භාවය සහිත ව ජාතික ප්‍රමුඛතාවන්ට අනුව ඉඩම් ලබාදීම සඳහා ජාතික ඉඩම් සංචිතයක් පිහිටුවීම. ඊට අමතර ව විදේශීය සමාගම්වලට කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම නීතිය මගින් තහනම් කිරීම සහ සමුපකාර සමිතිවලට, විශේෂයෙන් ම තරුණ ගොවි සමුපකාර සමිතිවලට ඉඩම් නිදහස් කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදීම. ඒ අතර පසු ගිය වසර 15ක කාලය තුළ ඉඩම් අයිතිය වෙනස් වීම සහ රාජ්‍ය ඉඩම් අනවසර ලෙස අත්පත් කරගැනීම පිළිබඳ ව ජාතික විගණනයක් සිදු කිරීම මෙන් ම අවභාවිත කිරීම සහ නීත්‍යනුකූල නොවන විකිණීම් හෝ හුවමාරු නිවැරදි කිරීම සඳහා අන්තර් අමාත්‍යාංශ කාර්ය සාධක බල ඇණියක් පත් කිරීම සහ ඊට අදාළ ව අවශ්‍යතාව අනුව නව නීතිමය ප්‍රතිපාදන පැනවීම.

4.2) වරායවල් ගුවන්තොටුපළවල් ඇතුළු රාජ්‍ය ආයතන කිසිවක් විකිණීම හෝ සම්පූර්ණ අයිතිය අත්හැරීම සිදු කළ නොහැකි වන ලෙස සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ දී රාජ්‍ය අයිතිය ප්‍රතිශතයක් ලෙස 60% අවමයක් ලෙස නියම කරමින් නීතිමය සහ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම. එම ක්‍රියාවලිය තුළ රාජ්‍ය ව්‍යවසායක ආයතන කළමනාකරණය කිරීම සඳහා සහ දේශීය පුද්ගලයන් සහ සමාගම්වලින් මෙන් ම විදේශ රැකියා නියුක්තිකයන් මගින් ප්‍රාග්ධනය රැස් කිරීම සඳහා ''තමාසෙක්'' මොඩලයට අනුව රාජ්‍ය පුද්ගලික ඒකාබද්ධ පරිපාලන සමාගමක් සහ ප්‍රාග්ධන අරමුදලක් පිහිටුවීම සඳහා ව්‍යවස්ථාමය සහ නීතිමය ප්‍රතිපාදන පැනවීම. ඒ මගින් කොටස් වෙළඳපළ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම.

4.3) රාජ්‍ය පුද්ගලික ''ඒකාබද්ධ පරිපාලන සමාගම'' මගින් හම්බන්තොට වරාය සහ ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ 60% දක්වා කොටස් අයිතිය ලබාගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා ආරම්භ කිරීම. ඊට සමගාමී ව 1976 මුහුදු පිළිබඳ නීතිය අනුව මහද්වීපික තටාකාංග කොමිසම සමග සාකච්ඡා ක්‍රියාවලිය අවසන් කර ශ්‍රී ලංකාවට හිමි මහද්වීපික තටාකයේ අයිතිය තහවුරු කරගැනීම සහ ඒ මගින් ශ්‍රී ලංකාවට හිමිවිය යුතු මුහුදු පතුලේ පවතින 'කොබෝල්ට්' නිධිය පිළිබඳ අයිතිය ලබාගැනීම. එසේ ම අවිධිමත් ව ඉන්දියාවට පවරා ඇති වර්ග කිලෝමීටර් ලක්ෂ 3ක ඊසාන දිග ගුවන් කලාපයට අදාළ ව ශ්‍රී ලංකාව සතු ඓතිහාසික සහ භූගෝලීය අයිතිය නැවත ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීම. ඊට අමතර ව ඒකාබද්ධ පරිපාලන සමාගම යොදාගනිමින් ශ්‍රී ලංකාව ගුවන් සහ මුහුදු ගමනාගමන කේන්ද්‍රයක් බවට පත් කිරීම

සඳහා දේශීය සහ විදේශීය ආයෝජන දිරිමත් කිරීම සඳහා විශේෂ සහන පැකේජයක් හඳුන්වාදීම. එම ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකන් ගුවන් සේවයට නැවත පණ දීම සඳහා ප්‍රාග්ධනය යෙදවීම සඳහා ඒකාබද්ධ පරිපාලන සමාගම යොදාගැනීම සහ ඊට අදාළ පරිපාලන දුර්වලතා නිවැරදි කිරීම සඳහා සේවක සංගම් සහ ස්වේජ්ජා විශේෂඥයන් විසින් සකස් කර ඇති වර්තා සහ විශේෂඥ සහය යොදාගැනීම.

4.4) බලශක්ති සුරක්ෂිතතාව වර්ධනය කිරීම සහ සහතික කිරීම සඳහා මේ වන විට අධෛර්යමත් වී ඇති සූර්ය බලශක්ති සංග්‍රාමය හෙවත් වහල මත සූර්ය බල ව්‍යාපෘති දිරිමත් කිරීම සඳහා රාජ්‍ය භාගය සහිත ව ධාරිතාව අනුව මිල දී ගැනීම සඳහා සාධාරණ සහ උපරි ම මිලක් නියම කිරීම මෙන් ම රාජ්‍ය භාගය අරමුදලක් සේ යොදා-ගනිමින් එම ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන තාක්ෂණික යටිතල පහසුකම් වර්ධනය කිරීම. එසේ ම එම අරමුදල යොදාගනිමින් සූර්යබල සංග්‍රාමයට අදාළ උපාංග නිෂ්පාදනය සහ ආනයනය සඳහා දිරිමත් කිරීමේ සහන පැකේජයක් හඳුන්වාදීම. ඊට අමතර ව බලශක්ති පිරිමැස්මට අදාළ තාක්ෂණය සහ උපාංග දේශීය ව නිෂ්පාදනය කිරීම දිරිමත් කිරීම සඳහා විශේෂයෙන් ම දැනට භාවිත වන ත්‍රිරෝද රථ සහ මෝටර් සයිකල් විදුලි වාහන බවට පරිවර්තනය කිරීම සඳහා සහන පැකේජයක් හඳුන්වාදීම.

4.5) දේශීය සහ විදේශීය ආයෝජකයන් මෙන් ම ඒකාබද්ධ පරිපාලන සමාගම සතු අරමුදල් සහ රාජ්‍ය බැංකු සතු අරමුදල් යොදාගනිමින් විදේශ විනිමය ඉතිරි කරගැනීම සහ විදේශ විනිමය ආදායම් වර්ධනය කිරීම මෙන් ම බලශක්ති සුරක්ෂිතතාව සහ ආර්ථික ස්වාධිපත්‍යය ඉලක්ක කරමින් ශ්‍රී ලංකාව සතු ස්වාභාවික සම්පත්වලින් උපරි ම ප්‍රයෝජන ලබාගැනීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජන දිරිගැන්වීම සහ එම ක්‍රියාවලිය තුළ දේශීය අමුද්‍රව්‍ය දේශීය ව පවතින තාක්ෂණය සහ විද්වතුන් යොදාගනිමින් ආරම්භ කළ හැකි පහත සඳහන් පරිදි උපාය මාර්ගික වශයෙන් වැදගත් මහා පරිමාණ කර්මාන්ත ජාලයක් (පංච මහා ජාතික කර්මාන්ත) ආරම්භ කිරීම සඳහා ආයෝජන දිරිගැන්වීමේ සහන පැකේජයක් හඳුන්වාදීම.

I. මිනිරන්වලින් ග්‍රැෆීන්, බැටරි ශ්‍රේණියේ ග්‍රැෆයිට් සහ සන්නායක ග්‍රැෆයිට් යන ජාත්‍යන්තර වශයෙන් ප්‍රබල ඉල්ලුම් සහිත වටිනාකම් එකතු කළ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා රාජ්‍ය සහ පුද්ගලික මිනිරන් පතල් යොදාගැනීම.

II. එප්පාවල පොස්පේට් නිධිය මගින් සිංගල් සුපර් පොස්පේට් නිපදවීම සඳහා සල්ෆියුරික් අම්ල නිෂ්පාදන කර්මාන්තය ඇතුළත් වන ලෙස කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම.

III. ඛනිජ තෙල් පිරිපහදුව ආශ්‍රිත අතුරු නිෂ්පාදනයක් වන''නැප්තා'' යොදාගනිමින් යූරියා කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම.

IV. පුල්මුඩේ ඛනිජ වැලි ආශ්‍රිත ව වටිනා ලෝහ නිෂ්පාදනය සඳහා නිස්සාරණ කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම.

V. දේශීය සීනි අවශ්‍යතාව රට තුළ නිපදවීම මුල් කරගෙන වසා දමා ඇති කන්තලේ සීනි කර්මාන්තශාලාව නව කර්මාන්ත ශාලාවක් ලෙස ආරම්භ කිරීම සහ ඒ

ආශ්‍රිත ව බහු කාර්ය ව්‍යාපෘති ජාලයක් ආරම්භ කිරීම. විශේෂයෙන් ම විදුලිය නිපදවීම, මද්‍යසාර ආශ්‍රිත නිෂ්පාදන, කිරි නිෂ්පාදනය සහ කිරි ආශ්‍රිත කර්මාන්ත දිරිමත් කිරීම. ඊට අමතර ව සෙවණගල සහ බුත්තල සීනි කර්මාන්ත ශාලා පුළුල් කිරීම මෙන් ම බාහිර සැපයුම් ගොවීන් ප්‍රමාණය වැඩි කිරීම සඳහා අයෝජන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

4.6) මන්නාරම සහ කාවේරි ද්‍රෝනියේ ස්වාභාවික ගෑස් සහ ඛනිජතෙල් ගවේෂණය සහ නිෂ්පාදනය සඳහා රාජ්‍ය භාගය ඇතුළත් වන ආකාරයට රාජ්‍ය කොටස් අයිතිය සහිත ව විදේශ ආයෝජන දිරිගැන්වීම සඳහා විශේෂිත ආයෝජන සැලසුමක් ඉදිරිපත් කිරීම. එසේ ම ඛනිජ සම්පත් ආශ්‍රිත සියලු ම කර්මාන්තවලින් කර්මාන්තයේ ස්වරූපය අනුව අවම වශයෙන් 2% සිට 10% දක්වා රාජ්‍යභාගය අය කිරීම සඳහා නව නීතිමය රාමුවක් හඳුන්වාදීම සහ ඒ මත පදනම් ව ඛනිජ තෙල් ගවේෂණය සහ පිරිපහදු කිරීමට අදාළ ව උසස් තාක්ෂණය යොදාගන්නා රටවල් විශේෂයෙන් ම රුසියාව, චීනය සහ ඉන්දියාව යන රටවලින් තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ආයෝජන යෝජනා ලබාගැනීම.

4.7) ශ්‍රී ලංකාවට අයත් මහා සාගර කලාපයෙන් උපරි ම ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීම මෙන්ම ඛනිජ සම්පත් ගවේෂණය, ජෛව පර්යේෂණ සහ සමුද්‍ර ආරක්ෂාව සඳහා පහසුකම් සැලසීම මුල් කරගෙන සමස්ත කලාපය ම ආවරණය වන ලෙස මව් යාත්‍රා ජාලයක් (දැනට තිබෙන සක්‍යතා අධ්‍යයන අනුව යාත්‍රා 10ක්) ස්ථානගත කිරීම සහ ඒ මගින් මහා පරිමාණ ධීවර යාත්‍රාවලට සන්නිවේදන, නැංගුරම් සහ සෙසු පහසුකම් ලබාදීම මෙන් ම එම ධීවරයන්ට ගොඩබිමට පැමිණීම සඳහා ප්‍රවාහන පහසුකම් සහ නවාතැන් පහසුකම් සැපයීම සහ ඊට අමතර ව මත්ස්‍ය නිෂ්පාදන කල් තබාගැනීම සහ වටිනාකම් එකතු කිරීම සඳහා පහසුකම් සැපයීම. (සක්‍යතා අධ්‍යයනයන්ට අනුව ඒ සඳහා පරණ යකඩ බරට මිල දී ගත හැකි පසු පරපුරට අයත් මහා පරිමාණ ප්‍රවාහන නැව් යොදාගත හැකි ය.)

4.8) නව නිපැයුම් කොමිසමට අදාළ නීතිය සහ ආයතනය නැවත ස්ථානගත කිරීම මගින් සමස්ත පාසල් පද්ධතිය, තාක්ෂණික විද්‍යාලය පද්ධතිය සහ විශ්වවිද්‍යාලය පද්ධති ආවරණය වන ලෙස ආයතන මට්ටමින් නවෝත්පාදන ගුරු-සිසු ඒකාබද්ධ කමිටු සහ ඒ යටතේ ක්ෂේත්‍රවලට අදාළ ව උපකමිටු පිහිටුවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ ව ජාතික වැඩ සටහනක් දියත් කිරීම, එසේ ම ඊට අදාළ ව ඉහළ මට්ටමින් තාක්ෂණික පහසුකම් දැනුම සහ පුහුණුව ලබාදීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් සහ ජාතික මට්ටමින් සම්පත් මධ්‍යස්ථාන ජාලයක් පිහිටුවීම. ඊට අමතර ව සිසුන් අතර පර්යේෂණ මනසක් ඇති කිරීම සඳහා විෂයමාලා සංශෝධනයට අමතර ව පාසල් ආශ්‍රිත ව ඊට අදාළ ව තාක්ෂණික පහසුකම් වර්ධනය කිරීම සහ සියලු ම කඩඉම් විභාග සඳහා පර්යේෂණ නිබන්ධයක් හෝ අවම වශයෙන් පර්යේෂණ යෝජනාවක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම.

4.9) ජාතික පර්යේෂණ සහ සංවර්ධන අරමුදලක් පිහිටුවීම සහ එය පෝෂණය කිරීම සඳහා රාජ්‍ය අයවැය මගින් 1%ක මුදලක් වෙන් කිරීම සහ ඛනිජ සම්පත් ව්‍යාපෘතිවලින් රාජ්‍ය භාගය වශයෙන් භාණ්ඩාගාරයට ලැබෙන අරමුදල්වලින් 50%ක් වෙන් කිරීම සහ එම අරමුදල් මගින් අධ්‍යාපන ආයතන ආශ්‍රිත ව සිසුන් අතර පර්යේෂණ සංස්කෘතියක් ගොඩනැගීම සඳහා අදාළ පාසල් විසින් ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා අනුව තෝරාගත් ක්‍රියාකාරකම් සඳහා අරමුදල් යෙදවීම. ඊට අමතර ව රාජ්‍ය සහ පුද්ගලික කර්මාන්ත සහ සේවා ආශ්‍රිත ආයතන විසින් ඉදිරිපත් කරන පර්යේෂණ සහ සංවර්ධන

ව්‍යාපෘති යෝජනාවලට අදාළ ව තෝරාගත් ක්‍රියාකාරකම් සඳහා ජාතික ප්‍රමුඛතාවකට යටත් ව අරමුදල් ලබාදීම මෙන් ම ප්‍රමුඛතාව නිර්ණය කිරීමේ දී දේශීය දැනුම් පද්ධතිය ආශ්‍රිත පර්යේෂණ සඳහා ඉහළ ප්‍රමුඛතාව ලබාදීම. එම ක්‍රියාවලිය තුළ ආයතන ආශ්‍රිත ව කර්මාන්ත සහ සේවා නිෂ්පාදන ක්‍රියාවලිය දියුණු කිරීම සඳහා අදාළ ක්‍රියාදාමයන් තුළ ගැටලු හඳුනාගැනීම, ගැටලු විසඳීම සහ එම දාමයන් දියුණු කිරීම සඳහා සේවකයන් තුළ තමාට අදාළ ක්‍රියාදාමය පිළිබඳ මනෝභාවය දියුණු කිරීම සඳහා වන අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමුඛතාව ලබාදීම සහ එම ක්‍රියාවලිය දිරිමත් කිරීම සඳහා අදාළ අරමුදල මගින් මූල්‍ය පහසුකම් ලබාදීම. ඊට අමතර ව විවිධ නීති සහ ආයතන යටතේ පිහිටුවා ඇති රාජ්‍ය සහ රාජ්‍ය නොවන පර්යේෂණ ආයතන ජාතික පර්යේෂණ න්‍යාය පත්‍රයකට අනුව පෙළගැස්වීම සහ එම ජාතික පර්යේෂණ න්‍යාය පත්‍රය සකස් කිරීම සහ ඒ තුළ ප්‍රමුඛතාවන් නිර්ණය කිරීමට අදාළ ව විධිමත් සහ පුළුල් මහජන සංවාදයක් මෙන් ම දේශීය සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්, විද්වතුන්ගේ පුළුල් සහභාගිත්වය සහතික කිරීම.

4.10) ජාතිය සතු මහා මිනිස් සම්පත දියුණු කිරීම සහ ආර්ථික සහ සමාජය දියුණුව සඳහා යොදාගැනීම් මුල් කරගෙන වෘත්තීය පුහුණු ආධ්‍යාපනයට ජාතික ප්‍රමුඛතාවක් ලබාදීම. ඒ යටතේ උසස් පෙළ විභාගයට පෙනී සිටීම සඳහා කුමන හෝ මට්ටමක NVQ සහතිකයක් අනිවාර්ය කිරීම සහ ඒ සඳහා පාසල් ආශ්‍රිත ව මෙන් ම පුද්ගලික ආයතන මගින් සහ තාක්ෂණික අධ්‍යාපන ආයතන ජාලය මගින් සතිඅන්ත සහ සවස් පාඨමාලා ආරම්භ කිරීම මුල් කරගෙන අධ්‍යාපන අයවැයට වැය ශීර්ෂයක් ඇතුළු කිරීම. එම ක්‍රියාවලිය තුළ විශ්‍රාමික වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන ගුරුවරුන් සහ සේවා නියුක්ත ශිල්පීන්, බාහිර සම්පත් දායකයන් ලෙස යොදාගැනීම සඳහා ජාතික නිපුණතා සම්පත් රෙජිස්ටරයක් ආරම්භ කිරීම සහ ඊට අදාළ ව විදේශීය රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ගේ සම්පත් දායකත්වය මාර්ගගත ක්‍රමයට සහ නිවාඩු ගත කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන කාලය තුළ ලබාගැනීම සඳහා සුවිශේෂී පරිගණක මෘදුකාංග-යක් අධ්‍යාපන අමාත්‍යංශය මගින් හඳුන්වාදීම. එසේ ම එම ක්‍රියාවලිය දිරිමත් කිරීම සඳහා NVQ සහතිකලාභීන්ට විශ්වවිද්‍යාලය පාඨමාලාවක් දක්වා තාක්ෂණික අධ්‍යාපනය වර්ධනය කරගැනීම සඳහා පහසුකම් සැලසීම මුල් කරගෙන දිස්ත්‍රික් මට්ටමින්, විවෘත විශ්වවිද්‍යාලය සහ තාක්ෂණික විද්‍යාලය සතු පහසුකම් වර්ධනය කිරීම මගින් ජාතික තාක්ෂණික විවෘත විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සඳහා ජාතික ප්‍රමුඛතාවක් ලබාදීම සහ රාජ්‍ය අරමුදල් යෙදවීම.

4.11) ගෝලීය පරිගණක මෘදුකාංග ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ විද්වතුන් විසින් ඉතා දුෂ්කර තත්ත්වයන් යටතේ ස්වේච්ඡාවෙන් මැදිහත් ව ලබාගෙන ඇති ඉඩ රාජ්‍ය මැදිහත්වීම මගින් වර්ධනය කිරීම මුල් කරගෙන ශ්‍රී ලංකා ගණකාධිපතිවරුන්ගේ ආයතනයට සමගාමී ආකාරයට වෘත්තීය අවස්ථා සහ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට අදාළ ව මධ්‍යගත ව දායක වීම සඳහා නව නීතියක් මගින් ආයතනයක් පිහිටුවීම සහ අදාළ නීතිය මගින් කෘත්‍රිම බුද්ධිය නිර්මාණය කිරීම මෙන් ම යොදාගැනීමට අදාළ ව ආචාර ධර්ම පද්ධතියක් නීතිගත කිරීම. එසේ ම එම ආයතනය සඳහා රජයේ ඉඩම් ලබාදීමට අමතර ව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සහ මූලික යටිතල පහසුකම් සඳහා ප්‍රාග්-ධනය රාජ්‍ය අයවැය මගින් ලබාදීම. ඊට අමතර ව මෘදුකාංග විද්වතුන් පුද්ගලික ව සහ වාණිජ ආයතන ලෙස උපයනු ලබන විදේශ විනිමය ආදායම් සියලු ම බදුවලින් නිදහස් කිරීම. අවසානයේ දී එම ක්‍රියාවලිය මගින් සුහුරු දුරකථනයක් අත තබාගැනීම මගින් සමස්තය සුහුරු වන බවට දේශපාලන වාසි තකා සුහුරු උපකරණ හුදෙකලා ව සහ අතිශයෝක්තියෙන් ප්‍රචලිත කිරීම මගින් සිදු කෙරෙන හානි අවම කිරීම සඳහා ජාතික මට්ටමින් අධ්‍යාපන වැඩ සටහනක් දියත් කිරීම

4.12) රටේ පවතින 35000කට අධික කුඩා වැව් සහ අමුණු මෙන් ම ඒ ආශ්‍රිත පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය සහ ආරක්ෂා කිරීම සඳහා ගොවි සමිති, පළාත් පාලන ආයතන, ස්වේච්ඡා සංවිධාන සහ ආරක්ෂක හමුදා සතු සම්පත් යොදාගනිමින් ස්ථිර යාන්ත්‍රණයක් පිහිටුවීම සඳහා ගොවි ජන පනත මගින් ප්‍රතිපාදන පැනවීම. ඊට අමතර ව ඒ ආශ්‍රිත ව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය උපරි ම මට්ටමට නිෂ්පාදනය කිරීම සඳහා මහා වාරි පද්ධති ඇතුළත් වන ආකාරයට ජාතික මිරිදිය මත්ස්‍ය අභිජනන ව්‍යාපෘතියක් දියත් කිරීම සහ ඒ සඳහා ස්වේච්ඡා සංවිධාන, ව්‍යවසායකයන්, ගොවි සංවිධාන, ගොවි සමුපකාර වඩා පුළුල් ලෙස සහභාගි කරගැනීම. එම සමස්ත ක්‍රියාවලිය මුල් කරගෙන සහ ඊට සමගාමී ව ආරක්ෂක හමුදා සතු සම්පත් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට යොදාගැනීම සඳහා ජාතික සංවර්ධන ආර්ථික බලකායක් පිහිටුවීම මෙන් ම කොටි කාලීන ව එම බලකායට බැඳී කටයුතු කිරීම සඳහා ස්වේච්ඡා සංවිධාන, පාසල් සිසුන් සහ විශ්වවිද්‍යාලය සිසුන්ට අවස්ථාව ලබාදීම.

**සභ්‍යත්වය විසින් මෙහෙයවනු ලබන මිනිසෙක් - සතුටු පිරුණු සමාජයක්...**

5. **ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවරවල දිගුවක් ලෙස ඓතිහාසික සභ්‍යත්ව උරුමය ආරක්ෂා කිරීම, ඒ මත දෙපා තබා ශක්තිමත් ව නැගී සිටින සමාජයක් බිහි කිරීම, ඒ තුළින් ආර්ථික ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම සහ සභ්‍යත්ව උරුමයට එරෙහි ව එල්ල වන ප්‍රහාරයන් මැඩ පැවැත්වීම සඳහා ඉහළ ප්‍රමුඛතාවක් ලබාදීම.**

5.1) ඉතිහාසය විෂය ජාතික උරුම අධ්‍යයනය ලෙස නැවත ස්ථානගත වන ආකාරයට අදාළ විෂයමාලා සංවර්ධනය කිරීම සහ රාජ්‍ය පුද්ගලික සහ ජාත්‍යන්තර පාසල්වල එම විෂය අනිවාර්ය කිරීම. ඊට අමතර ව අපොස සාමාන්‍ය පෙළ දක්වා මව් බසින් අධ්‍යාපනය ලැබීම දරුවන්ගේ සංස්කෘතික සහ මනෝවිද්‍යාත්මක අයිතියක් ලෙස පිළිගෙන එය ක්‍රියාත්මක කිරීම සහ දෙවැනි භාෂා ලෙස දෙමළ සහ සිංහල මෙන් ම සම්බන්ධීකරණ භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම අනිවාර්යය කිරීම සහ ඊට අදාළ ව ගුරු පුහුණුව ඇතුළු සෙසු පහසුකම් ලබාදීම සඳහා රාජ්‍ය අයවැය තුළ ප්‍රමුඛතාවයක් ලබාදීම.

5.2) සම්බුද්ධ ශාසනයේ පැවැත්ම සමස්ත දේශයේ පැවැත්ම සමග බැඳී ඇති බව මෙන් ම එය ජාතිකත්ව සහ ආගම් අතර සමගිය සහ සංහිඳියාව තහවුරු කිරීම සඳහා වන පූර්ව කොන්දේසියක් වශයෙන් සලකමින් සම්බුද්ධ ශාසනය සහ සභ්‍යත්ව උරුමය රැකීම රජයේ ප්‍රමුඛ වගකීමක් බව ව්‍යවස්ථාවේ 9 වැනි වගන්තියට අනුව පිළිගන්නා අතර ප්‍රායෝගික ව ඊට පහසුකම් සැලසීම සඳහා සම්බුද්ධ ශාසනය විස්තරාත්මක ව දැක්වීම, එය ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා දැනට පවතින නීතිවලට ඉහළින් බුද්ධසාසන පනත නමින් නව අග්‍ර නීතිමය රාමුවක් හඳුන්වාදීම. ඊට අමතර ව ඓතිහාසික සාධක සැලකිල්ලට ගනිමින් මහා සංඝරත්නයේ පැවැත්ම යනු සම්බුද්ධ ශාසනයේ පැවැත්ම සඳහා වන මූලික පූර්ව කොන්දේසියක් ලෙස සලකා පිරිවෙන් පද්ධතිය තුළ සහ විශ්වවිද්‍යාලයවල ඉගෙනුම ලබන භික්ෂූන් වහන්සේලාට සහ දස සිල් මාතාවන් ලෙස අදාළ ආයතනවල අධ්‍යාපනය ලබන සිල්මාතාවන්ට සියලු ම පුද්ගලික පිරිවැය දරාගත හැකි ආකාරයට ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා එම නීතිය යටතේ අරමුදලක් පිහිටුවීම. එසේ ම මහාභාරකරු යටතේ සම්බුද්ධ ශාසනයේ පැවැත්ම සඳහා වෙන් කොට ඇති දේපල සහ අරමුදල් විනිවිද භාවය සහිත ව යෙදවීම සඳහා අදාළ නිර්ණායක මෙම නීතිය මගින් පැනවීම.

5.3) ඓතිහාසික ව සඟසතු ව පැවති දේපළ ආරක්ෂා කිරීම සඳහා විශේෂයෙන් ම සඟසතු දේපළ අවභාවිත කෙරෙන බවට විහාරාධිපති හිමි, විහාරාධිකාරී හිමි, දායක සභාවේ සාමාජිකයකු හෝ අදාළ බල ප්‍රදේශයේ රටවැසියකු විසින් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කළ විට උසාවි කොමසාරිස්වරයකුගේ සාක්ෂි මත ලඝු නඩු විභාගයක් මගින් එම දේපළ අයිතිය හෝ ඊට අදාළ ප්‍රතිලාභ සඟසතු කිරීමට ප්‍රතිපාදන සැලසෙන ආකාරයට විහාර දේවාලගම් පනත සංශෝධනය කිරීම සහ භික්ෂු වේශධාරීන් හෝ භික්ෂු ප්‍රතිරූපකයන් විසින් භික්ෂුවට නොගැලපෙන ආකාරයට හැසිරීමේ දී කාරක සංඝ සභාවේ තීන්දුවකට අනුව ශාසනයෙන් නෙරපා හරින අවස්ථාවක තවදුරටත් වේශධාරියකු ලෙස කටයුතු කිරීමට නොහැකි වන ලෙස බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා මගින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවට ප්‍රතිපාදන එම පනතට ඇතුළු කිරීම.

5.4) දහම් කරුණු හෝ බෞද්ධ සාහිත්‍යය විකෘති කිරීම හෝ භික්ෂූන් වහන්සේලාට හෝ බෞද්ධ සංකේතවලට අගෞරව කෙරෙන ආකාරයට ප්‍රකාශ සිදු කිරීමට හෝ වෙනත් කුමන හෝ ආගමක ශාස්තෘවරයන් වහන්සේලාට හෝ ආගමික ඉගැන්වීම්වලට අපහාස කිරීම හෝ එම ඉගැන්වීම් විකෘති කිරීම මගින් කිරීම මගින් ප්‍රචණ්ඩත්වය වැපිරීමට ඇති ඉඩකඩ අහෝසි කිරීම සඳහා ආගමික ප්‍රකාශ නියාමන පනත නමින් නව නීතියක් හඳුන්වා දීම. ඊට අමතර ව සමාජ මාධ්‍ය ජාලා මගින් සමාජය මතවාදී සහ සංස්කෘතික වශයෙන් බිඳවැට්ටවීම සඳහා සිදු කෙරෙන ප්‍රචාරාත්මක අදහස් ඉදිරිපත් කරන සමාජ මාධ්‍ය ජාලාවල අදාළ අන්තර්ගතය සහ ඊට අදාළ ප්‍රවේශය පාලනය කිරීම සඳහා විදුලි සන්දේශ නියාමන පනත සංශෝධනය කිරීම.

5.5) මේ වන විට සකස් කර ඇති පුරාවිද්‍යා සංශෝධන පනත ජාතික උරුමයන් ආරක්ෂා කිරීමේ පනත ලෙස නැවත නම් කර ස්පර්ශීය මෙන් ම අස්පර්ශීය උරුමයන් සියල්ල ආරක්ෂා කිරීම සඳහා එම පනත මගින් ප්‍රතිපාදන සැලසීම සහ ඒ මගින් බෞද්ධ ඉතිහාසය විශේෂයෙන් ම ත්‍රිපිටකය සහ මහාවංසය වැනි ග්‍රන්ථ විකෘති කිරීම වැලැක්වීම සඳහා ප්‍රතිපාදන පැනවීම. එසේ ම පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීමෙන් පසු ව නිශ්චිත කාලයක් ඇතුළත ඒවා ගැසට් කිරීම සහ මූලික ප්‍රතිසංස්කරණ සඳහා ඊට අදාළ මූල්‍යමය ප්‍රතිපාදන මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ලබාගැනීම සඳහා නීතිමය ප්‍රතිපාදන සැලසීම මෙන් ම ඊට අමතර ව ශ්‍රී ලංකාවට ආවේණික විශේෂ පරිසර පද්ධති සහ වාරි පද්ධති ද ජාතික උරුමයන් ලෙස නම් කිරීම සඳහා පනත යටතේ ප්‍රතිපාදන සැලසීම. ඊට අමතර ව ජාතික උරුමයන් සුරැකීමට අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රී සංසදයේ වාර්තාව නිශ්චිත කාල වකවානුවක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර් ආයතන කාර්යසාධක බලඇණියක් පත් කිරීම.

5.6) ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායානුකූල දැනුම් පද්ධතිය, විශේෂයෙන් ම දේශීය වෛද්‍ය ක්‍රමය මෙන් ම සංස්කෘතික සහ පාරිසරික උරුමයන් 'අලෙවි කිරීම' මුල් කරගෙන සංචාරක කර්මාන්තය උපායමාර්ගික ව නැවත ස්ථානගත කිරීම සහ සංචාරක ප්‍රවර්ධනයට අදාළ රාජ්‍ය ආයතන ත්‍රිත්වය මෙන් ම අදාළ අරමුදල් වැය කිරීමේ ප්‍රමුඛතාව එම උපාය මාර්ගයට අනුව ස්ථානගත කිරීම එම ක්‍රියාවලිය තුළ කුඩා පරිමාණ සේවා සපයන්නන් දිරිමත් කිරීම සඳහා සහන සැකේජයක් හඳුන්වා දීම සහ සේවා සපයන්නන් මධ්‍යගත ව සම්බන්ධීකරණය කිරීම, ගුණාත්මක තත්ත්වය සහතික කිරීම සහ ප්‍රචාරය කිරීම සඳහා ප්‍රතිතරණය කරනු ලබන ආයතන දිරිමත් කිරීම සඳහා ප්‍රතිතරණ ක්‍රියාවලියක් හඳුන්වාදීම සමග එම සම්බන්ධීකරණ ආයතන දිරි ගැන්වීම සඳහා ද අදාළ දිරිගැන්වීම් යෙදවීම. එසේ ම සභ්‍යත්ව උරුමය මුල් කරගත් සංචාරක ව්‍යාපාරය

දේශීය සංචාරකයන් අතර ප්‍රචලිත කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශය මගින් රට පුරා විසිරී පවතින සියලු ම ඓතිහාසික පුරාවෘත්ත සහිත සිද්ධස්ථාන ආවරණය වන ලෙස වන්දනා ගමන් සිතියමක් සකස් කිරීම සහ ඊට අදාළ ප්‍රවාහන සහ වෙනත් සේවා සපයන පුද්ගලික ආයතන ලියාපදිංචි කිරීම සහ නියාමනය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම. ඊට අමතර ව පාරිසරික උරුමයන් මුල් කරගත් සංචාරක කර්මාන්තය ප්‍රචලිත කිරීම සඳහා පාරිසරික වශයෙන් සහ භූගෝලීය වශයෙන් වැදගත් පරිසර පද්ධති සහ ස්ථාන සිතියම්ගත කිරීම සහ එම ස්ථාන ජාතික උරුමයන් ලෙස නම් කිරීම.

5.7) නිදහස් අධ්‍යාපනය ඓතිහාසික සභ්‍යත්ව උරුමයක් ලෙස සලකා ඊට අදාළ මූලධර්ම ආරක්ෂා වන ආකාරයට පමණක් පුද්ගලික ආයතනවලට අවසර දීම සහ එම ආයතන සියල්ල නියාමනය කිරීම සඳහා යාන්ත්‍රණ හඳුන්වා දීම මෙන් ම ඊට අදාළ ව ව්‍යවස්ථාමය සහ නීතමය ප්‍රතිපාදන පැනවීම. ඒ අනුව 1961 අංක 8 දරන අධ්‍යාපන පනත සංශෝධනය කිරීම මගින් සියලු ම පුද්ගලික අධ්‍යාපන ආයතන සහ ජාත්‍යන්තර පාසල් රජයේ පොදු නියාමනයට යටත් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම සහ ඊට අදාළ ව විශේෂිත යාන්ත්‍රණයක් හඳුන්වාදීම. ඊට අමතර ව විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම මගින් පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන සියල්ල විධිමත් ව නියාමනය කිරීම, විශේෂයෙන් ම ගාස්තු පිළිබඳ නියාමනය, විෂයමාලා සහ ගුණාත්මක තත්ත්වයට අදාළ ව නියාමන සඳහා නිර්ණායක හඳුන්වාදීම.

5.8) ඓතිහාසික සභ්‍යත්ව උරුමය අනුව ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය නැවත ස්ථාපිත කිරීම සඳහා ගුරුවරුන්ගේ ගුණාත්මක තත්ත්වය සහ ආචාර ධර්ම ආවරණය වන ලෙස ලියාපදිංචි කිරීම සහ ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම සඳහා ගුරු සභාව නමින් නව නීතිමය රාමුවක් හඳුන්වාදීම. ඒ මගින් ශ්‍රී ලංකාව නම් වූ සභ්‍යත්ව රාජ්‍යයරැකීම සඳහා වන මහා භූමිකාව ගෞරවණීය ලෙස ඉටු කිරීමේ වගකීම ගුරුවෘත්තිකයන්ට පැවරීම සහ ඊට අදාළ පහසුකම් ලබාදීම. එසේ ම සෑම ගුරුවරයකුට ම අධ්‍යාපනයට අදාළ ව විශේෂඥතාව ලබාගැනීම සඳහා උපාධියක් සහ පශ්චාද් උපාධියක් සම්පූර්ණ කළ හැකි ආකාරයට විද්‍යාපීඨ, ගුරු පුහුණු ආයතන සහ ජාතික අධ්‍යාපන ආයතනය සතු සම්පත් වර්ධනය කිරීම සඳහා ජාතික වැදගත්කමක් සහිත ව්‍යාපෘතියක් ලෙස ප්‍රමුඛතාවෙන් යුතු ව ජාතික අයවැය මගින් මූල්‍ය පහසුකම් ලබාදීම.

5.9) නිදහස් සෞඛ්‍ය සේවය සහ සියලු ම සුභසාධන වැඩසටහන් ඓතිහාසික සභ්‍යත්ව උරුමයක් සේ සලකා ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සැලසීම. ඊට අනුව දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා පාරම්පරික වෛද්‍යවරුන්ට පුහුණුව සහ ගෞරවය ලැබෙන ආකාරයට සහ එම සේවා පුළුල් කිරීම සඳහා පවතින බාධක ඉවත් කිරීම සඳහා අදාළ නීති සංශෝධනය කිරීම. ඊට සමගාමී ව සමස්ත ආයුර්වේද වෛද්‍ය සේවා ප්‍රචලිත කිරීම සඳහා අධ්‍යාපන අවස්ථා විශේෂයෙන් ම පශ්චාද් උපාධි අවස්ථා වර්ධනය කිරීම මෙන් ම තෝරාගත් ආයුර්වේද රෝහල් ආශ්‍රිත ව තෝරාගත් රෝග සඳහා විශේෂිත ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීම. ඊට අමතර ව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සහ දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය යොදා- ගනිමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ දී වෛද්‍ය ක්‍රමය අගෞරවයට ලක්වීම වැළැක්වීම සඳහා සම්බාහන ලෙස හැඳින්වෙන පංචකර්ම ප්‍රතිකාර මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සහ වෛද්‍යවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ පමණක් පවත්වාගෙන යාම සඳහා නීතිමය ප්‍රතිපාදන සැලසීම. එම ක්‍රියාවලිය තුළ සංශෝධිත ආයුර්වේද පනත නැවත සංශෝධනය කර වෛද්‍ය අධීක්ෂණයෙන් තොර ව සේවා සපයන ශිල්පීන් මගින් ගැහැණු සහ පිරිමි ගණිකා වෘත්තීය ප්‍රචලිත කිරීමේ අනතුර වැළැක්වීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

5.10) පරිසරය පද්ධති සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම සහ ප්‍රශස්ත භාවිතය, එනම් පරිසර හිතවාදී ජීවන රටාව මෙන් ම සොබාදහම මත පදනම් වූ ආහාර විවිධත්වය සහිත ආහාර සංස්කෘතිය ආරක්ෂා කිරීම සහ ප්‍රචලිත කිරීම සහ ශ්‍රී ලංකාවේ උරුමයන් ලෙස සැලකෙන ශ්‍රී ලංකාවට ආවේණික නිෂ්පාදන ආරක්ෂා කිරීම ආදි වශයෙන් සභ්‍යත්ව උරුමය ආරක්ෂා කිරීමට අදාළ මහා පින්තූරය සම්පූර්ණ කිරීම සඳහා පළමු ව අප රටේ ඓතිහාසික ව පැවති පරිසර හිතවාදී සහ මහජන සෞඛ්‍යයට හිතවාදී පරිභෝජන රටාව ප්‍රතිනිර්මාණය කිරීම සඳහා දේශීය ආහාර සහ ආහාර විවිධත්වය ප්‍රචලිත කිරීම මුල් කරගෙන ජාතික ආහාර ප්‍රතිපත්තියක් පාර්ලිමේන්තුව මගින් සම්මත කිරීම සහ පාසල්, ආරක්ෂක හමුදා සහ රාජ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක කිරීම. දෙවනු ව අප රට සතු ව ඓතිහාසික ව පැවති මහා ජෛව විවිධත්වය සහ ආහාර විවිධත්වය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා 800කට අධික ඌණ පරිභෝජන සහ වඳ වී යන ශාක ප්‍රභේදවල රෝපණ ද්‍රව්‍ය සොයාගැනීම සහ ප්‍රචලිත කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ගොවිපළ යොදාගනිමින් ජාතික වැඩ සටහනක් දියත් කිරීම සහ එම වැඩ සටහන බිම් මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන් යොදාගනිමින් ගෙවතු, පාසල් සහ පන්සල් ආශ්‍රිත ව දියත් කෙරෙන ගෙවතු වගා වැඩ සටහන් සමග ඒකාබද්ධ කිරීම මෙන් ම ඊට අදාළ අධ්‍යාපනය පාසල් විෂය මාලාවට ඇතුළු කිරීම සහ ඊට අදාළ ව ජාතික මට්ටමින් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම.

5.11) බලශක්ති සුරක්ෂිතතාවට අදාළ ව ඓතිහාසික සභ්‍යත්ව උරුමය මුල් කරගත් රට වැසියාගේ මූලිකත්වය හෙවත් දායකත්වය ඉහළ නැංවීම සඳහා පුද්ගලික බලශක්ති පරිභෝජනය අවම කිරීම (ඛනිජ තෙල් සහ විදුලිය) සඳහා තම ජීවිත වෙනස් කරගැනීම උසස් ජීවන රටාවක් බවට සමාජ මතයක් ගොඩනැගීම සඳහා ජාතික මට්ටමින් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම සහ ඒ තුළ පුද්ගලයකුගේ දෛනික බලශක්ති පරිභෝජනය මැනීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා නිර්ණායක හඳුන්වාදීම සහ පොදු ප්‍රවාහනය භාවිතය දිරිමත් කිරීම. ඊට අමතර ව බලශක්ති පරිභෝජනය අවම කෙරෙන භාණ්ඩ, උපකරණ, උපාංග සහ වාහන භාවිතය දිරි ගැන්වෙන ආකාරයට අදාළ පරිභෝජන භාණ්ඩ හඳුනාගැනීම සඳහා බලශක්ති කාර්යක්ෂමතාවට අනුව සංකේත ක්‍රමයක් හඳුන්වාදීම සහ ඊට අනුව වෙළඳපොළ මිල තීරණය වන ආකාරයට නව බදු ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.

5.12) ජාතික ආර්ථික සංවර්ධන බලකාය යොදාගනිමින් සහ අදාළ රාජ්‍ය ආයතනවල දායකත්වය, ස්වෙච්ඡා සංවිධාන මෙන් ම ප්‍රදේශයේ පොදු ජනතාවගේ සහභාගිත්වය ලබාගත හැකි ආකාරයට, යුද්ධය නිසා ආර්ථික සහ සමාජීය පසුගාමීත්වට ලක් වූ උතුරු සහ නැගෙනහිර පළාත් මෙන් ම ඒ ආශ්‍රිත ව ඊට අදාළ ව හඳුනාගන්නා සෙසු ප්‍රදේශවල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම සහ රාජ්‍ය සේවා පුළුල් කිරීම සඳහා ජාතික සංවර්ධන සහ පුනරුත්ථාපන අධිකාරියක් පිහිටුවීමට අදාළ ව වසර 5ක කාලයකින් එම කාර්යය නිම කිරීම සඳහා නීතිමය ආවරණය සැලසීම මුල් කරගෙන නව නීතිමය රාමුවක් හඳුන්වාදීම.

ඇමුණුම් 01

ගෞරවණීය මහා සංඝරත්නය වෙත පැවරී ඇති ඓතිහාසික භූමිකාව අනුව, රජු හෙවත් ආණ්ඩුව සහ මහජනතාව වෙත සානුකම්පිත ව ඉදිරිපත් කරනු ලබන, මහානුශාසනාව යි....

## ආර්ථික සහ දේශපාලන අර්බුදයේ පසුබිම හෙවත් සිදු වූ දේ, සිදු වෙමින් පවතින දේ සහ එහි තර්කානුකූල ප්‍රතිඵලය මෙන් ම, නොකළ යුතු දේ සහ කළ යුතු දේ පිළිබඳ ව මහා සංඝරත්නයේ විග්‍රහය සහ නිර්දේශ මෙසේ ඉදිරිපත් කරන වග යි...

### සිදු වූ දේ හෙවත් පූර්විකාව

1. මහාචාර්ය Dov Levin විසින් වර්ගීකරණයෙන් ඉවත් කළ ඇමෙරිකානු රාජ්‍ය ලේඛන ඇසුරින් සිදු කළ පර්යේෂණ වාර්තාවක් වන Meddlin in the Ballot BOX නම් වූ කෘතිය මගින් හෙළිදරව් කරන්නේ 1956 සිට 2000 දක්වා ශ්‍රී ලංකාවේ පැවැත්වූ මැතිවරණ 4 කදී එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවීම සඳහා CIA සංවිධානය මගින් මුදල් වැය කළ බව ය. එසේ ම ඇමෙරිකාවේ හිටපු රාජ්‍ය ලේකම් කොන්ග්‍රස් මණ්ඩලයට ඉදිරිපත් කළ වාර්තාවක් මගින් 2014 දී ලංකාවේ, නයිජීරියාවේ සහ බුරුමයේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම හෙවත් ආණ්ඩු වෙනස් කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 585 ක් වැය කර ඇත. ඒ අතර මේ වන විට ගෝල්ෆේස් අරගලය මගින් ගෝඨාභය රාජපක්ෂ පාලනය පෙරළා දැමීම සඳහා ඇමෙරිකානු තානාපතිනියගේ මැදිහත් වීම මෙන් ම USAID සහ NED වැනි සංවිධානවල මැදිහත් වීම පිළිබඳ ව බොහෝ සාක්ෂි ඉදිරිපත් වී ඇත.

2. ඊට අමතර ව යුද්ධයෙන් පසු ව ශ්‍රී ලංකාව පිළිබඳ ව අනුගමනය කළ යුතු උපායමාර්ගික ප්‍රවේශය (Recharting Strategy Towards Sri lanka After the War) නමැති කොංග්‍රස් මණ්ඩලයට ඉදිරිපත් කළ පර්යේෂණ වාර්තාව සහ කොළඹ ඇමෙරිකානු තානාපති කාර්යාලයේ භූමිකාව (Mission Statement) ආදි ලේඛන මගින් ශ්‍රී ලංකාවේ භූ දේශපාලන වැදගත්කම සහ ශ්‍රී ලංකාව ඇමරිකානු ඉන්දු පැසිෆික් න්‍යාය පත්‍රයේ පාර්ශ්වකරුවකු බවට පත් කරගැනීමේ අවශ්‍යතාව අවධාරණ කර ඇත.

3. නමුත් ගෝඨාභය රාජපක්ෂ පාලනය මගින්, විශේෂයෙන් ම ඔහු බලයට පත් කළ බහුතර සිංහල බෞද්ධ බලවේගය සහ ඔහු සමග හඳුනාගන්නා ආරක්ෂක හමුදා ශ්‍රද්ධාතීත්වය නිසා ඇමරිකානු අරමුණු සාර්ථක කරගැනීම පහසු නැත. විශේෂයෙන් ම බෙදුම්වාදී බලවේග සහ ඉස්ලාම් අන්තවාදී බලවේගවලට එරෙහි ව ඔහු විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග නිසා (ඔහු ඉස්ලාම් අන්තවාදය ශ්‍රී ලංකාවේ භූමිය තුළ තීරණාත්මක ව පරාජය කිරීම සඳහා යෝජනා 57ක් ඇතුළත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබී ය. ඔහුට එරෙහි ව ගොඩනැගුණු විරෝධය බලවත් වූ බවට සමාජය තුළ මතයක් ඇත. ගෝල්ෆේස් අරගලය තුළ බෙදුම්වාදී සහ ඉස්ලාම් අන්තවාදී බලවේගවල සුවිශේෂී නියෝජනය තුළින් එම තත්ත්වය පිළිබිඹු වූ බව පැහැදිලි කරුණකි.)

4. ඒ අනුව අධිරාජ්‍යවාදී බලවේගවලට නිදහසින් පසු ව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ විශේෂයෙන් ම 1977 දී ආරම්භ කර 2002 දී නැවත පණ දුන් ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා වත්මන් අර්බුදය තුළින් අවස්ථාව නිර්මාණය වූ බව සහ ඒ තුළින් වර්තමාන ජනාධිපතිවරයා පුටුවේ වාඩි කිරීමට හැකි වූ බව ඉතා සාධාරණ ව පිළිගත හැකි ය. එතුමා එක සිතින් අවංක ව නිවැරදි යැයි කල්පනා කරමින් ඉන්දු - අමෙරිකානු උපාය මාර්ගික න්‍යාය පත්‍රය පිළිගන්නා පුද්ගලයකු බව පැහැදිලි කරුණකි. එතුමාට ඒ සඳහා 2014 දී ඇමරිකාවේ දී පුහුණුව ලබා දුන් බව එතුමා විසින් ම පිළිගෙන ඇත.

5. දීර්ඝ කාලයක් පැවති එහෙත් කෙටිකාලීන ව උත්සන්න වූ ආර්ථික අර්බුදය යොදාගනිමින් සහ දීර්ඝ කාලයක් පුරා අප රටේ දේශපාලන තන්ත්‍රය මෙන් ම දේශපාලන නායකයන්ට එරෙහි ව සමාජයේ පැවති විරෝධය ඉතා සූක්ෂ්ම ලෙස යොදාගනිමින් ඡන්දයෙන් පත් වූ ජනාධිපතිවරයා පලවා හැර අවසන් මැතිවරණයේ දී මහජනතාව විසින් සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කළ දේශපාලන නායකයකු ජනාධිපති පුටුවේ වාඩි කළ බව දැන් ඉතා පැහැදිලි ය. ''සිස්ටම් චේන්ජ්'' හෙවත් ක්‍රමයේ වෙනසක් ප්‍රාර්ථනා කළ අවංක ව ආණ්ඩු විරෝධී ක්‍රියාමාර්ගවල නියුක්ත වූ තරුණ පිරිස්වලට ලැබුණේ ආණ්ඩු වෙනසක් හෙවත් පාලකයාගේ වෙනස්කමක් පමණි.

**සිදු වෙමින් පවතින දේ හෙවත් අර්බුදය තව දුරටත් උත්සන්න කෙරෙන ආකාරයඃ**

1. දැන් නව පාලකයා පැරණි ක්‍රමය හෙවත් දූෂිත සහ පරාධීන ආර්ථික මොඩලය ඒ ආකාරයෙන් ම පවත්වාගෙන යන අතර මහජනයා විසින් ඉල්ලා නොසිටි නව ක්‍රියාමාර්ග හෙවත් න්‍යාය පත්‍ර 5ක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. දැන් ඊට එරෙහි ව විරෝධතා දක්නට නොමැති අතර විශ්වවිද්‍යාලය සිසුන් ඇතුළු විවිධ බලවේග විසින් දියත් කරනු ලබන විරෝධතාවලට පොලිස් ප්‍රහාරය එල්ල වන ආකාරය දැක ගත හැකි ය. එහෙත් ගෝල්ෆේස් අරගල සමයේ දී විරෝධතා පැවැත්වීම සඳහා මහජනයා සතු අයිතිය වෙනුවෙන් පෙනී සිටි අමෙරිකානු තානාපතිවරිය දැන් නිහඬ වතක් අනුගමනය කරනු දැක ගත හැකි ය.

2. ඊට අමතර ව උද්ඝෝෂණ පමණක් නොව සියලු ආකාරයේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතීන් සහ මාධ්‍ය නිදහස පවා අහිමි කරන ත්‍රස්ත විරෝධී පනත නමින් දැඩි මර්දනකාරී පනතක් සහ සමාජ මාධ්‍ය පාලනය කිරීම සඳහා තවත් පනතක් ආණ්ඩුව විසින් ඉදිරිපත් කිරීමේ දී ද තානාපතිනිය එතෙක් පෙනී සිටි අයිතිවාසිකම් පිළිබඳ කතා කරන්නේ නැත. ඒ අනුව ඇය ආණ්ඩු වෙනසක් සඳහා වූ විරෝධතාවලට එරෙහි ව කටයුතු කිරීම වැලැක්වීම සඳහා පමණක්, එදා පැවැති ආණ්ඩුවට මානසික බාධක පැනවීම සඳහා පමණක් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වෙනුවෙන් කිඹුල් කඳුලු හෙලූ බව දැන් පැහැදිලි වේ.

3. ඒ අනුව වත්මන් ජනාධිපතිවරයා අතට ඔහු ව බලයට පත් කිරීම සඳහා මැදිහත් වූ බලවේග විසින් ලබා දී ඇති ඉහත සඳහන් කළ න්‍යාය පත්‍ර මෙසේ හඳුනාගත හැකි ය.

**පළමු න්‍යාය පත්‍රයඃ**

**අවස්ථා 16ක් ණය උපාංග භාවිත කරමින් ඉටු කළ යුතු බවට පසුගිය සෑම රජයකට ම බලපෑම් එල්ල වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ න්‍යාය පත්‍රය හෙවත් විකිණීමේ න්‍යාය පත්‍රයඃ** ඒ සඳහා ආණ්ඩුවට බලපෑම් එල්ල කරනු ලබන්නේ පවතින විදේශ විනිමය අර්බුදය යොදාගනිමින් වසර 3ක දී කොටස් 6කින් ලබාදෙන ඇමෙරිකන් ඩොලර් බිලියන 3ක් වැනි සුළු ණය මුදලක් අත ඇඹරීමේ ලීවරයක් ලෙස යොදාගනිමිනි. එය සුළු ණය මුදලක් ලෙස අර්ථ දැක්වීමට සිදු වන්නේ ණය ආපසු ගෙවීම පිළිබඳ කිසිදු සහතිකයක් නොමැති යුක්‍රේනයට අප රටට ලබාදුන් ණය මුදල මෙන් පස් ගුණයකින් වැඩි ණය මුදලක් හෙවත් ඩොලර් බිලියන 15ක් කිසිදු කොන්දේසියක් නොමැති ව ලබාදීම නිසා ය. ඊට අමතර ව ශ්‍රී ලංකාවේ රජය මෙම වසර අවසානයේ දී ගෙවීමට ඉතිරි වී ඇති ණය ප්‍රමාණය බිලියන 8කි. එනම් වසර 3ක දී ලැබෙන ප්‍රමාණය මෙන් දෙගුණයකට වැඩි ප්‍රමාණයකි. මෙම ණය සමග ගැටගැසී ඇති මූලික කොන්දේසි කිහිපයක් මෙසේ දැක්විය හැක.

I. මහ බැංකුව ස්වාධීන කිරීමේ නාමයෙන් සමස්ත රටේ ආර්ථිකය කළමනාකරණය කිරීමේ බලය මහජන පරමාධිපත්‍යයට එරෙහි ව සම්පූර්ණයෙන් ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පැවරීම සඳහා නව මහ බැංකු පනත හඳුන්වා දීම.

II. රාජ්‍ය බැංකු පද්ධතිය විදේශීය බැංකු විසින් අත්පත් කරගත හැකි ආකාරයට රාජ්‍ය බැංකු පෞද්ගලීකරණය කිරීම සඳහා නීති පැනවීම.

III. පාඩු ලබන ආයතන විකිණීමේ මුවාවෙන් ලාභ ලබන සහ රටේ ජාතික ආරක්ෂාවට පවා බලපෑම් එල්ල වන ආකාරයට ටෙලිකොම් ආයතනය සහ ගුවන් තොටුපල ආදි උපාය මාර්ගික වශයෙන් වැදගත් ආයතන විදේශිකයන්ට විකුණා දැමීම. එහි දී ආයතන විකිණීම සහ රජයට අයත් ඉඩම් මහා පරිමාණයෙන් විකිණීම ද එක විට සිදු වනු ඇත.

IV. මහජනයා මත බදු බර පැටවීම සහ ඉන්ධන සැපයුම, විදුලිබල සැපයුම ප්‍රවාහන සේවා ආදියට ලබාදෙන රාජ්‍ය සහනාධාර අහෝසි කර මහජනයාට දැරිය නොහැකි ආකාරයට ගාස්තු වැඩි කිරීම සහ එම සේවා ක්‍රමයෙන් පුද්ගලීකරණයට නතු කිරීම.

V. සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය ඉතා සුක්ෂ්ම ව ක්‍රමයෙන් පුද්ගලිකකරණය කිරීම මෙන් ම සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපන වෙළඳපොළක් නිර්මාණය කිරීම.

VI. ජල සම්පත් කළමනාකරණය කිරීමේ නාමයෙන් මහජනයාගේ ජල අයිතිය අහිමි කිරීම සහ ජල සම්පත් පුද්ගලික අංශයට විකිණීම සඳහා ප්‍රතිපත්තියක් සහ නව නීතිමය රාමුවක් හඳුන්වාදීම.

**දෙවැනි න්‍යාය පත්‍රයඃ**

**ඉන්දියාවේ පනික්කාර් න්‍යාය පත්‍රය හෙවත් 1932 දී සර්ධාර් පනික්කාර් විසින් ඉදිරිපත් කළ මහාභාරත් න්‍යායට අනුව ශ්‍රී ලංකාව ඉන්දියාවේ අර්ධ යටත් විජිතයක් බවට පත් කිරීමඃ** (එම න්‍යායට අනුව ඉන්දියානු මහද්වීපය ආශ්‍රිත කුඩා රාජ්‍යයන්, ආරක්ෂක, ආයෝජන, ආර්ථික සහ වෙළෙඳ ආදි ගිවිසුම් මගින් ඉන්දියාවේ අර්ධ යටත් විජිතයක් බවට පත් කළ යුතු ය. එනම් එම රටවල්වල ආර්ථිකය ඉන්දියාවේ ආර්ථිකය සමග ඒකාබද්ධ කළ යුතු ය) ඒ බව ඉන්දියාවේ ශ්‍රී ලංකා තානාපති මිලින්ද මොරගොඩ මහතා විසින් ද පැහැදිලි කර ඇත. දැනටමත් එසේ ආර්ථිකය ඒකාබද්ධකරණයට හෙවත් ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත් කරන ක්‍රියාවලිය ආරම්භ වී ඇති බව ඉතා පැහැදිලි ය. එම ක්‍රියාවලියේ අංග 6ක් පවතින අතර 2023 ජූලි මාසයේ දී ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සහ ඉන්දියාවේ අගමැතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශය අනුව ඒවා මෙසේ දැක්විය හැකි ය.

I. **මුදල් ඒකකය ඒකාබද්ධ කිරීම**: (Currency Merger) දැනටමත් මුල් වටයේ දී ශ්‍රී ලංකාවේ වෙළඳපොල තුළ ඉන්දියානුවන් විසින් ඉන්දියානු රුපියල භාවිත කිරීමට අවසර ලබා දී ඇත. ඒ සඳහා නව මහ බැංකු පනත යටතේ ප්‍රතිපාදන සලසා ඇත. ඒ මගින් අවසානයේ දී ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා රුපියලට අමතර ව ඉන්දියානු රුපියල භාවිත කිරීමට අවසර ලැබෙනු ඇත.

II. **රේගු ඒකාබද්ධකරණය**: (Custom Merger) එනම් ඉන්දියාවේ රේගුව සහ ශ්‍රී ලංකාවේ රේගුව ඒකාබද්ධකරණය මගින් පොදු රේගු බදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ය. ඒ මගින් ඉන්දියානු සේවා සහ භාණ්ඩවලට බදු සහන යටතේ ශ්‍රී ලංකාවට ඇතුළු වීමේ හැකියාව ලැබෙන අතර අවසානයේ දී ඒ මගින් දේශීය කර්මාන්ත සහ සේවා පද්ධතිය බිඳ වැටීමට ලක් වේ. (එවිට රුපියල අවප්‍රමාණය වී ඇති තත්ත්වයක් යටතේ බිඳ වැටෙන ආයතන අඩු මිලට මිල දී ගැනීමේ හැකියාව ඉන්දියානුවන්ට ලැබේ. ඒ සඳහා එට්කා ගිවිසුම මගින් පහසුකම් සැලසෙනු ඇත.)

III. **රාජ්‍යයේ සමස්ත මූල්‍ය සහ බදු පද්ධතිය ඒකාබද්ධ කිරීම**: (Fiscal Merger) එට්කා ආදි ගිවිසුම් අත්සන් කිරීම මගින් එම තත්ත්වය නිර්මාණය වන අතර ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ආයෝජන සහ සේවා වෙළඳාම සඳහා ඉදිරිපත් වන ඉන්දියානු රටවැසියකු සහ ශ්‍රී ලංකාවේ රට වැසියකු සම තත්ත්වයට පත් වේ. (''එට්කා'' (ETCA) වැනි ආයෝජන ගිවිසුම් අත්සන් කිරීම සමග ඉන්දියානුවන්ට නිදහසේ ශ්‍රී ලංකාවට පැමිණ රැකියා කිරීමට දේපළ මිල දී ගැනීමට සහ ව්‍යාපාර කිරීමට අවස්ථාව ලැබේ.)

IV. **බලශක්ති පද්ධති ඒකාබද්ධ කිරීම**: (Energy System Merger) ඒ අනුව ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතිය ඉන්දියාවේ විදුලි පද්ධතිය සමගග ඒකාබද්ධ කෙරෙනු ඇත. (ඒ සඳහා සම්මත කිරීමට නියමිත නව විදුලි පනත මගින් ප්‍රතිපාදන සලසා ඇත.) ඒ අතර ඉන්දියාවේ අදානි සමාගමට පුනරීන් සහ සම්පූර් මහා පරිමාණ සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘති 2ක් ටෙන්ඩර් කැඳවීමකින් තොර ව ලබාදීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව එකගග වී ඇත. ඊට අමතර ව ශ්‍රී ලංකාවේ ඉන්දියානු තානාපතිවරයාට අනුව ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ඛණිජ තෙල් නලයක් මුහුද යටින් එලීම සඳහා ගත වන්නේ මාස 2කකට අඩු කාලයකි.

V. **වරාය සහ ගුවන් තොටුපල ඒකාබද්ධකරණය:** (Logistic Merger) ඒ අනුව ශ්‍රී ලංකාවේ වරායවල්වල සහ ගුවන්තොටුපළවල මෙහෙයුම් සිදු කිරීමේ ඒකාධිකාරිය ඉන්දියාවේ ආධිපත්‍යයට නතුවනු ඇත. දැනටමත් කන්කසන්තුරේ වරාය, කොළඹ වරායේ බටහිර ජැටිය සහ ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පද්ධතිය ආශ්‍රිත ව ඉන්දියාව විසින් තම ආධිපත්‍යය තහවුරු කරගෙන ඇත. ඉදිරියේ දී මත්තල ගුවන්තොටුපළ සහ ශ්‍රී ලංකන් ගුවන් සේවාව අත්පත් කරගැනීම සඳහා ඉන්දියානු සමාගම් ඉදිරිපත් වන බව වාර්තා වී ඇත. ඊට අමතර ව හරීන් ප්‍රනාන්දු වැනි අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ අනුව කටුනායක සහ රත්මලාන ගුවන්තොටුපළවල කළමනාකාරිත්වය ද ඉන්දියානු සමාගම් විසින් අත්පත් කරගනු ඇත.

VI. **භූගෝලීය ඒකාබද්ධකරණය**: (Geographical Merger) ඊට අදාල ව ඉන්දියාවේ දනුෂ්කොඩි සහ ශ්‍රී ලංකාවේ තලෙයිමන්නාරම අතර කිලෝමීටර් 23ක පාලමක් ඉදි කිරීමට නියමිත අතර ත්‍රිකුණාමලය දක්වා කිලෝමීටර් 126ක දුම්රිය මාර්ගයක් ද ඉදි කිරීමට නියමිත බව ඉන්දියානු මූලාශ්‍රය විසින් හෙළිදරව් කර ඇත.

**මෙම ක්‍රියාවලියට අදාළ ව ශ්‍රී ලංකාවට බලපෑම් කිරීම මුල් කරගෙන ඊට අවස්ථාව නිර්මාණය කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ රුපියල නිදහසේ පා කිරීමේ තීන්දුව ගැනීමට මෙන් ම ශ්‍රී ලංකාවේ බංකොළොත් භාවය ප්‍රකාශයට පත් කිරීමට ඉන්දියාව විසින් බලපෑම් එල්ල කළ බව දැන් හෙළිදරව් වී ඇත. ඒ මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය තවදුරටත් අර්බුදයට ලක් වූ අතර ඉන්දියාවේ ණය ආධාර මත යැපෙන පරාධීන තත්ත්වයක් ඇති විය.**

**තුන්වැනි න්‍යාය පත්‍රය:**

**ඇමරිකාව විසින් මෙහෙයවනු ලබන ඉන්දු - පැසිෆික් න්‍යාය පත්‍රය**: ඊට අනුව ශ්‍රී ලංකාව එම න්‍යායේ පාර්ශවකරුවකු බවට පත් කරගත යුතු වේ. එහි අවසාන ප්‍රතිඵලය ශ්‍රී ලංකාව යනු ඉන්දු පැසිෆික් කලාපයේ ප්‍රධානතම යුධ සැපයුම් මධ්‍යස්ථානය හෙවත් ඇමරිකාවේ දාස රාජ්‍යයක් බවට පත් කරගැනීම ය. එම ක්‍රියාවලිය සඳහා ඉන්දියාවේ ආශීර්වාදය ලැබෙන බව පසුගිය දා ඇමරිකාවේ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් වික්ටෝරියා නුලන්ඩ් සහ ඉන්දියාවේ විදේශ අමාත්‍යවරයා අතර පැවති සාකච්ඡාවේ දී එළිදරව් විය. එහි දී ත්‍රිකුණාමලයේ ඉන්දු-ඇමෙරිකානු ඒකාබද්ධ යුද සැපයුම් මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු බවට සාකච්ඡා කෙරුණු බව වාර්තා විය.

I. ඊට අදාළ ව මේ වන විට ACSA ගිවිසුම අත්සන් කර ඇති අතර SOFA ගිවිසුමට අදාළ ව ඇමුණුම 'බී' සඳහා එකගතාව ලබාදීම සහ එම්.සී.සී. ගිවිසුම අත්සන් කිරීම සඳහා බලපෑම් එල්ල වන බව ඉතා පැහැදිලි ය. මෑතක දී ශ්‍රී ලංකාවට පැමිණි බලවත් හමුදා නායකයන් කණ්ඩායම සමග ඇති කරගත් එකගතාවන් අනුව ශ්‍රී ලංකාවේ ඔත්තු සේවා තොරතුරු පද්ධතියට ඇතුළත් වීම, ජාත්‍යන්තර කේබල් සහ චන්ද්‍රිකා සන්නිවේදන පද්ධතියට ඇතුළු වීම සහ ආගමන විගමන දත්ත පද්ධතියට ඇතුළු වීම ආදියට දැනටමත් ආණ්ඩුව එකග වී ඇති බව පැහැදිලි ය.

II. SOFA ගිවිසුමේ ඇමුණුමට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් එකගගතාව ලබා දුනහොත් මිලියන 3කට අධික ඇමෙරිකානු හමුදාවල නිලධාරීන්ට සහ එම හමුදාවලට සේවා සපයන

කොන්ත්‍රාත්කරුවන්ට පූර්ව අවසර ගැනීමකින් තොර ව ඕනෑම තොටුපළකින් ශ්‍රී ලංකාවට ඇතුළු විය හැකි ය. ඔවුන්ට ආයුධ සන්නද්ධ ව හෝ එසේ නොමැති ව, නිල ඇඳුමින් හෝ සාමාන්‍ය ඇඳුමින් ශ්‍රී ලංකාව තුළ මුහුදින්, ගොඩබිමින් හෝ ගුවනින් ගමන් කළ හැකි ය. ඔවුන්ගේ ගමන් මලු හෝ වාහන පරීක්ෂා කළ නොහැකි අතර ඔවුන් රටේ යම් නීතියක් කඩකළහොත් පොලිසිය මගින් ක්‍රියාමාර්ග නොගත යුතු අතර අදාළ පැමිණිල්ල ඇමෙරිකානු තානාපති කාර්යාලයට ඉදිරිපත් කළ යුතු ය. එසේ ම එම ඇමෙරිකානු නිලධාරීන්ට ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක කඳවුරු බැඳීමේ අවසරය ද ඇත.

**හතරවැනි න්‍යාය පත්‍රයඃ**

**බෙදුම්වාදි න්‍යාය පත්‍රය**: ඊට අදාළ ව ටී.එන්.ඒ පක්ෂය සහ ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සලය හරහා සහ රාජ්‍ය නොවන සංවිධාන ජාලය මගින් එල්ල වන පීඩනයට ආණ්ඩුව යටත් වන බව ඉතා පැහැදිලි ව දැකගත හැකි ය.

I. 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීමට සහ කඩිනමින් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට ඉන්දියානු විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ දී (2023 ජනවාරි) ජනාධිපතිවරයා එකග වූ බව ඉන්දියානු මාධ්‍ය වාර්තා කළේ ය.

II. ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා සහ ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන් අතර පැවති සාකච්ඡාවේ දී ආරක්ෂක හමුදා බලය 2024 දී 70,000 කින් අඩු කිරීමට සහ 2030 වන විට දැනට සිටින සංඛ්‍යාව ලක්ෂ 1 දක්වා හෙවත් 50% කින් අඩු කිරීමට එකග වී ඇති බව වාර්තා විය. එහි අවසන් ප්‍රතිඵලය උතුරු සහ නැගෙනහිර හමුදා කඳවුරු ඉවත් කිරීම සඳහා වූ බෙදුම්වාදීන්ගේ ප්‍රබල ඉල්ලීම ඉටු කිරීම ය.

III. උතුරේ ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන විනාශ කිරීම මගින් ඉතිහාසය මකා දැමීම බෙදුම්වාදීන්ගේ ඊනියා නිජබිම් සංකල්පයේ මූලික පූර්ව කොන්දේසියකි. ඊට අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අදාළ වගකීම් ඉටුකිරීම පිළිබඳ ව බෙදුම්වාදීන් දීර්ඝකාලීන ව විරෝධය පළ කරති. ඒ අනුව දැන් ජනාධිපතිවරයා කරුණු 4කට එකගතාව පළ කර ඇත. පළමුවැන්න පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජෙනරාල් සතු රක්ෂිත ගැසට් කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය යටතට ගැනීම ය. දෙවැන්න බාහිර ආධාර මත ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොකළ යුතු බවට නියෝග පැනවීම ය. තුන්වැන්න සංරක්ෂණ කටයුතු 1985 සැලසුමට අනුව සිදු කළ යුතු බවට තීරණය කිරීම ය. ඒ අනුව යුද ජයග්‍රහණයෙන් පසු ව හඳුනාගත් ස්ථාන ජාතික සැලසුමෙන් ඉවත් වනු ඇත. හතරවැන්න ආරක්ෂක හමුදා සංරක්ෂණ භූමිවලින් ක්‍රමයෙන් ඉවත් කිරීම සහ සංරක්ෂණ කටයුතුවලට අවශ්‍ය රාජ්‍ය දායකත්වය කපා හැරීම ය.

IV. බෙදුම්වාදීන්ගේ දීර්ඝකාලීන ඉල්ලීමක් වූ මහවැලි අධිකාරිය අහෝසි කර උතුරු නැගෙනහිර ඉඩම්වලින් 40%ක් පමණ වූ භූමිය ප්‍රාදේශීය ලේකම්වරුන් යටතට පත් කිරීම සඳහා ආණ්ඩුව එකග වී ඇත. පළාත් සභා සතු ඉඩම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී පවතින ප්‍රධාන බාධකයක් ඒ මගින් ඉවත් වේ.

V. සත්‍ය සෙවීමේ කොමිසම පිහිටුවීම මගින් රණවිරුවන්ට යුද අපරාධ චෝදනා එල්ල කිරීමේ ජාත්‍යන්තර ක්‍රියාන්විතය බලාත්මක කිරීම සහ බෙදුම්වාදී න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයෑම සඳහා රට තුළ සිටිමින් ජාත්‍යන්තර මැදිහත් වීමක් සිදු කිරීමට අවස්ථාව සලසා ගැනීම.

VI. උතුරු සහ නැගෙනහිර පළාත්වලට බෙදුම්වාදී බලවේගවලට පිළිගත හැකි ආණ්ඩුකාරවරුන් පත් කිරීම. එම ක්‍රියාවලිය මේ වන විට ද ආරම්භ කර ඇති අතර පළාත් සභා මැතිවරණය පැවැත්වීමෙන් පසු ව තවදුරටත් තහවුරු කෙරෙනු ඇත. ඒ මගින් බෙදුම්වාදී මාර්ග සිතියම ඔස්සේ ඉදිරියට ගමන් කිරීම සඳහා අවශ්‍ය මූලික පූර්ව කොන්දේසියක් ඉටු වේ.

**ශ්‍රී ලංකාවේ බෙදුම්වාදී න්‍යාය පත්‍රය ඉන්දු - ඇමෙරිකානු න්‍යාය පත්‍රයේ ම කොටසක් වන බැවින් එම ක්‍රියාවලිය සඳහා එම රටවල සහයෝගය සහ මග පෙන්වීම ලැබෙන බවට පමණක් නොව ඒ සඳහා බලපෑම් සිදු වන බවට ද සැකයක් නැත. ඒ අනුව ජනාධිපතිවරණයට පසු ව පළාත් සභා මැතිවරණය පැවැත්වුවහොත් ඉතා කෙටි කලකින් දැනටමත් සකස් කර ඇති පොලිස්, ඉඩම්, පළාත් පුරාවිද්‍යා අධිකාරී ආදී වශයෙන් වන ප්‍රඥප්ති එකින් එක සම්මත කරමින් බෙදුම්වාදී මාර්ග සිතියම ඔස්සේ අවසන් සැතපුම් කණුව දක්වා ගමන් කරනු ඇත. එම ක්‍රියාවලිය තුළ අදාළ ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන ගැටළු මුල් කරගනිමින් ගැටුම් නිර්මාණය කිරීම හරහා ජාත්‍යන්තර මැදිහත් වීමට ඉඩ සලසනු ඇත.**

**පස්වැනි න්‍යාය පත්‍රයඃ**

**සමාජය බිඳ වැට්ටවීමේ න්‍යාය පත්‍රයඃ** මෙම න්‍යාය පත්‍රය දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක වූ සහ දැන් ආපදා තත්ත්වය තුළ ඉහළට ඔසවන සමාජය ඇතුළතින් බිඳ වැට්ටවීමේ ක්‍රියාන්විතය බව ඉතා පැහැදිලි ය. එය න්‍යායාත්මක පදනම් 4ක් යටතේ ක්‍රියාත්මක වන බව පැහැදිලි ව දැකගත හැකි ය. එම න්‍යායයන් ත්‍රිත්වය අතුරින් පළමු වැන්න (Anti Estabishment) ආයතන විරෝධී න්‍යාය වන අතර දෙවැන්න මතවාදී බිඳ වැට්ටවීම (Idealogical Subversion), තුන්වැන්න ප්‍රචණ්ඩකරණය (Radicalisation) සහ හතරවැන්න සංස්කෘතික බිදවැට්ටවීම (Cultural Subversion) ලෙස හඳුනාගත හැකි ය.

I. මේ වන විට ''ආයතන විරෝධී න්‍යායට'' අනුව ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරය තුළ පවතින ප්‍රධාන සංස්ථා ත්‍රිත්වය බිඳ වැට්ටවීමේ ක්‍රියාවලිය ඉදිරියට ගමන් කරන බව දැන් ඉතා පැහැදිලි ව පෙනේ.

II. ඒ අතුරින් පළමු වැන්න සංඝ සමාජයේ ඓතිහාසික භූමිකාව අහිමි කිරීම යඃ සම්බුද්ධ ශාසනයේ පැවැත්ම ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලික පූර්ව කොන්දේසිය වන සංඝ සමාජය බිඳ වැට්ටවීම සඳහා විශේෂයෙන් ම මහජනයා අතර භික්ෂූන් වහන්සේලාගේ ගෞරවය බිඳීම සඳහා මහා මෙහෙයුමක් දියත් වන බව ඉතා පැහැදිලි ය. මෑත කාලීන ව බෞද්ධ සහ පාලි විශ්වවිද්‍යාලයට භික්ෂූන් වහන්සේ නමක් නොවන ශිෂ්‍යයකු භික්ෂු වේශයෙන් ඇතුළු කිරීම මගින් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අපචාරවලට පෙළඹවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක වූ බව එළිදරව් විය. ඊට අමතර ව භික්ෂූන් වහන්සේලා ප්‍රචණ්ඩ විරෝධතා සඳහා යොමු කිරීම, භික්ෂු වේෂධාරීන් මගින් භික්ෂු ගෞරවය කෙලෙසීම ආදිය සංවිධානාත්මක ව සිදු වන බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. එසේ ම ළමා අපචාර චෝදනා එල්ල කිරීම මගින් පිරිවෙන් පද්ධතිය විනාශ කිරීමේ ක්‍රියාන්විතය දැනටමත් ආරම්භ වී ඇත. ඒ අතර ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙහෙයවනු ලබන සමාජ ජාලා ක්‍රියාකාරිකයන් විසින් සිද්ධාර්ථ කුමරුන් සහ බුදුන් වහන්සේ මෙන් ම උතුම් බෞද්ධ සංකේත හාස්‍යයට සහ හෑල්ලුවට ලක් කිරීම මේ වන විට ඉතා සුලභ ක්‍රියාවලියක් බවට පත් වී ඇත. ඒ මගින් සම්බුද්ධ සාසනය කෙරෙහි වූ ගෞරවය බිඳ වැට්ටවීමට සහ ඊට පහර දීමට ඓතිහාසික ව සමාජයේ පවතින බිය නැති කිරීම ද ඔවුන්ගේ අරමුණ බව ඉතා පැහැදිලි ය.

III. ඒ අතුරින් දෙවැන්න, පුද්ගලයා නමැති සංස්ථාව බිඳ දැමීම යඃ ඒ සඳහා ප්‍රධාන වශයෙන් 'ප්‍රචණ්ඩකරණය' (Radicalization) නම් වූ න්‍යායට අනුව බහුවිධ ක්‍රියාකාරකම් දියත් වේ. එහි මූලික අරමුණ සත්‍යත්ව උරුමය මත දෙපා තබා නැගී සිටින සහ ඊට අදාළ වටිනාකම් පද්ධතිය විසින් මෙහෙයවනු ලබන පුද්ගලයාගේ අනන්‍යතාව අහෝසි කිරීම ය. සමාජය තුළ ප්‍රචණ්ඩත්වය වැපිරවීම, මත්ද්‍රව්‍ය සහ මත්පැන් ප්‍රචලිත කිරීම ආදි ක්‍රියාකාරකම් මගින් පුද්ගලයාගේ අනන්‍යතාව සහ ඓතිහාසික භූමිකාව අහෝසි කිරීම සඳහා පදනම සකස් වේ. එම ක්‍රියාවලිය තුළ අවසානයේ දී සමාජයට වෛර කරන සහ විනාශකාරී ව පහරදීමේ මනසක් සහිත පුද්ගලයකු නිර්මාණය වේ.

IV. ඒ අතුරින් තුන්වැන්න පවුල සහ විශේෂයෙන් ම පවුල තුළ මවගේ භූමිකාව බිඳවැට්ටවීම යඃ. පවුල නමැති සංකල්පය ඊට අදාළ වටිනාකම් පද්ධතිය විනාශ කිරීමේ ක්‍රියාවලිය ද

ක්‍රමානුකූල ව සිදු වෙමින් ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ නාමයෙන් පවුල් ගැටුම් දික්කසාදයෙන් කෙළවර වන තත්ත්වය නිර්මාණය කිරීම සඳහා නීති පැනවීම ඊට අදාළ ප්‍රබල උපාංගයකි. මත්පැන් ප්‍රචලිත කිරීම වැඩිහිටියන්ට ගරු නොකිරීමේ සංස්කෘතිය ප්‍රචලිත කිරීම, සමලිංගික විවාහ නීතිගත කිරීම සහ කාන්තාවන්ට සම තැන නාමයෙන් ඇයගේ ඓතිහාසික භූමිකාව අහෝසි කිරීම, විදේශ රැකියා සඳහා මවුවරුන් යැවීම ආදි ක්‍රියාමාර්ග රාශියක් මගින් පවුල බිඳ වැටීම සිදු වෙමින් ඇත. (පවුල බිඳ වැට්ටවීමේ ක්‍රියාලිය තුළ මූලික උපායමාර්ගය වන්නේ ශ්‍රී ලංකාවේ පවුල තුළ දක්නට ලැබෙන මවගේ උතුම් වූ භූමිකාව බිඳ වැට්ටවීම ය.)

V. සමාජය බිඳ වැට්ටවීමේ මහා උපායමාර්ගික ප්‍රවේශය තුළ තුන්වැනි ප්‍රවේශය වන්නේ මහා සංඝරත්නය, පුද්ගලයා සහ සමාජය තුළ පවතින විශ්වාසයන්, මතවාද, ආචාර ධර්ම, චත්පිළිවෙත් සහ වටිනාකම් පද්ධතිය මිථ්‍යාවක් හෝ ව්‍යාජයක් බවට නව මතවාද නිර්මාණය කිරීම මගින් සමාජය මතවාදී ව බිඳ වැට්ටවීම ය. (Idealogical Subversion) බුදුන් වහන්සේ ශ්‍රී ලංකාවේ උත්පත්තිය ලැබූ බවට මතවාදයක් සමාජය තුළ තහවුරු කිරීම මගින් මහාවංසය පමණක් නොව ත්‍රිපිටකය පවා අභියෝගයකට ලක් වේ. ඒ තුළින් සංඝ සමාජය තුළ ගැටුම් නිර්මාණය කිරීම ද අතුරු අරමුණකි. එම ක්‍රියාවලියේ අවසන් අරමුණ පුද්ගලයාට සහ සමස්තයක් ලෙස සමාජයට තම අනන්‍යතාව පටලැවීම සහ තම සතුරාගේ අනන්‍යතාව හඳුනාගැනීමට නොහැකි තත්ත්වයක් නිර්මාණය කිරීම ය.

VI. සමාජය බිඳ වැට්ටවීමේ හතරවැනි උපායමාර්ගය වන්නේ සංඝ සමාජය ඇතුළු සමස්ත සමාජය තුළ දුරාචාර ප්‍රචලිත කිරීම සහ සංස්කෘතික වශයෙන් පිරිහුණු සමාජයක් නිර්මාණය කිරීම ය. කංසා වැවීම නීතිගත කිරීම, තරුණ දරුවන් පිරිමි සහ ගැහැණු වශයෙන් ගණිකා වෘත්තියට පෙළඹවීම මුල් කරගෙන අයුර්වේද වෛද්‍යවරයකුගේ අධීක්ෂණයෙන් තොර ව සම්බාහන ශිල්පීන් සහ ශිල්පිනියන් ලෙස කටයුතු කිරීම සඳහා නීති මගින් අවසර දීම සඳහා ආයුර්වේද පනත සංශෝධනය කිරීම ඉතා නරකම උදාහරණයකි. ගැහුණු දරුවන් ලිංගික ක්‍රියාවන් සඳහා කැමැත්ත දීමේ වයස වසර 16 සිට 14 දක්වා අඩු කිරීම මෙන් ම සමලිංගික ක්‍රියා සමාජය තුළ ප්‍රචලිත කිරීම සඳහා නීති ගෙන ඒම තවත් ප්‍රවේශයකි. පාසල් සහ විශ්වවිද්‍යාලය තුළ පමණක් නොව පිරිවෙන් තුළ පවා ඉතා සූක්ෂ්ම ලෙස මත්පැන් සහ මත්ද්‍රව්‍ය ප්‍රචලිත කිරීම අදිය ද ඊට අයත් වේ. එම සමස්ත ක්‍රියාවලිය සංස්කෘතික බිඳ වැට්ටවීම හෙවත් (Cultural Subversion) ලෙස හැඳින්වේ.

**තර්කානුකූල ප්‍රතිඵලය**

ඉහත සඳහන් කළ සමස්ත ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵලය මෙසේ සංක්ෂිප්ත ව දැක්විය හැකි ය.

1. ආර්ථික අර්බුදය විසඳීමේ නාමයෙන් එම අර්බුදය තවදුරටත් උත්සන්න වීමට ඉඩ සැලසීම මගින් ඉහත සඳහන් කළ න්‍යාය පත්‍ර සියල්ලට ගොදුරු වීම හැර වෙනත් විකල්පයක් නොමැති බවට සමාජ මනෝභාවය සකස් කිරීම. (මේ වන තුරු ආණ්ඩුව විසින් අර්බුදය ජය ගැනීම සඳහා නිශ්චිත උපායමාර්ගික වැඩ පිළිවෙළක් රටට ඉදිරිපත් කර නොමැති අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි ඉටු කිරීම එක ම විසඳුම ලෙස පිළිගෙන ඇති අතර අර්බුදයට මූල හේතුව වූ පරාධීන ආර්ථික මොඩලය එසේ ම පවත්වාගෙන යන ආකාරය පැහැදිලි ව දැකගත හැකි ය. ණය ආපසු ගෙවීම මගින් ලබාගෙන ඇති තාවකාලික හුස්ම ගැනීමේ ඉඩ පෙන්වමින් රට මුහුණ දෙන සැබෑ අර්බුදය සඟවමින් අර්බුදය උත්සන්න වීමට ඉඩ සලසන ආකාරය මේ දිනවල දැකගත හැකි ය. එම ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵලය මෙසේ දැක්විය හැකි ය.)

I. වරායවල්, ගුවන් තොටුපොළ සේවා, සන්නිවේදන සේවා සහ බැංකු ඇතුළු උපාය මාර්ගික වශයෙන් වැදගත් රාජ්‍ය ආයතන විකිණීම සහ ඒවා විදේශිකයන් අතට පත් වීම.

II. ආනයන සඳහා බදු සහන ලබා දීම සහ ආනයන සීමා ඉවත් කිරීම මගින් දේශීය නිෂ්පාදන පද්ධතිය බිඳ වැට්ටවීම සහ විනිමය අර්බුදය වර්ධනය වීමට ඉඩ හැරීම.

III. විශේෂයෙන් ම කළු වෙළෙඳපොළ දිරිමත් කෙරෙන පවතින විදේශ විනිමය පනත සංශෝධනය නොකිරීම සහ කළු වෙළෙඳපොළ පැවැත්ම තහවුරු කිරීම මගින් විනිමය අර්බුදය දීර්ඝකාලීන ව පවත්වාගෙන යාම.

IV. නව මහ බැංකු පනත මගින් රටේ ආර්ථිකයේ පාලනය මූල්‍ය අරමුදලේ අනුකම්පාවට යටත් කිරීම මගින් දීර්ඝකාලීන ආර්ථික පරාධීනත්වය පවත්වාගෙන යාම හෙවත් විසඳුම්වලට බාධා කිරීම.

V. බිඳ වැටෙන දේශීය කර්මාන්ත පද්ධතිය විදේශිකයන් විසින් විශේෂයෙන් ම ඉන්දියානු ජාවාරම්කරුවන් විසින් මිල දී ගැනීම.

VI. ණය පොලී අනුපාත ඉහළ මට්ටමක පැවතීම තුළ පොදු මහජනයාගේ සහ නිෂ්පාදකයාගේ ණය බර වැඩි වීම නිසා ආර්ථික අවස්ථා අහිමි වීම, රැකියා අවස්ථා අහිමි වීම මෙන් ම අධික බදු බර නිසා නිෂ්පාදන පද්ධතිය මෙන් ම මහජනයාගේ ජීවන තත්ත්වය කඩාවැටීම.

VII. අසහනයට පත් වන බහුතර ජනතාවගේ විරෝධතා මැඩ පැවැත්වීම සඳහා ත්‍රස්ත විරෝධී පනත වැනි නව නීති යොදාගැනීම මගින් සමාජ අසහනය මෙන් ම ගැටුම් වර්ධනය වීම සහ ඒ තුළ නිෂ්පාදන පද්ධතිය සහ ජන ජීවිතය තවදුරටත් බිඳ වැටීම.

2. එට්කා ගිවිසුම අත්සන් කිරීම මගින් සේවා වෙළඳ පොළ විවෘත කර ඉන්දියානුවන් ලක්ෂ ගණනින් ශ්‍රී ලංකාවට කඩා වැදීමට ඉඩ සැලසීම මගින් පනික්කාර් න්‍යාය පත්‍රයට අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉන්දියානු ආර්ථිකය මත පරාධීන වූ තත්ත්වයක් නිර්මාණය වීම තුළ ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත් වීම.

I. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සහ ඉඩම් ඉන්දියානුවන් අතට පත්වීම.

II. ඉන්දියානු ව්‍යාපාරිකයන්, වෘත්තිකයන් සහ කම්කරුවන් ආදි වශයෙන් ශ්‍රී ලංකාව තුළ දීර්ඝකාලීන ව රැඳී සිටින ඉන්දියානුවන් ගේ ආර්ථික භූමිකාව වර්ධනය වීම. එනම් රටේ ආර්ථික ක්‍රියාවලිය සමස්තයක් ලෙස ඉන්දියානුවන් හෙවත් ඉන්දියාවේ පස්වැනි හමුදාව විසින් අත්පත් කරගැනීම

III. 29 වැනි ප්‍රාන්තය දීර්ඝකාලීන ව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා 30 වැනි ප්‍රාන්තය හෙවත් ඊළම බිහි කිරීම සඳහා තත්ත්වයන් නිර්මාණය කිරීම. (එනම් බෙදුම්වාදී න්‍යාය පත්‍රය අවසන් කිරීම සහ එමගින් රට බෙදා වෙන් කිරීම සහ දීර්ඝකාලීන ව ගැටුම්කාරී තත්ත්වය පවත්වාගෙන යාම.)

IV. 30 වැනි ප්‍රාන්තය හෙවත් ඊළම ඉන්දු ඇමෙරිකානු න්‍යාය පත්‍රය තුළ ආසියාවේ ඊශ්‍රායලය හෙවත් ත්‍රස්තවාදී රාජ්‍යයක් බවට පත් කළ හැකි අතර එවැනි තත්ත්වයක දී 29 වැනි ප්‍රාන්තයේ ඉතිරි කොටසේ ජීවත් වන ජනතාවට අද ගාසා තීරයේ ජනතාවට මුහුණ දීමට සිදු ව ඇති ඉරණමට ගොදුරු වීමට සිදු විය හැකි ය. එහි අවසාන ප්‍රතිඵලය ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ සම්බුද්ධ සාසනය ද අවසන් වීම බව ඉතා පැහැදිලි ය.

**ඒ අනුව පනික්කාර් න්‍යාය පත්‍රය සහ බෙදුම්වාදී න්‍යාය පත්‍ර එකට බැඳී ඇති බව හෙවත් එක ම කාසියේ දෙපැත්ත බව පිළිගැනීමට සිදු වේ.**

3 ඇමරිකානු ඉන්දු - පැසිෆික් න්‍යාය පත්‍රයට පහසුකම් සැලසීම සඳහා ඉහත සඳහන් කළ ආකාරයට SOFA ගිවිසුමේ ඇමුණුම ඊ සඳහා එකග වීම තොරතුරු පද්ධති සහ ඔත්තු සේවා ඒකාබද්ධ කිරීම, සැපයුම් මධ්‍යස්ථාන පිහිටුවීම සහ ත්‍රිකුණාමල ආයෝජන කලාපය තුළ ඉන්දියානු, ඇමෙරිකානු

සහ ජපන් ආයෝජකයන්ට පහසුකම් සැලසීම මගින් ඉන්දු - පැසිෆික් සැපයුම් මධ්‍යස්ථානය පිහිටුවීමට අදාළ මූලික කටයුතු අවසන් කිරීම සහ MCC ගිවිසුම අත්සන් කිරීම මගින් එම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම ආදිය ඊළඟ ජනාධිපතිවරණයට පසු ව සිදු වනු ඇත. (ත්‍රිකුණාමලය ආයෝජන කලාපයට ඉන්දියානු ඇමරිකානු සහ ජපන් ආයෝජකයන් පමණක් කැඳවීම සඳහා දැනටමත් සිංගප්පූරුවේ Surbana Jurong නම් උපදේශන සමාගමට කොන්ත්‍රාත්තුවක් ලබා දී ඇත. එම ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵලය අර්බුදයට ලක්වන සහ ගැටුම්වලට ගොදුරු වන ශ්‍රී ලංකාව නම් වූ අර්ධ යටත් විජිතය ආසියාවේ නේටෝව හෙවත් ඉන්දියාව, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව සහ ජපානය ඇතුළත් QUAD නම් වූ යුද සන්ධානයේ න්‍යායපත්‍රයට අනුව විදේශීය හමුදාවලට සේවා සපයන දාස රාජ්‍යයක් බවට පත් කිරීම ය.

**පවතින තත්ත්වය තේරුම් ගැනීම**

(1) නයෝමි ක්ලේන් නමැති පර්යේෂණ මාධ්‍යවේදිනියගේ Shock Doctrine හෙවත් කම්පන න්‍යාය ග්‍රන්ථය ඉතා විචිත්‍රවත් ලෙස පැහැදිලි කරන ආකාරයට යම් ආපදා තත්ත්වයක් නිසා භෞතික ව සහ මානසික ව පීඩාවට පත් ව සිටින ජනතාව ඊට පෙර පිළිගැනීමට සූදානම් නොවූ බොහෝ වෙනස්කම් පිළිගැනීමට එකග වෙති. එහි දී බොහෝ විට ආපදාව නිර්මාණය කරන්නා ගැලවුම්කාරයා ලෙස භාරගැනීමට එම ජනතාව එකග වෙති. අද ශ්‍රී ලංකාව තුළ සිදු වෙමින් පවතින දේ තේරුම් ගැනීමට එම න්‍යායාත්මක පැහැදිලි කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ.

(2) ගෝඨාභය රාජපක්ෂ පාලන කාලය තුළ විදේශ විනිමය අර්බුදයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ 2015- 2019 කාලයේ දී 6.8% - 7.2% ආදි ඉතා ඉහළ පොලියට ස්වෛරී බැඳුම්කර හෙවත් වාණිජ ණය ඇමෙරිකන් ඩොලර් බිලියන 12 (ඇ.ඩොලර් මිලියන 12,000) නිකුත් කිරීම බව දැන් ඔප්පු වී ඇත. එම ණය අරමුදල කිසිදු සංවර්ධන ව්‍යාපෘතියකට යොදවා නොමැති අතර එදිනෙදා ගෙවුම් ශේෂ හිඟය පියවාගැනීම සඳහා පමණක් ඒවා යොදාගෙන ඇත. අද වන විට විදේශීය ණය පොලී ගෙවීම්වලින් 76% ක් වැය වන්නේ එම වාණිජ ණයවල පොලී ගෙවීම සඳහා ය. එම කාලයේ දී වත්මන් මහ බැංකු අධිපතිතුමා නියෝජ්‍ය අධිපතිවරයකු ලෙස කටයුතු කළේ ය. ඒ අනුව එතුමා අදාළ ලේඛනවලට අත්සන් කිරීමේ දී මෙවැනි අර්බුදයක් ඇති වන බව නොදැන සිටි බව පිළිගත නොහැකි ය.

(3) ඊට අමතර ව රටට ලැබිය යුතු විදේශ විනිමය ආදායම් නිසි ලෙස රට තුළට ප්‍රේෂණය නොවන්නේ 2018 දී සම්මත කළ විදේශීය විනිමය පනත නිසා බව දැන් ඉතා හොඳින් පැහැදිලි වී ඇත. එම පනත් සම්මත කිරීමට ද දායක වන්නේ වත්මන් ජනාධිපතිවරයා අගමැතිවරයා ලෙස සහ වත්මන් මහ බැංකු අධිපතිවරයා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයකු ලෙස ය. ඒ අනුව දැන් ලෙඩා බාර දී ඇත්තේ ලෙඩේ උත්සන්න කළ වෙදුන්ට බව පැහැදිලි වේ.

(4) ඒ අනුව වසර දහස් ගණනක් තිස්සේ ශ්‍රී ලංකාව නම් වූ රාජ්‍යය තම දාස රාජ්‍යයක් හෙවත් අර්ධ යටත් විජිතයක් බවට පත් කරගැනීමට මාන බලමින් සිටි ජාත්‍යන්තර බලවේගවලට තම න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා මනරම් අවස්ථාවක් නිර්මාණය වී ඇත. එම දුර්ලභ අවස්ථාව එම බලවේග විසින් අතහැර දමනු ඇතැයි කල්පනා කිරීම යනු නැවත නිවැරදි කළ නොහැකි ඓතිහාසික වරදක් බවට පත්වනු ඇත. ඒ බව මහජනයාට ඒත්තු ගැන්වීම විසඳුමක් සඳහා වන මූලික කොන්දේසිය බව පිළිගැනිමට සිදු වේ.

(5) මෙ වන විට බෙදුම්වාදීන්ගේ සියලු ම ඉල්ලීම් ඉටු කිරීමට ආණ්ඩුව ක්‍රියා කරන තත්ත්වයක් තුළ විශේෂයෙන් ම ප්‍රභාකරන් සහ ඩෙන්සිල් කොබ්බෑකඩුව එක විට සැමරීම සඳහා ස්මාරක නිර්මාණය කිරීමට පවා එකග වන තත්ත්වයක් තුළ ජනාධිපතිවරණය දක්වා සිංහල බෞද්ධයා අවුල් විය හැකි බරපතළ තීන්දු හැර බෙදුම්වාදීන්ගේ සියලු ඉල්ලීම් ඉටු කිරීමට ආණ්ඩුව ක්‍රියා කරන බව ඉතා පැහැදිලි ය. එසේ වුවත් ඉන්දියානු ආණ්ඩුවේ බලපෑම මත ජනාධිපතිවරණයට පෙර එට්කා ගිවිසුම අත්සන් කිරීම සිදුවිය හැකි ය.

(6) ණය ගෙවීම අත්හිටුවා ඇති බැවින් සහ ඉහළ උද්ධමන තත්ත්වය තුළ ආනයන සීමා වී ඇති

බැවින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීමට යම් විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි වුව ද අංක ගණිතය දන්නා ඕනෑම අයකුට එම තත්ත්වය 'අපායේ විවේකයක්' බව තේරුම් ගැනීම අපහසු නැත.

(7) පවතින අර්බුදය තුළ මහජන අවධානය විසිරී පවතින බැවින් සත්‍ය සෙවීමේ කොමිසම් පනත ජනාධිපතිවරණට පෙර සම්මත කිරීම මගින් ආපසු හැරවිය නොහැකි ආකාරයට රණවිරුවන්ට බරපතල යුද අපරාධ චෝදනා එල්ල කිරීම මගින් ආරක්ෂක හමුදා බිඳ වැට්ටවීම සහ රට තුළ ජාත්‍යන්තර මැදිහත් වීමකට පාර කැපීමේ ඉඩකඩ බැහැර කළ නොහැකි ය. එම නව පනත බෙදුම්වාදී න්‍යාය පත්‍රය ශක්තිමත් කිරීම සඳහා 2015 සිට සම්මත කළ පනත් 7ක් මගින් පිහිටුවනු ලබන යාන්ත්‍රණ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පූර්ව කොන්දේසියකි.

(8) එහෙත් ජනාධිපතිවරණය දිනාගැනීම සඳහා සුළු ජන ඡන්ද පදනම පමණක් සෑහෙන්නේ නැත. ඉදිරි ජනාධිපතිවරණය වර්තමාන ජනාධිපතිවරයාට හෝ එතුමාගේ න්‍යායපත්‍රය පිළිගන්නා වෙනත් අපේක්ෂකයකුට දිනාගැනීමට නොහැකි වුවහොත් බෙදුම්වාදීන්ගේ අවසන් අරමුණු අනතුරට ලක්වනු ඇත. ඒ නිසා ඔවුන් යම් අවබෝධයකින් යුතු ව බහුතර සිංහල බෞද්ධ ජනතාව 'ගොනාට ඇන්දවීමේ' ක්‍රියාවලියට වක්‍ර ව සහය දක්වනු ඇත. එම තත්ත්වය තුළ කේවල් කිරීමේ අවකාශයක් නිර්මාණය කිරීමට මහා සංඝරත්නය ප්‍රමුඛ සිංහල බෞද්ධ බලවේගයට අවස්ථාව ලැබී ඇත.

**කළ යුතු දේ**

**පවතින තත්ත්වය තුළ එදා 1946 දී නිදහස ලබාගැනීමටත් පෙර සිට අනාගත අභියෝග මැනවින් අවබෝධ කරගනිමින් මහා සංඝරත්නය විසින් විද්‍යාලංකාර ප්‍රකාශය නිකුත් කිරීම මගින් බහුතර සිංහල බෞද්ධ බලවේගය අවදි කළ ආකාරය ප්‍රතිනිර්මාණය කිරීම හැර වෙනත් විකල්පයක් නැත. ඒ නිසා දැන් මහා සංඝරත්නය විසින් මෙම ප්‍රකාශය මගින් තම ඓතිහාසික භූමිකාව නැවත අත්පත් කරගනිමින් විද්‍යාලංකාර ප්‍රකාශය මෙසේ ප්‍රතිනිර්මාණය කරනු ලැබේ. ඒ අනුව පවතින අනතුර පැහැදිලි කරමින් සහ එම තත්ත්වය වෙනස් කිරීමට නොහැකි වුවහොත් ශ්‍රී ලංකාවේ ඉතිහාසය මෙන් ම ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනය ද අවසන් වන බව මහජනයාට පෙන්වා දිය යුතු ය. එම ක්‍රියාවලිය තුළ මහජනයා මෙන් ම ආණ්ඩුවට ද කළ යුතු දේ සහ නොකළ යුතු දේ පිළිබඳ ව මෙසේ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.**

**ඒ අනුව ජනාධිපතිවරණයට පෙර ආණ්ඩුව විසින් ඉටු කළ යුතු කොන්දේසි මෙසේ ඉදිරිපත් කරන වග යි.**

(1) බෙදුම්වාදීන්ගේ අයුතු ඉල්ලීම් ඉටු කිරීම වහා අත්හිටුවීම.

I. පුරාවිද්‍යා රක්ෂිත ගැසට් කිරීමේ බලය නීති විරෝධී ලෙස අමාත්‍ය මණ්ඩලයට පවරා - ගැනීම නැවැත්විය යුතු අතර මහනායක හිමිවරුන්ගේ අනුශාසනාව අනුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ උපදේශක සභාව පත් කළ යුතු ය.

II. දැනට සකස් කර මහනායක හිමිවරුන්ගේ අනුමැතිය හිමි වූ නව පුරාවිද්‍යා ආඥා පනත සම්මත කිරීම වැළැක්වීම සඳහා කටයුතු කරන පිරිස්වල බලපෑම්වලට යටත් නොවී අදාළ පනත වහා සම්මත කළ යුතු ය.

III. පුරාවිද්‍යා ස්ථාන ප්‍රතිසංස්කරණය සඳහා රජයට අමතර ව පුද්ගලික අංශයේ සහයෝගය ලබාගැනීම වැළැක්වීම සඳහා ලබා දුන් නියෝගය ඉල්ලා අස් කරගත යුතු ය.

IV. ජාතික පුරාවිද්‍යා සැලැස්ම යාවත්කාලීන කළ යුතු අතර 1985 සැලසුම වෙනුවට එසේ යාවත්කාලීන කළ සැලසුම යොදාගත යුතු ය. දැනට රටපුරා හඳුනාගෙන ඇති සියලු ම ස්ථාන විධිමත් ව ලියාපදිංචි කළ යුතු ය. පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම සඳහා යොදවා ඇති ආරක්ෂක හමුදා පිරිස් බලය ඉවත් නොකළ යුතු ය.

V. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, බෙදුම්වාදී බලවේග සහ ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ආරක්ෂක හමුදා පිරිස් බලය භාගයකින් අඩු කිරීමට ගෙන

ඇති තීරණය වහා ම අත් හිටුවිය යුතු ය. එවැනි තීන්දුවක් මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වලින් හමුදා කඳවුරු ඉවත් කිරීම සඳහා සිදු කරන බලපෑම්වලට පිටුවහලක් ලැබේ. එසේ ම එවැනි තීන්දුවක් ගැනීම සිදු විය යුත්තේ බෙදුම්වාදී අනතුර පහ ව ගිය තත්ත්වයක දී මෙන් ම ආරක්ෂක හමුදා ප්‍රතිසංස්කරණවලට අදාළ ප්‍රවීණ ආරක්ෂක සේවා නිලධාරීන්ගේ විශේෂඥ කමිටුවක නිර්දේශ මත මිස බෙදුම්වාදී බලවේගවල බලපෑමට යටත් වීම මත නොවේ.

VI. විශ්‍රාමික සහ ආබාධිත රණවිරුවන්ට සහ දිවිපිදූ රණවිරුවන්ගේ යැපෙන්නන්ට ලබාදිය යුතු සහන කප්පාදු කිරීම මගින් ඔවුන් දුකට පත් කිරීම මෙන් ම සමස්ත හමුදාවේ මානසික ශක්තිය බිඳ වැට්ටවීමේ ක්‍රියාවලිය වහා නිවැරදි කළ යුතු ය.

1. මූල්‍ය අරමුදලින් ලැබෙන සුළු ණය ප්‍රමාණය මගින් රට ආර්ථික අර්බුදයෙන් ගලවාගත හැකි ය යන මිථ්‍යාවෙන් ගැලවී වහා ම අර්බුදයට හේතු වූ මූල හේතු නැති කිරීම සඳහා ආර්ථික මොඩලය පරාධීනත්වයෙන් ගලවාගනිමින් දේශීය නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කිරීම සහ දීර්ඝකාලීන ව පවත්වා ගත නොහැකි අධිපරිභෝජනවාදී ජීවන රටාව (ආණ්ඩුවට මෙන් ම මහජනයාට අදාළ ව) වෙනස් කිරීම මුල් කරගෙන උපායමාර්ගික වැඩ පිළිවෙළක් රටට ඉදිරිපත් කළ යුතු ය.

2. මහ බැංකුවට ප්‍රතිපත්තිමය ස්වාධීනත්වය ලබාදීම මගින් මහජන පරමාධිපත්‍යයට අභියෝග කරන සහ රට මූල්‍ය අරමුදලේ ආධිපත්‍යයට යටත් කරන නව මහ බැංකු පනත නැවත සංශෝධනය කිරීම මගින් එම වරද නිවැරදි කළ යුතු ය.

3. පවතින විදේශ විනිමය පනත ඉවත් කර පැරණි පනත සංශෝධනය කිරීම මගින් විදේශ විනිමය කළු වෙළඳ පොළ පාලනය කිරීම සහ විදේශ විනිමය කළමනාකරණය ශක්තිමත් කළ යුතු ය.

4. ත්‍රස්ත විරෝධී පනත වැනි මහජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහිමි කරන මර්දනකාරී පනත් මගින් මහජන ගැටුම් ඇවිලවීම වෙනුවට එම පනත අහෝසි කර ඊට පෙර පැවැති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට මහජනයාගේ සිවිල් සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා වන වගන්ති ඇතුළු කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන අතර ත්‍රස්තවාදය මැඩ පැවැත්විය යුතු ය.

5. සමලිංගික චර්යාවන් සහිත පිරිසට සාධාරණය ඉටු කිරීමේ නාමයෙන් සහ වෙනත් පිළිගත නොහැකි හේතු ඉදිරිපත් කරමින් ළමා අපචාර ප්‍රවර්ධනය කෙරෙන ආකාරයට දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීමේ උත්සාහය අත්හිටුවිය යුතු ය.

6. හදිසි කර්තව්‍යයක් ලෙස ප්‍රධාන කෘෂි නිෂ්පාදන සඳහා පිරිවැයට සාපෙක්ෂ ව සහතික මිල නීතිගත කිරීම සහ නිම් නිෂ්පාදන සඳහා මිල සූත්‍ර හඳුන්වාදීම මගින් ගොවීන්ගේ ආදායම් මට්ටම සුරක්ෂිත කළ යුතු අතර ඒ මගින් රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කළ යුතු ය.

7. රටේ ජාතික ආරක්ෂාවට, ආර්ථික ස්වාධිපත්‍යයට සහ දේශපාලන ස්වෛරීභාවයට හානි කර කිසිදු ජාත්‍යන්තර ගිවිසුමක් අත්සන් නොකරන බවට ප්‍රතිඥාවක් දිය යුතු අතර දැනට සාකච්ඡාවට ලක් වෙමින් පවතින එට්කා ගිවිසුමට අදාළ සියලු ම ලේඛන සැඟවීමෙන් තොර ව අදාළ පාර්ශ්වවලට සහ මහජනයාට ලබාදිය යුතු ය. ඊට අමතර ව එම ගිවිසුම පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර අනුමැතිය නොමැති ව අත්සන් නොකරන බවට ද ප්‍රතිඥාවක් ලබාදිය යුතු ය.

8. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ නාමයෙන් ඉදිරිපත් කෙරෙන පවුල් කඩා ඉහිරවීමේ පනත සම්මත කිරීම නැවැත්විය යුතු අතර ඒ වෙනුවට පවුල් උපදේශන සේවා ශක්තිමත් කළ යුතු ය.

9. රණවිරුවන් පාවාදෙන සහ රට තුළ ජාත්‍යන්තර මැදිහත් වීමකට ඉඩ සලසන සත්‍ය සෙවීමේ කොමිෂන් පනත ඉල්ලා අස් කරගත යුතු ය.

10. මහානායක හිමිවරුන්ගේ අනුශාසනාව පරිදි ටෙලිකොම් ආයතනය ආදි උපායමාර්ගික මර්මස්ථාන විකුණා දැමීමේ ක්‍රියාවලිය වහා ම අත්හිටුවිය යුතු ය.

11. සංශෝධිත ආයුර්වේද පනත මගින් කංසා වැවීම සඳහා අවසර ලබාදීම සහ දැරිවියන්ට සහ දරුවන්ට ආයුර්වේද වෛද්‍යවරයකුගේ අධීක්ෂණයෙන් තොර ව සම්භාහන ශිල්පීන් ලෙස කටයුතු කිරීමට අවසර දීම මගින් තරුණ දරුවන් ගැහැණු සහ පිරිමි ගණිකා වෘත්තියට පෙළඹවීමේ ක්‍රියාවලිය වහා ම නැවැත්විය යුතු අතර එම තත්ත්වය වෙනස් කිරීම සඳහා අදාළ පනත නැවත සංශෝධනය කළ යුතු ය.

12. ජල කලමනාකරණය නාමයෙන් ගොවියාගේ සහ පොදු මහජනතාවගේ ජල අයිතිය අහිමි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම වහා ම අත්හිටුවිය යුතු ය.

13. නව විදුලි පනත මගින් මහා පරිමාණ ජලවිදුලි බලාගර ඇතුළු රටේ සමස්ත විදුලි පද්ධතිය විදේශීය සමාගම් අතට පත් කිරීමේ අදූරදර්ශී ක්‍රියාවලිය වහා අත් හිටුවිය යුතු ය.

14. සම්බුද්ධ සාසනයට විශේෂයෙන් ම මහාවංසයට සහ ත්‍රිපිටකයට අභියෝග කිරීම මෙන් ම මහා සංඝරත්නයට එරෙහි ව එල්ල කරන ප්‍රහාර වැළැක්වීම සහ වැරදිකරුවන්ට දඬුවම් කිරීම සඳහා මහානායක හිමිවරුන්ගේ අනුමැතියට යටත් ව විධිමත් වැඩ පිළිවෙලක් රටට ඉදිරිපත් කළ යුතු ය.

15. ඉදිරි ජනාධිපතිවරණයේ දී නව ව්‍යවස්ථාවක් රටට ඉදිරිපත් කිරීම මගින් එම මැතිවරණය රටේ වත්මන් අර්බුදයට මූලික විසඳුම් ඉදිරිපත් කරන සහ තරුණ තරුණියන්ගේ 'සිස්ටම් චේන්ජ්' සටන් පාඨය යථාර්ථයක් බවට පත් කරන මැතිවරණයක් බවට පත් කිරීම සඳහා පදනම සකස් කළ යුතු ය.

**මහජනයා සහ දේශපාලන පක්ෂ, ජාතික සංවිධානවල වගකීම සහ ඔවුන් විසින් ඉටු කළ යුතු කොන්දේසි මෙසේ ඉදිරිපත් කරනු ලබන වග යි.**

1. ඉදිරිපත් කර ඇති ඉහත කොන්දේසි ඉටුකරන ලෙස ආණ්ඩුවට බලපෑම් කිරීම

2. ආර්ථික අර්බුදය දීර්ඝකාලීන ව විසදීම සඳහා සහ මහජනයාගේ දීර්ඝකාලීන අපේක්ෂ ඉටු කිරීම සඳහා ගනු ලබන උපායමාර්ගික තීන්දු නිශ්චිත ව දක්වා රටට ඉදිරිපත් කරන ලෙස සියලු ම දේශපාලන පක්ෂ වෙත බලපෑම් කිරීම. එම ක්‍රියාවලිය තුළ අදාළ නිශ්චිත ගැටළු විසදන ආකාරය පැහැදිලි ව නිශ්චිත ව රටට ඉදිරිපත් කරන ලෙස බල කරමින් සියලු ම ජනාධිපති අපේක්ෂකයන් වෙත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම.

3. පවතින පරාධීන ආර්ථික සහ දේශපාලන මොඩලය වෙනස් කිරීම හෙවත් මහජනයාගේ 'සිස්ටම් චේන්ජ්' අපේක්ෂාව ඉටු කිරීම සඳහා වන මූලික පූර්ව කොන්දේසිය නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම බව පිළිගැනීම සහ එම පිළිගැනීම මත ඉදිරි ජනාධිපතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයන් විසින් මැතිවරණයේ දී එවැනි ව්‍යවස්ථාවක මූලික රාමුව හෝ සමස්ත ව්‍යවස්ථාව රටට ඉදිරිපත් කළ යුතු බවට බල කිරීම.

**ඒ අනුව අවසාන වශයෙන් නව ව්‍යවස්ථාවක් රටට ඉදිරිපත් නොකරන සහ පවතින ව්‍යවස්ථාව සහ ඒ තුළ නිර්මාණය කළ ආර්ථික සහ දේශපාලන අර්බුදය තම වාසියට යොදාගනිමින් පවතින සමාජ, ආර්ථික මොඩලය තවදුරටත් පවත්වාගෙන යෑමට උත්සාහ කරනු ලබන කිසිදු ජනාධිපතිවරණ අපේක්ෂකයකු මහජනයා විසින් පිළිනොගත යුතු බවට සහ මහජන සම්මුතියක් ලෙස ඉදිරිපත් කරනු ලබන අනාගත ආණ්ඩුවක ප්‍රමුඛතා න්‍යායපත්‍රය පිළිගත යුතු බවට සියලු ම අපේක්ෂකයන්ට මහජනයා විසින් බලපෑම් කළ යුතුය. එසේම හුදු සංකල්ප ඉදිරිපත් කරමින් මහජනයා රැවටීමට ඉඩ ලබා නොදිය යුතු බව සහ ඒ වෙනුවට තමා බලයට පැමිණ මහජන අපේක්ෂා ඉටු කරන්නේ කෙසේදැයි නිශ්චිත උපාය මාර්ගික සැළසුමක් රටට ඉදිරිපත් කළ යුතු බවට අභියෝග කළ යුතුය.**

**ජාතික විද්වද් භික්ෂු සංසදය**

ඇමුණුම 2

# නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව සහ සාධාරනීකරණය

## නව ව්‍යවස්ථාවක් අවශ්‍ය වන්නේ ඇයි:

1. **QUAD** සංවිධානයේ ඉන්දු - පැසිෆික් න්‍යාය පත්‍රය කඩිනම් කිරීම තුළ ඉන්දියාව සහ ඇමෙරිකාව විසින් ඇති කරනු ලබන බලපෑමට මුහුණ දීම.

   I. ඉන්දියාව විසින් ආර්ථික ඒකාබද්ධ කරන උපාංග 6ක් යොදාගනිමින් ඊට අදාළ ව ගිවිසුම් අත්සන් කිරීම සහ එට්කා ගිවිසුම මගින් ශ්‍රී ලංකාව ඉන්දියාවේ අර්ධ යටත් විජිතයක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය

   II. **ACSA, SOFA** සහ **MCC** ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවට අයත් සමස්ත භූමිය ඇමෙරිකානු හමුදාවට සේවා සපයන දූපතක් බවට පත් කිරීම.

2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ණය උපාංගය යොදාගනිමින් දීර්ඝකාලීන ව ශ්‍රී ලංකාවේ ආර්ථිකය පරාධීනත්වයට නතු කිරීම.

3. 13 වැනි සංශෝධනයේ ප්‍රතිපාදන යොදාගනිමින් (එය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීම මගින් බෙදුම්වාදී මාර්ග සිතියම දිගහැරීම.

4. ආර්ථිකය බිඳ වැට්ටවීමට සමගාමී ව සමාජය බිඳ වැට්ටවීම මගින් රාජ්‍යය දුර්වල කිරීමේ ක්‍රියාවලියක් දියත් කිරීම

## නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව සාධාරණීකරණය කරන්නේ කෙසේ ද?

1. ඉහත සඳහන් කළ ජාත්‍යන්තර බලපෑමට මුහුණ දීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම.

   I. 1971 දී සම්මත කළ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 2832 යෝජනාව අනුව ඉන්දියානු සාගරය සාම කලාපයක් බවට පත් කිරීමේ වගකීම රාජ්‍යයේ මූලික වගකීමක් ලෙස ව්‍යවස්ථාව මගින් සහතික කිරීම.

   II. ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කිරීම සඳහා කරනු ලබන අයුතු බලපෑම්වලට මුහුණ දීම සඳහා ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලිය සහ ඊට අදාළ ව ආර්ථික, සමාජීය, පාරිසරක ආදි වශයෙන් සිදුවන බලපෑම පිළිබඳ මහජන සාකච්ඡාවට ප්‍රතිපාදන සැලසීම සහ අදාළ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම මගින් සම්මත කිරීම අනිවාර්ය කිරීම සඳහා නීති පැනවීම ව්‍යවස්ථාව මගින් සහතික කිරීම

2. 1977 දී ආරම්භ කළ පරාධීන ආර්ථික මොඩලය සම්පූර්ණයෙන් ම වෙනස් කිරීම මගින් නව ආර්ථික මොඩලයක් නිර්මාණය කිරීම.

   I. ආරක්ෂණවාදය හෙවත් දේශීය කෘෂිකාර්මික සහ කාර්මික නිෂ්පාදන ආරක්ෂා කිරීමට අදාළ නීති පැනවීම ව්‍යවස්ථාව මගින් සහතික කිරීම.

   II. දේශීය නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සහ අදාළ නිෂ්පාදන ප්‍රචලිත කිරීම මෙන්

ම ඊට අදාළ වෙළඳපළ නියාමනය රජයේ මූලික වගකීමක් බවට පත් කිරීම සඳහා වන නීති පැනවීම ව්‍යවස්ථාව මගින් සහතික කිරීම.

III. දේශපාලන නායකයන් සහ උසස් රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් ඉටුවන බව සහතික කිරීම සහ දූෂණ වංචාවලට වැට බැඳීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් මෙන් ම නීති කඩ කිරීම පිළිබඳ විභාග කිරීම සඳහා විනිශ්චය මණ්ඩලයක් පත් කිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන අනිවාර්ය කිරීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම.

3. බෙදුම්වාදයට රට ගොදුරු වීම වළක්වන අතර ප්‍රාදේශීය මට්ටමට සහ පළාත් මට්ටමට බලය බෙදීම සඳහා නව ව්‍යුහයක් (පළාත් සංවර්ධන සභා පිහිටුවීම සහ පළාත් පාලන ආයතනවලට උපරි ම ලෙස බලය ලබාදීම මුල් කරගෙන) හඳුන්වාදීම

4. සමාජය බිඳ වැට්ටවීමේ ක්‍රියාවලිය වැළැක්වීම විශේෂයෙන් ම භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ආගමික නායකයන්ට, ආගමික ශාස්තෘවරුන්ට සහ ධර්මයට පහර දීම වැළැක්වීමට අදාළ නීතිමය ප්‍රතිපාදන පැනවීම ව්‍යවස්ථාව මගින් සහතික කිරීම.

5. දීර්ඝකාලීන දේශපාලන සංවාදය තුළ මාතෘකාවක් බවට පත් වූ විධායක ජනාධිපති ක්‍රමය ලෙස හැඳින්වෙන ජනාධිපතිවරයා විශේෂිත වූ මැතිවරණයකින් තේරීම වෙනුවට රටේ විධායකය ශක්තිමත් වන ආකාරයට ජනාධිපතිවරයා සහ අගමැතිවරයා පාර්ලිමේන්තුවට මහජන ඡන්දයෙන් පත්වන නියෝජිතයන් අතුරින් තෝරාගැනීම සහ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම.

6. තරුණ පරපුර අතර ප්‍රචලිත ව පවතින අපේක්ෂාවක් වන 'සිස්ටම් චේන්ජ්' අපේක්ෂාව සැබෑ ලෙස ම ඉටු කළ හැක්කේ නව ව්‍යවස්ථාවක් තුළ දේශපාලනඥයන්ගේ අත්තනෝමතිකභාවය සහ දූෂණ වංචා වැළැක්වීම මෙන් ම වංචාවට දූෂණයට ගොදුරු නොවන ආර්ථික මොඩලයක් නිර්මාණය කිරීම මගින් බව තහවුරු කිරීම.

7. විවිධ ජනාධිපති අපේක්ෂකයන් විසින් තනාපතිවරුන්ගේ අනුකම්පාවට යටත් ව ආණ්ඩුවක් පිහිටුවීම මගින් සහ හොරු නැති කිරීම මගින් සියලු ප්‍රශ්න විසඳන බවට ගොඩනගන ව්‍යාජ මතවාද තරගකාරී ව සහ තර්කානුකූල ව පරාජය කිරීම.

8. බලය ලබාගැනීමෙන් පසු ව මහජනයාට ලබා දුන් පොරොන්දු සහ රටට ඉදිරිපත් කළ වැඩ පිළිවෙළ අවංක ව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සිතියමක් තිබෙන බවට මහජන මතයක් ගොඩනැගීම මගින් මහජන විශ්වාසය දිනාගැනීම සහ ව්‍යාජ මැතිවරණ ව්‍යාපාර අභියෝග-යට ලක් කිරීම.

9 ජයග්‍රහණය සඳහා වන සමස්ත ක්‍රියාවලියේ මූලික උපාය මාර්ගික ප්‍රවේශය ලෙස අන්තර්කාලීන පොදු අපේක්ෂයකු ඉදිරිපත් කිරීම මගින් රටට අතුරු න්‍යායපත්‍ර සහිත අපේක්ෂකයන්ගේ ඡන්ද පදනම බිඳීම සහ රටට හිතවාදී අපේක්ෂකයන්ගේ සහාය ලබාගැනීම සඳහා මූලික පූර්ව කොන්දේසිය ලෙස නව ව්‍යවස්ථාව ජනාධිපතිවරණයට ඉදිරිපත් කර ජනාධිපතිවරණය ව්‍යවස්ථාව සම්මත කරන ජනමත විචාරණයක් බවට පත්කිරීම මගින් ඉදිරි ක්‍රියාවලියට මහජන සහාය සහ ඊට ශක්තිය ලබාගැනීම මෙන් ම ජාත්‍යන්තර බලපෑම්වලට මුහුණ දීම.

10. අර්බුදය කෙටි කාලීන ව ජයගැනීම පමණක් නොව අර්බුදය ආශිර්වාදයක් කර ගනිමින් දීර්ඝකාලීන දේශපාලන සහ සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණය සඳහා සමාජය පෙළඹවීම.

ඇමුණුම 3

# 'සිස්ටම් චේන්ජ්' අපේක්ෂාව ඉටුකිරීම සඳහා සකස් කරනු ලබන නව ව්‍යවස්ථාවක යෝජිත සංකල්පීය සහ උපායමාර්ගික රාමුව

1) **මහජනයාට වගවන මහජන නියෝජිතයන් තෝරාපත් කරගැනීම:-**

පාර්ලිමේන්තු මැතිවරණය සහ පළාත් පාලන මැතිවරණය කොට්ඨාශ ක්‍රමය සහ සමානුපාතික ක්‍රමය ඇතුළත් මිශ්‍ර ක්‍රමයකට පැවැත්වීම මගින් මහජනයාට වග කියන මහජන නියෝජිතයන් පත් කරගැනීම සහ ජන සභා මගින් මහජනයා සෘජු ව රාජ්‍ය පාලනයට දායක කරගැනීම මෙන් ම පළාත් පාලන ආයතන මට්ටමේ දී මහජනයා විසින් ලබා දුන් බලය ආපසු ලබාගැනීමේ බලය මහජනයාට ලබාදීම. ඊට අමතර ව මහජන නියෝජිතයකු විසින් යම් ප්‍රතිපත්තිමය කරුණකට අදාළ ව හෘදයසාක්ෂියට එකග ව ඡන්දය හෝ මතය ප්‍රකාශ කිරීමට බාධාවක් නොවන ආකාරයට දේශපාලන පිල්මාරු කිරීම වැළැක්වීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම.

2) **බෙදුම්වාදයට ගොදුරු නොවන ආකාරයට විධායක බලය පමණක් උපරි ම ලෙස විමධ්‍යගත කිරීම:-**

බෙදුම්වාදයට ගොදුරු වන පළාත් සභාවක් වෙනුවට විධායක බලය උපරි ම ලෙස විමධ්‍යගත කෙරෙන, මහජනයාට රාජ්‍ය පාලනයට දායක වීම සඳහා ඉඩ සලසන සහ සමාජ ආර්ථික සංවර්ධනය මුල් කරගත් පළාත් සංවර්ධන සභාවක් පිහිටුවීම සහ එම සභාවේ මහජන නියෝජිතයන් පළාත් පාලන ආයතන නියෝජිතයන් අතුරින් තෝරාගැනීම මගින් කුඩා ප්‍රදේශයකින් දේශපාලනයට අවතීර්ණය වන මහජන නියෝජිතයකුට පළාත් අමාත්‍යවරයකුගේ වගකීම් දැරීමට අවස්ථාව නිර්මාණය කිරීම මෙන් ම මහජන සේවාවන් විමධ්‍යගත කිරීමට අදාළ ව පළාත් සංවර්ධන සභාවේ කාර්යභාරය පුළුල් කිරීම සහ කාර්යක්ෂම කිරීම

3) **තනි පුද්ගලයකු විසින් රටේ ඉරණම තීන්දු කිරීමේ අනර්ථය වැළැක්වීම:-**

අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීම හෝ දුර්වල ලෙස ක්‍රියා කිරීම සඳහා එක් පුද්ගලයකු වටා බලය කේන්ද්‍ර වන ක්‍රමය වෙනුවට විධායක බලය ජනාධිපතිවරයා අගමැති සහ අමාත්‍ය මණ්ඩලය අතර තුලනාත්මක ව බෙදීයන ක්‍රමවේදයක් තුළ විශේෂිත ව්‍යවස්ථාමය ප්‍රතිපාදන මගින් ජාතික රාජ්‍යය ආරක්ෂා කිරීම. එමෙන් ම සමස්ත රට ම එක් මැතිවරණ කොට්ඨාසයක් බවට පත් කිරීම මගින් බෙදුම්වාදී සහ ආගමික අන්තවාදී බලවේගවලට ලැබෙන කේවල් කිරීමේ බලය තුළනය කිරීම සඳහා ජනාධිපතිවරණයක් වෙනුවට පාර්ලිමේන්තුවට ජනතාවගේ කැමැත්ත මත තේරී පත්වන මහජන නියෝජිතයකු පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්ත මත ජනාධිපතිවරයා බවට පත් පත්කිරීම සහ ඒ මගින් මහජන අරමුදල් නාස්තිය වැලැක්වීම.

4) **විධායකයේ ක්‍රියාකාරීත්වය ප්‍රතිඵලදායක සහ කාර්යක්ෂම කිරීම මෙන් ම පසු විපරමට ලක් කිරීම:-**

අමාත්‍යාංශ කාරක සභා ක්‍රමය මගින් අමාත්‍යවරුන් විසින් විධායක බලය ක්‍රියාත්මක කිරීමට අදාළ ව මහජන වගවීම සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවස්ථාව සැලසීම සහ ඒ මගින් අමාත්‍යාංශ හරහා මහජනයාට ලබාදෙන සේවාවන්වල කාර්යක්ෂමතාවය සහ ප්‍රතිඵල දායකත්වය ඉහළ නැංවීම මෙන්ම සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විධායකය තුළ භූමිකාවක් නිර්මාණය කිරීම. එසේම විගණන කොමිසම, පොලිස් කොමිසම් ආදි ව්‍යවස්ථාදායක සභාව විසින් පත් කරනු ලබන ස්වාධීන කොමිෂන් සභා මගින් දේශපාලනඥයන් විසින් අත්තනෝමතික තීන්දු ගැනීම යම් පාලනයකට යටත් කිරීම.

5) **දේශපාලනඥයන් සහ ඉහළ රාජ්‍ය නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන විධායක බලය මහජන වගවීමට යටත් කිරීම:-**

නායකත්ව ආචාර ධර්ම පද්ධතියක් නීතිගත කිරීම මගින් දේශපාලනඥයන් සහ ඉහළ රාජ්‍ය නිලධාරීන් විසින් තමාට ව්‍යවස්ථාවෙන් සහ නීතියෙන් පැවරී ඇති වගකීම් ඉටු කරන බව සහතික කිරීම සහ ඔවුන්ගේ කාර්ය සාධනය ආවේක්ෂණය කිරීම සහ වැරදිකරුවන්ට දඬුවම් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම මගින් වංචා දූෂණවලට පෙළඹවීම අවම කිරීම.

**6) ජාතිකත්ව පදනමින් තොර ව සියලු රටවැසියන් අතර සමානාත්මතාව සහතික කිරීම:-**

ජාතිකත්වය, භාෂාව, ආගම, කුලය හෝ ජීවත් වන ප්‍රදේශය මත කිසිවකුට වෙනස් කම් සිදු නොවන බව සහතික කිරීම සහ මනුෂ්‍යයන් ලෙස සැමට සමානාත්මතාවයෙන් සැලකීම තහවුරු කිරීම සඳහා අයිතිවාසිකම් කොමිසමක් මගින් ජාතික මට්ටමින් සහ පළාත් මට්ටමින් විශේෂ යාන්ත්‍රණයක් හඳුන්වාදීම.

**7) නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය ඇතුළු රාජ්‍යයේ මහජන සුබසාධන වගකීම සහතික කිරීම:-**

නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය මෙන් ම අඩු ආදායම්ලාභීන්ගේ සුභසාධනය නීතිය මගින් සහතික කිරීම සහ ආර්ථික ඉඩ ප්‍රස්ථා වර්ධනය කිරීම මගින් ආර්ථික සාධාරණත්වය තහවුරු කිරීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සැලසීම.

**8) දේශීය නිෂ්පාදන පද්ධතිය සහ රටේ ආර්ථික ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම:-**

රටේ ආහාර සුරක්ෂිතතාව, බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ දේශීය කර්මාන්ත පද්ධති ආරක්ෂා කිරීම මුල් කරගෙන දේශීය සහ විදේශීය වෙළෙඳපොළ බලවේග පාලනය කිරීම රජයේ මූලික වගකීමක් බවට ව්‍යවස්ථාව සහ නීතිය මගින් නියම කිරීම තුළ රටේ ආර්ථික ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම.

**9) නොබැඳි විදේශ ප්‍රතිපත්තිය යටතේ දේශපාලන ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම:-**

නොබැඳි විදේශ ප්‍රතිපත්තිය යටතේ ඉන්දියානු සාගරය සාම කලාපයක් කිරීම මගින් මහා බලවතුන්ගේ අයුතු මැදිහත් වීම් පාලනය කිරීම සඳහා 1971 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කළ 2832 යෝජනාව ප්‍රයෝජනයට ගනිමින් රටට අහිතකර ගිවිසුම්වලට යටත් නොවී සිටීම සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම සහ විදේශීය බලවේග විසින් රට තුළ දේශපාලන කුමන්ත්‍රණ සිදු කිරීම වැළැක්වීම සඳහා නීතිය මගින් ප්‍රතිපාදන සැලසීම තුළ රටේ දේශපාලන ස්වෛරීත්වය ආරක්ෂා කිරීම.

**10) බෙදුම්වාදයට සහ ආගමික අන්තවාදයට ඉඩ ලබානොදීම:-**

විදේශීය බලවේගවල මැදිහත්වීම යටතේ බෙදුම්වාදය සහ ආගමික අන්තවාදය ප්‍රචලිත කිරීම මගින් රටේ ජනතාව භේද බින්න කිරීම සහ ගැටුම් ඇවිලවීම වැළැක්වීම සඳහා එක් රටක් එක් නීතියක් මූලධර්මය යටතේ දැඩි ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම.

**11) මූල්‍ය සහ බදු වංචා මෙන් ම  බදු ගෙවීම පැහැර හැරීම මගින් රාජ්‍ය ආදායම් කොල්ලකෑම වැළැක්වීම:-**

රාජ්‍ය ආදායම් සහ විදේශ විනිමය ආරක්ෂා කිරීම සඳහා ආදායම් බදු, රේගු බදු සහ සුරාබදු අය කිරීමේ යාන්ත්‍රණ ආවේක්ෂණය කිරීම මගින් බදු පැහැර හැරීම සහ වංචා කිරීම වැළැක්වීම මෙන් ම විදේශ විනිමය වංචා වැලැක්වීම සඳහා ව්‍යවස්ථාව සහ නීතිය මගින් ප්‍රතිපාදන සැලසීම හරහා රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සහ දීර්ඝකාලීන ව ආර්ථික අර්බුද ඇති වීම වැළැක්වීම.

**12) දේශිය දැනුම් පද්ධතිය, සමාජ වටිනාකම් පද්ධතිය සහ ස්වාභාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම:-**

දේශීය දැනුම් පද්ධතිය, විශේෂයෙන් ම දේශීය වෛද්‍ය ක්‍රමය සමාජ වටිනාකම් පද්ධතිය සහ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම රාජ්‍යයේ මූලික වගකීමක් බවට පත් කිරීම සඳහා ව්‍යවස්ථාව සහ නීතිය මගින් ප්‍රතිපාදන සැලසීම.

**13) ඓතිහාසික සභ්‍යත්ව උරුමය, විශේෂයෙන් ම සම්බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම:-**

ඓතිහාසික සභ්‍යත්ව උරුමය සහ පුරාවස්තු ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම මෙන් ම එම ජාතික අනන්‍යතාවය විනාශ කිරීම සඳහා ක්‍රියාත්මක වන බලවේග පාලනය කිරීම රජයේ මූලික වගකීමක් බවට ව්‍යවස්ථාව සහ නිතිය මගින් ප්‍රතිපාදන පැනවීම.

**14) ආරක්ෂක හමුදා ශක්තිමත් කිරීම සහ බහු පැතිකඩවලින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම:-**

දේශීය සහ විදේශීය බලවේග විසින් ආර්ක්ෂක හමුදා දුර්වල කිරීම වැළැක්වීම සහ ආරක්ෂක හමුදා ශක්තිමත් කිරීම සඳහා විශේෂිත ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම මගින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම මෙන් ම ආරක්ෂක හමුදා සතු සම්පත් ජාතිය ගොඩනැගීමේ ක්‍රියාවලිය සඳහා දායක කරගැනීම මගින් ජාතික ආරක්ෂාව අනතුරට පත් වීමට අදාළ සාධක අවම කිරීම.

**15) අල්ලෂ, දූෂණය, නාස්තිය සහ වංචා වැළැක්වීම සඳහා දැඩි ප්‍රතිපාදන පැනවීම:-**

අල්ලස, දූෂණය, නාස්තිය සහ වංචා වැළැක්වීම මුල් කරගෙන රාජ්‍ය මිල දී ගැනීම් සහ කෙන්ත්‍රාත් ලබාදීම පාලනය කිරීම සහ වැරදිකරුවන්ට දඬුවම් කිරීම සඳහා ව්‍යවස්ථාව සහ නීතිය මගින් විශේෂිත ප්‍රතිපාදන පැනවීම.

**16) සමාජ ආර්ථික අසාධාරණයට ලක් වන්නන්ට සහන සැළැසීම සහ ඊට අදාල මූල හේතුන් අහෝසි කිරීම:-**

විදේශ රැකියා නියුක්තිකයන්ගේ විශේෂයෙන් ම කාන්තාවන්ගේ සුභසාධනය සහ ආරක්ෂාව තහවුරු කිරීම සහ ක්‍ෂුද්‍රමූල්‍ය වහල්භාවයේ ගිලී සිටින ජනතාවව විශේෂයෙන් ම කාන්තාවන්ට සහන සැලසීම මෙන් ම ඒ තුළ සිදුවන සමාජ අසාධාරණය සහ ඊට අදාළ ජාවාරම් වැළැක්වීම සඳහා ව්‍යවස්ථාමය සහ නීතිමය ප්‍රතිපාදන පැනවීම.

**17) කුල පීඩනය සහ ඒ මගින් ඇති කරන සමාජ, ආර්ථික පීඩනය අහෝසි කිරීම:-**

කුල පීඩනය නිසා සමාජ ආර්ථික වශයෙන් ද පීඩාවට පත් වන ජනතාව විශේෂයෙන් ම උතුරු සහ නැගෙ-නහිර ප්‍රදේශවල ජීවත්වන බහුතර ජනතාව කුල පීඩනයෙන් ගලවාගැනීම සඳහා නීතිමය ප්‍රතිපාදන සැලසීමට අදාළ ව ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පැනවීම.

**18) රාජ්‍ය සේවය තුළ සුදුස්සාට සුදුසු තැන ලැබෙන බව සහතික කිරීම:-**

රාජ්‍ය සේවයට බඳවාගැනීමේ දී ප්‍රසිද්ධියට පත් කෙරෙන සුදුසුකම් නිර්ණායක මත විනිවිද භාවය සහිත ව බඳවාගැනීම සිදු කෙරෙන බව ව්‍යවස්ථාව සහ නීතිය මගින් තහවුරු කිරීම.

**19) දේශපාලන පක්ෂ තුළ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීම සහ අන්තවාදී ප්‍රවණතා වැළැක්වීම:-**

ජාතිකත්වය, ආගම හෝ භාෂාව මත පදනම් වන දේශපාලන පක්ෂ පිහිටුවීම වැළැක්වීම සහ මහජන නියෝජිතයන් තේරීමේ දී පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීම මෙන් ම නොසුදුසු පුද්ගලයන් ඉදිරිපත් කිරීම වැළැක්වීම සඳහා ව්‍යවස්ථාමය සහ නිතීමය ප්‍රතිපාදන පැනවීම.

**20) මහජන නියෝජතයන් විසින් ලබාදෙන ඡන්ද පොරොන්දු හෙවත් සමාජ ගිවිසුම්වලට ගරු කෙරෙන බව සහතික කිරීම:-**

මහජන නියෝජිතයන් තෝරාපත් කරගැනීමේ දී ඔවුන් විසින් මහජනයාට ලබාදෙන ඡන්ද පොරොන්දු හෙවත් මහජන සමග ඇති කරගන්නා පොදු සමාජ ගිවිසුම් ලිඛිත ව ලබාදිය යුතු බවට සහ එම ගිවිසුම්වලට ගරු කරන බවට සහතික කිරීම මෙන් ම බොරු පොරොන්දු මගින් මහජනයා රවටා ඡන්ද ලබාගැනීම වැළැක්වීම සඳහා ව්‍යවස්ථාමය සහ නීතිමය ප්‍රතිපාදන පැනවීම එසේ ම ජනාධිතිවරයා ඇතුළු මහජන නියෝජිතයන් විසින් ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම ධුරය අහිමි වීමේ වරදක් බවට පත් කිරීම.

# ගෝලීය ශ්‍රී ලාංකික සංසදය
# Global Sri Lankan Forum

MIDDLE EAST | EUROPE | AUSTRALIA | NORTH AMERICA

ඇමුණුම 4

## ජාතික න්‍යාය පත්‍රයක මූලාරම්භය (ජාතියට එක් න්‍යාය පත්‍රයක්):
## National Agenda Initiative (One Agenda For The Nation)

### පූර්විකාව

1. ශ්‍රී ලංකාව නමැති පුණ්‍ය භූමිය භූ දේශපාලන වශයෙන් ඉතා වැදගත් උපායමාර්ගික මර්මස්ථානයක පිහිටා තිබෙන බැවින් වසර 2000කට අධික කාලයක් විදේශීය ආක්‍රමණ සහ බලපෑම්වලට මුහුණ දෙමින් සිටින බැවින්ද,

2. නිදහස දිනා ගැනීමෙන් පසුව යම් වකවානුවල ශ්‍රී ලංකාවේ ජාතික රාජ්‍ය ශක්තිමත් කිරීම සඳහා පියවර ගනු ලැබූ අවස්ථාවල අගමැතිවරුන් පරාජය කිරීමට මෙන්ම, එසේ නොහැකි වූ අවස්ථාවල ඝාතනය කිරීම සඳහා පවා විදේශීය රාජ්‍යයන් මැදිහත් වූ බවට සාක්ෂි ඉදිරිපත් වී තිබෙන බැවින්ද,

3. ඉන් පසුව 1977 සිට ආරම්භ වූ පරාධීන ආර්ථික මොඩලය තුළ සර්වබලධාරී ජනාධිපතිවරයකු විසින් නිර්මාණය කරනු ලැබූ ආර්ථික සහ දේශපාලන අර්බුද හේතු කොට ගෙන විදේශීය රාජ්‍යයන්ට සහ බහු පාර්ශ්වීය ජාත්‍යන්තර ආයතනවලට ශ්‍රී ලංකාවේ රාජ්‍යය මෙහෙයවීම සඳහා ප්‍රබල අවකාශයක් නිර්මාණය වූ බැවින්ද,

4. ඒ ආකාරයට විදේශීය බලවේගවල මැදිහත්වීම මත ඔවුන්ගේ භූ දේශපාලන අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය දුර්වල කිරීම මුල් කරගෙන රට බෙදා වෙන් කිරීම සඳහා බෙදුම්වාදී යුද්ධයක් ආරම්භ කිරීම මගින් සාමයේ නාමයෙන් ජාත්‍යන්තර මැදිහත්වීමකට අවකාශය නිර්මාණය කළ බැවින්ද,

5. එම ඊනියා සාම ක්‍රියාවලිය තුළ 2000 වසරේ සිට ජාත්‍යන්තර මැදිහත්වීම තවදුරටත් වර්ධනය වූ අතර, ඒ තුළ බෙදුම්වාදී න්‍යාය පත්‍රයට අමතරව රාජ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමේ නාමයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත්වීම මත රාජ්‍යය ආයතන පුද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය ''යළි පුබුදමු ශ්‍රී ලංකා'' නමින් නිශ්චිත වැඩසටහනක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම ආරම්භ වූ බැවින්ද,

6. එසේ ජාත්‍යන්තර මැදිහත්වීම සඳහා නිර්මාණය වූ නව අවකාශය තුළ ඉන්දියාව විසින් ආරක්ෂක, වෙළෙඳ සහ ආයෝජන ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉන්දියාවේ ආර්ථිකය සමඟ ඒකාබද්ධ කිරීම හෙවත් ශ්‍රී ලංකාව ඉන්දියාවේ අර්ධ යටත් විජිතයක් බවට පත්කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ බැවින්ද,

7. එම ක්‍රියාවලිය තුළ ඉන්දු පැසිපික් කලාපය ආශ්‍රිතව ක්‍රියාත්මක වන ඉන්දු - ඇමරිකානු පොදු න්‍යාය පත්‍රයට අනුව ඉන්දියාවේ ආශිර්වාදය සහිතව ශ්‍රී ලංකාව ඇමරිකානු යුද සැපයුම් මධ්‍යස්ථානයක් හෙවත් දාස රාජ්‍යයක් බවට පත් කිරීම සඳහා ක්‍රමානුකූලව ඉදිරිපත් කළ ගිවිසුම් ත්‍රිත්වයක් අතුරින් ACSA ගිවිසුම ක්‍රියාත්මක වන බැවින්ද, SOFA ගිවිසුමේ ඇමුණුම් 'බී' සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය විසින් එකඟතාවය ප්‍රකාශ කළහොත් ඇමෙරිකානු හමුදාවලට ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක කඳවුරු බැඳීමට ඉඩ සැළසීම මගින් ශ්‍රී ලංකාව ඇමෙරිකාවේ දාස රාජ්‍යයක් බවට පත්කෙරෙන එම ගිවිසුමද ක්‍රියාත්මක වීම ආරම්භ වන බැවින්ද, MCC ගිවිසුම අත්සන් කිරීම කල් දමා ඇතත් ඊට අදාළ කොන්දේසි එකින් එක ඉටු කරමින් තිබෙන බැවින්ද,

8. 1977 සිට ආරම්භ වූ පරාධීන ආර්ථික මොඩලය යටතේ ක්‍රමයෙන් වර්ධනය වූ ආර්ථික අර්බුදය 2000 දශකයේ සිට, විශේෂයෙන්ම 2015 සිට උත්සන්න වීම ආරම්භ වූ බැවින්ද, අවසානයේදී 2022 වන විට එසේ උත්සන්න වෙමින් පැවති ආර්ථික අර්බුදය තවදුරටත් වර්ධනය වූ බැවින් ප්‍රජාතන්ත්‍රවාදීව බලයට පත්වූ ජනාධිපතිවරයාට ධූරය අතහැර පලායාමට සිදුවූ බැවින්ද,

9. එසේ ජනවරම සහිත ජනාධිපතිවරයා බලයෙන් පහකිරීම සහ ජනවරමක් නොමැති ජනාධිපතිවරයකු බලයට පත්කිරීමේ ක්‍රියාවලිය තුළ බරපතළ ජාත්‍යන්තර මැදිහත්වීමක් සිදුවූ බවට ප්‍රබල සාක්ෂි ඉදිරිපත් වී තිබෙන බැවින්ද, එම ජනාධිපතිවරයා මගින් උක්ත චතුර්විධ න්‍යාය පත්‍ර ඉතා ශීඝ්‍රයෙන් ඉදිරියට ගමන් කිරීම සිදුවන බැවින්ද,

10. එම චතුර්විධ න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කිරීමේදී පැන නගින මහජන විරෝධය සමනය කිරීම සහ මහජන අවධානය බිඳවැට්ටවීම මුල් කරගෙන සමස්ත සමාජය බිඳවැට්ට වීමේ ක්‍රියාන්විතයක් දියත් වන බැවින්ද, එම ක්‍රියාවලිය තුළ භික්ෂු සමාජය, පවුල සහ පුද්ගලයා නම් වූ අප රටේ ශක්තිමත් සමාජ සංස්ථාවන් බිඳවැට්ටවීම, අපචාර ප්‍රචලිත කිරීම් මගින් සංස්කෘතික වශයෙන් සමාජය බිඳවැට්ටවීම සහ සමාජය මතවාදීව බිඳවැට්ටවීම සඳහා ඉතිහාසය විකෘති කිරීම මෙන්ම සමාජ සංස්ථා තුළ අභ්‍යන්තර අර්බුද නිර්මාණය කිරීම සහ සමාජය ප්‍රචණ්ඩකරණය කිරීම ආදී වශයෙන් සමස්ත සමාජය බිඳවැට්ට වීම සඳහා බහුවිධ ප්‍රහාරයක් දියත් වන බැවින් ද,

11. ශ්‍රී ලංකාවේ ජනතාව මේ වන විට මුහුණ දෙමින් සිටින ආර්ථික, දේශපාලනික සහ භූ දේශපාලනික අභියෝග යන්ට විසඳුම් ඉදිරිපත් කරන මුවාවෙන් විවිධ කණ්ඩායම් සහ බලවේග තමන්ගේ පටු දේශපාලන අරමුණු ඉටු කර ගැනීම සඳහා උත්සාහ කිරීම මිස, අර්බුදයට සාපේක්ෂව මහජනයාට පිළිගත හැකි සැබෑ තර්කානුකූල විසඳුම් ඉදිරිපත් කරන බවක් නොපෙනෙන බැවින්ද,

12. එම ක්‍රියාවලිය තුළ රටේ බිඳ වැටුණු ආර්ථිකය ගොඩනැංවීම වෙනුවට විදේශීය මැදිහත්වීම් තුළින් තවදුරටත් දේශපාලන, ආර්ථික සහ සමාජයීය වශයෙන් රට අගාධයට ඇද දැමීමට කටයුතු කෙරෙන බව පැහැදිලිව පෙනී යන බැවින්ද,

## ආණ්ඩුව, රාජ්‍යය සහ මහජනයා විසින් ඉටු කළ යුතු කාර්යභාරය මෙසේ ප්‍රකාශයට පත් කරන වගයි...

**ඒ අනුව ආණ්ඩුව සහ රාජ්‍යය විසින් ඉටු කළ යුතු වගකීම් හෙවත් කොන්දේසි මෙසේය.**

1. බෙදුම්වාදී න්‍යාය පත්‍රයට අදාළ ව ආණ්ඩුව විසින් ව්‍යවස්ථා සංශෝධනයක් මගින් හෝ පරිපාලන වශයෙන් 13 වන සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම සිදු නොකරන ලෙස මහානායක හිමිවරුන් විසින් නිකුත් කළ අනුශාසනාවට ගරු කරමින්, එම ක්‍රියාවලියට අදාළව කිසිදු පියවරක් නොගත යුතුය.

2. බෙදුම්වාදීන්ගේ නිජබිම් සංකල්පය තහවුරු කිරීම මුල් කරගෙන උතුර සහ නැගෙනහිර පළාත්වල ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය වැළැක්වීම සඳහා සිදු කෙරෙන ක්‍රියාවලිය, එනම් රක්ෂිත භූමි ගැසට් කිරීමට අදාළව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල් සතු බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා ගැනීම, පුද්ගලික අංශයේ පරිත්‍යාග මත ඓතිහාසික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම වැළැක්වීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු 1985 සැලසුම අනුව සිදු කළ යුතු බවට කොන්දේසි පැනවීම මගින් මෑත කාලීනව හඳුනාගත් සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම වැළැක්වීම ආදී වශයෙන් බෙදුම්වාදීන් සතුටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග වහාම අත්හිටුවීම.

3. අනාගතයේදී පළාත් ඉඩම් ප්‍රඥප්ති මගින් බෙදුම්වාදීන් විසින් ඉඩම් බලය අත්පත් කර ගැනීම සඳහා වන සැලසුමට අදාළ පූර්ව කොන්දේසියක් ලෙස ඊට අදාළව ප්‍රතිපාදන සැලසෙන ආකාරයට මහවැලි අධිකාරිය පනත සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම සහ වන සංරක්ෂණ පනත මෙන්ම වන ජීවී පනත සංශෝධනය කිරීම සහ පුරාවිද්‍යා ආඥා පනත සංශෝධනය කිරීම ආදී වශයෙන් වන නීති පද්ධතිය බෙදුම්වාදීන්ට අවශ්‍ය ආකාරයට වෙනස් කිරීමේ ක්‍රියාවලිය වහාම අත්හිටුවීම.

4. ආබාධිත රණවිරුවන් සහ ඔවුන්ගෙන් යැපෙන්නන් මෙන්ම දිවි පිදූ රණවිරුවන්ගෙන් යැපෙන්නන්ට ලැබිය යුතු දීමනා සහ වරප්‍රසාද කප්පාදු කරමින් ඔවුන් දුකට පත් කරන අතර ඒ මගින් ආරක්ෂක හමුදාවල මානසික ශක්තිය බිඳවැට්ට වීම සහ හමුදාව අතහැරයාමේ ක්‍රියාවලිය ප්‍රචලිත කිරීම මගින් ආරක්ෂක හමුදා කුඩා කිරීම මෙන්ම ඒ මගින් උතුර සහ නැගෙනහිර ප්‍රදේශවලින් හමුදා කඳවුරු ඉවත් කිරීමේ ක්‍රියාවලිය සඳහා කූටලෙස මඟ සැලසීමේ මෙහෙයුම වහා අත්හිටුවීම.

5. රණවිරුවන් ජාත්‍යන්තර අධිකරණ බලයට ගොදුරු කිරීම මගින් ආරක්ෂක හමුදාවල මානසික ශක්තිය බිඳවැට්ටවීම සහ අනාගතයේදී ගැටුම් සහිතව බෙදුම්වාදී මාර්ග සිතියම ඉදිරියට ගමන් කිරීමේදී රට තුළ සිටිමින් ජාත්‍යන්තර මැදිහත්වීමක් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන සලසන සත්‍ය සෙවීමේ කොමිසම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර වහාම ඉල්ලා අස්කර ගැනීම.

6. ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත් කිරීම සඳහා සිදුකෙරෙන ආර්ථික ඒකාබද්ධ කරන ක්‍රියාවලියේ මූලික කොන්දේසි සැපිරීම සඳහා ඉඩ සලසන නව විදුලි පනත සම්මත කිරීමේ සහ එට්කා ගිවිසුම හොර රහසේ අත්සන් කිරීමේ ක්‍රියාවලිය වහාම අත්හිටුවීම.

7. ජාතික ආරක්ෂාවට පවා ප්‍රබල තර්ජනයක් ඇතිවන ආකාරයට විදේශීය සමාගම්වලට ශ්‍රී ලංකාවේ උපායමාර්ගික වශයෙන් ඉතා වැදගත් ආර්ථික මර්මස්ථාන විකිණීමේ ක්‍රියාවලිය විශේෂයෙන්ම ටෙලිකොම්

ආයතනය, ගුවන්තොටුපළ සහ ගුවන් සමාගම මෙන්ම රක්ෂණ සංස්ථාව ආදී ආයතන විකිණීමේ ක්‍රියාවලිය අති ගෞරවනීය මහානායක හිමිවරුන්ගේ හඬට කන්දෙමින් වහාම අත්හිටුවීම.

8. ඇමෙරිකානු ඉන්දු පැසිපික් න්‍යාය පත්‍රයේ මූලික පූර්ව කොන්දේසියක් වන 'ධජ' ගිවිසුමේ ඇමුණුම 'බී' සඳහා එකඟතාවය පළ නොකිරීම සහ එකඟ ගිවිසුම අත්සන් නොකර එහි කොන්දේසි ක්‍රියාත්මක කිරීමේ කූට ක්‍රියාවලිය, එනම් රාජ්‍යය සතු ඉඩම් සහ ගොවීන් භුක්ති විඳින ඉඩම් මහා විදේශීය සමාගම් විසින් අත්පත් කර ගැනීමට ඉඩ සලසන ආකාරයට නීතියට පිටින් ඉඩම් බැංකු පිහිටුවීම සහ උරුමය නමින් ගොවියාගේ ඉඩම් උරුමය අහිමි කිරීමේ ක්‍රියාවලිය වහාම අත්හිටුවීම.

9. මහාවංශයට සහ ත්‍රිපිටකයට අභියෝග කරමින්, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සහ දළදා වහන්සේ උපහාසයට ලක්කරන, සමාජය මතවාදීව බිඳවැට්ටවීමේ ක්‍රියාවලිය සහ භික්ෂු සමාජය, පවුල සහ පුද්ගලයා යන ශ්‍රී ලංකාවේ සමාජ සංස්ථා ත්‍රිත්වය බිඳවැට්ටවීමේ ක්‍රියාවලිය මෙන්ම දැනුම්වත්ව අපචාර ප්‍රචලිත කිරීම සඳහා නීති පැනවීම මගින් සමාජය සංස්කෘතික වශයෙන් බිඳවැට්ටුවීමේ ක්‍රියාවලිය සහ සමාජය ප්‍රචණ්ඩකරණය කිරීම ආදී වශයෙන් වන ශ්‍රී ලංකාවේ සමාජය බිඳවැට්ටවීම සඳහා දියත්වන බාහිර මැදිහත්වීම් සහිතව සංවිධානාත්මකව ක්‍රියාත්මකවන ක්‍රියාන්විතය මහානායක හිමිවරුන්ගේ ඉල්ලීම පවා නොසලකා හරිමින් ඉදිරියට ගමන් කිරීමට ඉඩ සලසා බලා සිටීමේ නිර් ලැජ්ජිත ප්‍රතිපත්තිය වහාම වෙනස් කිරීම.

10. ජාවාරම්කාර ආනයනකරුවන්ට බදු සහන ලබාදෙමින් සහ ආදායම් බදු වැට් බදු සහ සුරා බදු නොගෙවා සිටින මහා සමාගම්වලින් එම බදු අය කර ගැනීමට ක්‍රියා නොකර රජයට ලැබිය යුතු රුපියල් බිලියන 2000කට අධික ආදායම් අහිමි කරමින් එම බදු හොරුන්ගෙන් අයුතු ප්‍රතිලාභ ලබා ගන්නා අතර, ආර්ථික අර්බුදයෙන් පීඩාවට ලක්ව සිටින ජනතාව මත තවදුරටත් බදු බර පැටවීමේ දුෂ්ට ප්‍රතිපත්තිය වහාම වෙනස් කිරීම සහ එම බදු අයකර ගැනීම මගින් ජනතාවට සහන සැළසීම.

## මහජනයාගේ වගකීම සහ කාර්යභාරය මෙසේය

1. ආණ්ඩුව විසින් ඉටු කළ යුතු බවට පනවා ඇති දස වැදෑරුම් කොන්දේසි වහාම ඉටු කරන ලෙස සහ ඊට අදාළව පැහැදිලි ප්‍රකාශ නිකුත් කරන ලෙස රජයට බල කිරීම මෙන්ම ඊට ඇහුම්කන් නොදී රට ජාතිය පාවාදෙන එම ක්‍රියාවලියට අත ඔසවන සහ නිහඬව සහාය දෙන සියලු පාර්ශ්ව දේශද්‍රෝහීන් ලෙස සලකා ඉදිරි මැතිවරණවලදී පරාජය කළ යුතු බවට නම් කිරීම.

2. ජනාධිපතිවරණයට ඉදිරිපත් වන සියලු පාර්ශ්ව වෙත තමා බලයට පත්වීමෙන් පසුව රට මුහුණ දෙමින් සිටින බරපතළ ආර්ථික සහ දේශපාලන අර්බුදය ජයගන්නා ආකාරය හෙවත් ඊට අදාළ උපාය මාර්ගික විසඳුම් නිශ්චිතව දක්වා ලිඛිතව රටට ඉදිරිපත් කරන ලෙස බල කිරීම සහ ඊට අදාළව මහජනයා විසින් ප්‍රශ්න මාලාවක් එම අපේක්ෂකයින් වෙත ඉදිරිපත් කිරීම.

3. පවතින පරාධීන ආර්ථික සහ දේශපාලන මොඩලය වෙනස් කිරීම හෙවත් මහජනයා ඉල්ලා සිටින 'සිස්ටම් චේන්ජ්' හෙවත් සමාජ ආර්ථික දේහයේ ගැඹුරු වෙනස්කම් සිදුකිරීම සඳහා මූලික පූර්ව කොන්දේසියක් වන නව ව්‍යවස්ථාවකට අදාළව ජනාධිපති අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරන සංකල්පීය රාමුව කුමක්දැයි ප්‍රශ්න කිරීම.

4. නව ව්‍යවස්ථාවකට අදාළ සංකල්පීය රාමුව තුළ 13 වැනි ව්‍යවස්ථා සංශෝධන මර උගුලින් ගැලවෙන්නේ කෙසේද යන්න සහ වර්තමානයේ අත්විඳින ආකාරයට අත්තනෝමතික බලය සහිත ජනාධිපතිවරයෙකු විසින් බෙදුම්වාදී, ජාතිවාදී, ආගම්වාදී සුළුතරයක් සතුටු කිරීම සඳහා රටේ භෞමික අඛණ්ඩතාවය මෙන්ම දේශපාලන සහ ආර්ථික ස්වෛරීභාවය අනතුරට ලක්කිරීම වළක්වන්නේ කෙසේද යන්න සඳහා යෝජනා අනිවාර්යයෙන්ම අඩංගු විය යුතු බවට කොන්දේසියක් පැනවීම.

**ඒ අනුව අවසාන වශයෙන් නව ව්‍යවස්ථාවක් රටට ඉදිරිපත් නොකරන සහ පවතින ව්‍යවස්ථාව සහ ඒ තුළ නිර්මාණය කළ ආර්ථික සහ දේශපාලන අර්බුදය තම වාසියට යොදාගනිමින් පවතින සමාජ, ආර්ථික මොඩලය තව දුරටත් පවත්වාගෙන යෑමට උත්සාහ කරනු ලබන කිසිදු ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු මහජනයා විසින් පිළිනොගත යුතු බවට මේ මගින් ප්‍රකාශයට පත්කරනු ලැබේ. එසේම, එම නව ව්‍යවස්ථාවට අදාළ සංකල්පීය සහ උපායමාර්ගික රාමුව සාකච්ඡා කිරීම ජනාධිපතිවරණය දක්වා දේශපාලන මතවාදී සංවාද ඉදිරිපත් කරන සියලුම දේශපාලන පක්ෂවල සහ සංවිධානවල මූලික වගකීමක් බවටද ප්‍රකාශයට පත්කරනු ලැබේ.**

**යෝජනාව ඉදිරිපත් කිරීම:**
**ගෝලීය ශ්‍රී ලාංකිය සංසදය**

ඇමුණුම 5

## ජාතික න්‍යාය පත්‍රයක මූලාරම්භය - දෙවන පියවර

### පොදු මහජනතාව සහ සියලුම මහජන නියෝජිතයින් ඇතුළු දේශපාලන පක්ෂ වෙත කරනු ලබන දැනුම් දීමයි

### පූර්විකාව

ජාතික න්‍යාය පත්‍රයක් මත සමස්ත ජාතියම පෙළගැස්වීමේ උතුම් අරමුණු සහිතව ගෝලීය ශ්‍රී ලාංකික සංසදය විසින් ඉදිරිපත් කළ ජාතික සංවිධාන 53ක නියෝජිතයන් සහ විද්වත් උපදේශකයන් හතර දෙනකු විසින් මහජන සම්මුතියක් බවට අත්සන් තබා රටට ඉදිරිපත් කළ ජාතික න්‍යාය පත්‍රයක මූලාරම්භය නම් වූ ලේඛනයේ අඩංගු වූ ආකාරයට මහජනයාගේ වගකීම සහ කාර්යභාරයට අයත් අංක 2 වගන්තිය ප්‍රකාරව, මහජනයා විසින් ජනාධිපතිවරණයට හෝ පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන සියලුම අපේක්ෂකයින් සහ ඔවුන් අයත් වන දේශපාලන පක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු බවට සම්මුතියක් ඇතිකර ගැනීම සඳහා අදාළ ප්‍රශ්න මාලාව මෙසේ ඉදිරිපත් කරන වගයි.

### කුමන පුද්ගලයෙකු හෝ පක්ෂයක් හෝ ජනාධිපතිවරණයට හෝ මහමැතිවරණයට ඉදිරිපත් වුවද පිළිතුරු බැඳිය යුතු සහ මහජනයා විසින් ඇසිය යුතු ප්‍රශ්න මාලාව

1) දේශපාලන නායකයින්ගේ සහ ඉහළ රාජ්‍ය නිලධාරීන්ගේ අල්ලස් - දූෂණ - වංචා සහ අකාර්යක්ෂමතාවයන් වැළැක්වීම හෝ අවම කිරීම සඳහා මෙන්ම එම හැසිරීම් ප්‍රචලිත කිරීමට හේතුවන වත්මන් ආර්ථික මොඩලය තුළ පවතින සාධක අහෝසි කිරීම සඳහා ගනු ලබන පියවර කුමක්ද, විශේෂයෙන්ම ඊට අදාළව පනවනු ලබන නීතිමය සහ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන මොනවාද?

2) දීර්ඝ කාලයක් පැවති ආර්ථික අර්බුදය උස්සන්න කරමින් මූල්‍ය අර්බුදයක්, විශේෂයෙන්ම විදේශ විනිමය අර්බුදයක් නිර්මාණය කිරීමට හේතු වූ සාධක හඳුනාගෙන තිබේද? ඒවා මොනවාද සහ එම තත්ත්වයන් නිවැරදි කරන්නේ කෙසේද, විශේෂයෙන්ම 2017 විදේශ විනිමය පනත මගින් නිර්මාණය කර ඇති අර්බුදය සහ 2023 මහ බැංකු පනත මගින් නිර්මාණය කිරීමට නියමිත අර්බුදයට අදාළව ගනු ලබන පියවර මොනවාද? ඊට අමතරව, රාජ්‍ය ණය කළමනාකරණ පනත, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සහ ආර්ථික පරිවර්තන පනත යන පනත් ත්‍රිත්වයක් මගින් රටේ ආර්ථික කළමනාකරණය අත්තනෝමතික ලෙස ඒකාධිපතිකරණය කිරීමේ ක්‍රියාවලිය වළක්වන්නේ කෙසේද?

3) විදේශ විනිමය ආදායම් වර්ධනය කිරීම සඳහා ගනු ලබන සුවිශේෂී ක්‍රියාමාර්ග සහ ඉලක්ක මොනවාද, විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය සහ අපනයන කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළව සහ විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළව යෝජනා කරන නව ප්‍රවේශයන් මොනවාද?

4) දේශීය කෘෂිකාර්මික සහ වැවිලි නිෂ්පාදන පද්ධතිය පරාධීනත්වයෙන් ගලවා ගැනීම, ආරක්ෂා කිරීම, ශක්තිමත් කිරීම මෙන්ම, රටේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සහ ගොවියාගේ ජීවන තත්වය ඉහළ දැමීම සඳහා ගනු ලබන නිශ්චිත උපායමාර්ගික ක්‍රියාමාර්ග මොනවාද?

5) දේශීය කාර්මික නිෂ්පාදන පද්ධතිය ආරක්ෂා කිරීම, ශක්තිමත් කිරීම සහ ජාවාරම්කාර ආනයනකරුවන්ගේ බලපෑම්වලින් මුදවා ගැනීම මෙන්ම, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම සඳහා ගනු ලබන උපායමාර්ගික ක්‍රියාමාර්ග මොනවාද?

6) අසාධාරණ වෙළඳ ගිවිසුම් සහ ආරක්ෂක ගිවිසුම්වලට එළඹීම සඳහා ඇති කෙරෙන ජාත්‍යන්තර බලපෑම්වලට යටත් නොවී රටේ දේශපාලන සහ ආර්ථික ස්වෛරීභාවය සහ ස්වාධිපත්‍යය ආරක්ෂා කරන්නේ කෙසේද?. එසේම රාජ්‍ය ආයතන, දේපළ, ඉඩම්, ඛණිජ සම්පත් සහ ජලය ඇතුළු ස්වභාවික සම්පත් විදේශිකයන් සතු කිරීම සඳහා සම්මත කෙරෙමින් පවතින නීති මෙන්ම අත්සන් කිරීමට නියමිත ගිවිසුම් පිළිබඳව ගනු ලබන පියවර මොනවාද?

7) බහුතර ජනයාට ආර්ථික ඉඩ ප්‍රස්ථා සැලසීම, අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම, එම ජනතාව ක්ෂුද්‍ර මූල්‍ය වහල්භාවයෙන් ගලවා ගැනීම ආදී වශයෙන් වන සමාජ සුබසාධන ජාතික සැලැස්ම කුමක්ද?

8) ජාතිකත්ව, ආගම්, භාෂාව හෝ කුලය හෝ ජීවත් වන භූගෝලීය ප්‍රදේශය මත කිසිදු මනුෂ්‍යයෙකුට වෙනස්කම් සිදු නොකෙරෙන බව සහතික කිරීම සඳහා හඳුන්වා දෙන යාන්ත්‍රණ මොනවාද?

9) බෙදුම්වාදයට රට ගොදුරු නොවන ලෙස සහ සැබෑ ජනතා පරමාධිපත්‍යය අර්ථ ගැන්වෙන ආකාරයට ප්‍රාදේශීය මට්ටමට පරිපාලන බලය හෙවත් විධායක බලය විමධ්‍යගත කිරීම සඳහා හඳුන්වා දෙන ක්‍රමවේදය කුමක්ද?

10) මහජනයාට වගවන මහජන නියෝජිතයින් පත් කිරීම, තනි පුද්ගලයකු විසින් රටේ ඉරණම තීන්දු කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම, ඡන්දයට පෙර මහජනයාට ලබා දෙන ලිඛිත පොරොන්දු සමාජ ගිවිසුම් සේ සලකා ඒවා කඩකිරීම වැළැක්වීම සහ ඡන්දවලට නියෝජිතයන් ඉදිරිපත් කිරීමේදී පක්ෂ තුළ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද අනුව ඔවුන් තෝරා ගන්නා බව සහතික කිරීම ආදී වශයෙන් වන මහජන පරමාධිපත්‍යයේ බලය ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන විසඳුම් මොනවාද? ඒවා ක්‍රියාත්මක කරන්නේ කෙසේද?

11) ආදායම් බදු, රේගු බදු සහ සුරා බදු වංචා කිරීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම මගින් රාජ්‍ය ආදායම් වර්ධනය කිරීම සහ පොදු මහජනයා මත අසාධාරණ ලෙස පටවා ඇති වක්‍රබදු පීඩනය සහ වෘත්තිකයින් මත අසාධාරණ ලෙස පනවා ඇති ඍජු බදු පීඩනය අවම කිරීම සඳහා ගනු ලබන පියවර මොනවාද?

12) ඓතිහාසික සභ්‍යත්ව උරුමය විනාශ කිරීම, සමාජ සංස්ථා බිඳවැට්ටවීම ආදිය මගින් සමාජය බිඳවට්ටවා දුර්වල කිරීමේ ක්‍රියාවලිය මැඩ පැවැත්වීම සහ බෙදුම්වාදය සහ ආගමික අන්තවාදය ප්‍රචලිත කිරීම වැළැක්වීම සඳහා යෝජනා කරනු ලබන දීර්ඝ කාලීන සැලසුම කුමක්ද?, විශේෂයෙන්ම අපචාර ප්‍රචලිත කිරීම මගින් සමාජය සංස්කෘතික වශයෙන් බිඳවැට්ටවීම සඳහා මේ විට සම්මත කෙරෙමින් පවතින නීති පිළිබඳව ගනු ලබන පියවර මොනවාද?

13) ආරක්ෂක හමුදාවලට එරෙහිව එල්ලවන යුද අපරාධ චෝදනා වලින් ඔවුන් නිදහස් කරගැනීම, විදේශීය බලපෑම්වලට යටත්වීම මගින් ආරක්ෂක හමුදා දුර්වල කිරීම සහ ඒ මගින් ජාතික ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩතාවය අනතුරට ලක් කිරීම වැළැක්වීම සහ ආරක්ෂක හමුදා සතු මහා මිනිස් සම්පත රටේ සමාජ ආර්ථික දියුණුව සඳහා යොදා ගැනීම සඳහා ඉදිරිපත් කරන සැලසුම කුමක්ද. එසේම ආබාධිත සහ දිවිපිදූ ආරක්ෂක හමුදා සාමාජිකයින් දුකට පත්කිරීම මගින් හමුදාවේ මානසික ශක්තිය බිඳවැට්ටවීම සඳහා ඔවුන් දුකට පත්කිරීමේ ක්‍රියාවලිය විසඳීම සඳහා ගනු ලබන පියවර මොනවාද? එසේම ආරක්ෂක හමුදා පාවාදීමේ ක්‍රියාවලිය තුළ සත්‍ය සෙවීමේ කොමිසමක් පිහිටුවීම මගින් යුද්ධයට නායකත්වය ලබාදුන් ආරක්ෂක හමුදා ප්‍රධානීන් ජාත්‍යන්තර අධිකරණ බලයට ගොදුරු කිරීම සඳහා දියත්වන ජාත්‍යන්තර මෙහෙයුම පරාජය කරන්නේ කෙසේද?

14) නිදහස් අධ්‍යාපනය සහ නිදහස් සෞඛ්‍ය සේවය ආරක්ෂා කිරීම සහ තවදුරටත් අර්ථවත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද?

15) රාජ්‍ය සේවය තුළ සුදුස්සාට සුදුසු තනතුර ලැබෙන බව සහතික කිරීම සහ තාක්ෂණික දැනුම් පද්ධතිය රාජ්‍ය සේවය තුළ නියෝජනය වීම සහතික කිරීම මෙන්ම, රාජ්‍ය සේවය තුළ කාර්යක්ෂමතාවය සහ ප්‍රතිඵලදායකත්වය වර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කුමක්ද?

16) දේශීය දැනුම් පද්ධතිය ස්වාභාවික පරිසර පද්ධති සහ මිනිසා විසින් ඓතිහාසිකව නිර්මාණය කළ පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ ඒවා සමාජ ආර්ථික සංවර්ධනයට දීර්ඝ කාලීනව යොදා ගැනීමට අදාළ යෝජනා මොනවාද? ඒවා ක්‍රියාත්මක කරන්නේ කෙසේද?

17) ශ්‍රී ලංකාවේ ගොඩබිම මෙන් අට ගුණයකින් විශාල වූ මහා සාගර සම්පත් වලින් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීම සහ ඒවා අවභාවිත කිරීම වැළැක්වීම මෙන්ම ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන දීර්ඝ කාලීන උපායමාර්ගික සැලසුම කුමක්ද?

18) මත්ද්‍රව්‍ය උවදුර සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීම සහ මර්දනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපාය මාර්ගික සැලසුම කුමක්ද?

19) ලෝකයේ හොඳම මිනිරන් සහ ඛණිජ වැලි නිධි තිබෙන අප රටේ ඒවා කලු ගල් සේ අමුද්‍රව්‍ය ලෙස තුට්ටු දෙකට අපනයනය කිරීමේ දුප්පත් ප්‍රවේශය වෙනුවට දහස් ගුණයකින් වටිනාකම් එකතු කර ශ්‍රී ලංකාවේ ඉහළම විදේශ විනිමය ආදායම් මාර්ගය බවට පත් කිරීම සඳහා වන ප්‍රායෝගික වැඩපිළිවෙල කුමක්ද?

20) නව විදුලි පනත මගින් විදුලිය සැපයීමේ සේවා පුද්ගලීකරණය කිරීම හරහා නිර්මාණය කිරීමට නියමිත ක්‍රියාවලිය අත්හිටුවා, ඊනියා ඩීසල් මාෆියාව මර්දනය කර දේශීය ආයෝජන මගින් සුනිත්‍ය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම හරහා රටේ බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපායමාර්ගික සැළසුම කුමක්ද?

**යෝජනාව ඉදිරිපත් කිරීම:**
**ගෝලීය ශ්‍රී ලාංකික සංසදය**